අ.පො.ස. (උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව

## 13 වන ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

ආර්ථික විද්‍යාව

13 වන ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

© ජාතික අධ්‍යාපන ආයතනය

ප්‍රථම මුද්‍රණය - 2010

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක

# පෙරවදන

නිපුණතා පාදක විෂයමාලාව පාසල් පද්ධතියට හඳුන්වාදීමේ කාර්යය 13 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හඳුන්වාදීමත් සමඟ සම්පූර්ණ වේ. 12 වන හා 13 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පවතින දැඩි තරගයට ගොදුරුවීම නිසා නිරන්තරව ම යම් තරමක පීඩනයකට යටත් වේ. නව විෂයමාලාව ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙ.) සඳහා යොදා ගැනෙන විට මෙම පීඩනය තවත් දැඩි වේ. එවැනි අවස්ථාවක ඔබ අතට පත්වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ තරමට ම ගුරුවරුනට වැදගත් වන්නේ ය. මෙහි මූලිකව ම ගුරුවරයා සැලකිල්ලට ගත යුතු පැති තුනක් ඇත. එනම් ගුරු මාර්ගෝපදේශ විෂය නිර්දේශය හා පූර්ණව ගැළපී තිබීම, විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා පාදකව විෂයමාලාවේ දර්ශනය හා දැක්ම මුල්කොට ගෙන සකසා තිබීම හා 12 - 13 ශ්‍රේණිවල දරුවාගෙන් අපේක්ෂිත සාධන මට්ටම මෙනෙහි කොට සකසා තිබීම. එහෙයින් මෙය හොඳින් පරිශීලනය කිරීම ගුරුවරයාට අත්‍යවශ්‍ය කාර්යයක් හා වගකීමක් වන්නේය.

ජාතික අධ්‍යාපන ආයතනය ඉහත කී කරුණු තුන ම ඔබගේ අවධානයට ගෙන ඒම සඳහා 13 වන ශ්‍රේණිවල ඉගැන්වීම් කරන සියලුම ගුරුවරුනට ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සඳහා ද ක්‍රියාත්මක වී සිටී. නිරන්තරව පැවැත්වෙන මෙම පුහුණු සැසිවලට අදාළ ගරුවරුන් සහභාගිවීම අතිශයින් ම අවශ්‍ය කරුණක් වන්නේ මෙහි දැක්වෙන ඉගෙනුම්-ඉගැන්වීම් මූල ධර්ම හා ක්‍රියාදාම වටහා ගැනීමට පුහුණුව බෙහෙවින් ඉවහල් වන නිසා ය. විශේෂයෙන් ම පාසල් පාදක ඇගයීම් ක්‍රියා, නිපුණතා වර්ධනය සඳහා ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. විෂය කරුණුවලට පමණක් ඉගැන්වීම යටත්වීමට නොදී සිසුනගේ කුසලතා ඔප ගැන්වීමේ අභිලාෂය ඉටුකරදීමට මේ සියලු මැදිහත්වීම් අවශ්‍ය බව අධ්‍යාපන හා ඇගයීම් කාර්යයේ නියැලෙන අප සියලු ම දෙනා වටහා ගත යුතු වේ.

ගුරු මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ අතිශය වෙහෙසකාරී කාර්යය ඉටුකරලීමට මැදිහත් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම ශාස්ත්‍රීය අංශවල නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා බාහිරව ඒ සඳහා දායක වූ විද්වත් හැම දෙනාට ම ද මාගේ විශේෂ ස්තුතිය හිමි වේ.

**ආචාර්ය උපාලි එම්. සේදර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම් ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන්ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලි ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරිමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. එහිදී ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනය අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම නිර්මාණශීලී ව භාවිත කිරීමට නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගැන්වීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලි හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට මාගේ ස්තූතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය උපාලි එම්. සේදර මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදු කර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වේ.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(විෂයමාලා සංවර්ධන පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

රජය මගින් සියලු ම පාසල් සිසු දරුවන් වෙත පාසල් පෙළපොත් නොමිලේ ලබා දෙන අතර ම ගුරු භවතුන් වෙත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ලබා දීම මගින් ගුරු ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කර ගැනීම අරමුණු කර ගැනේ.

විෂය නිර්දේශයේ දැක්වෙන නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන් මෙහෙයවන නියමුවා වන්නේ ගුරුවරයා ය. එබැවින් එම කාර්යය මැනවින් වටහා ගෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පරිශීලනයෙන් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව මනා පරිචයක් ලබා ගෙන නිපුණතා පාදක කර ගනිමින් ඉගෙනුම් ක්‍රියාවලියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීමේ වගකීම ඔබහට පැවරේ.

වර්තමාන ලෝකයේ අභියෝග ජයගත හැකි සිසු පරපුරක් බිහි කිරීමේ භාරදූර කාර්යභාරයේ නියැලී සිටින ඔබට මෙමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමට හැකි වනු ඇතැයි විශ්වාස කරමි.

**ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
2009. 09. 21

**මෙහෙයවීම** : ආචාර්ය උපාලි එම්. සේදර මයා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**උපදේශකත්වය** : විමල් සියඹලාගොඩ මයා, සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**සැලසුම් හා විෂය සම්බන්ධීකරණය** : ඩී. එල්. සී. රුවන් අජිත් කුමාර මයා, සහකාර ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂයමාලා කමිටුව** :

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩැනී අතපත්තු මයා - අධ්‍යයන අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය.
2. මහාචාර්ය ඊ. දයාරත්න මයා - අධ්‍යයන අංශ ප්‍රධානී, වාණිජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
3. මහාචාර්ය අතුල රණසිංහ මයා - අධ්‍යයන අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය.
4. ආචාර්ය එම්. ගනේෂ්මූර්ති මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය.
5. ආචාර්ය එස්.ඩබ්. හිරන්ත මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
6. ආචාර්ය අනෝමා අබේරත්න මිය - අධ්‍යයන අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය.
7. නන්දසිරි කීඹිය හෙට්ටි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය.
8. එස්. එන්. කේ. මල්ලිකා හේවා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය.
9. ටී. එස්. ලියනාරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය.
10. ආචාර්ය ඒ. සිවනේසරාජා මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
11. ඒ.බී. විජේසූරිය මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
12. පී.එච්. කුසුමාවතී මිය - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
13. එම්. ඒ. අයි. පී. පෙරේරා මිය - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
14. එස්. කේ. ප්‍රබාහරන් මයා - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
15. ඩී.එල්.සී. රුවන් අජිත් කුමාර මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
16. එස්. ආර්. රත්නජීව මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**සංස්කාරක මණ්ඩලය :**

| | | | |
|---|---|---|---|
| 1. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩැනී අතපත්තු මයා | - | අධ්‍යයන අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය. |
| 2. | මහාචාර්ය ඊ. දයාරත්න මයා | - | අධ්‍යයන අංශ ප්‍රධානී, වාණිජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. |
| 3. | ආචාර්ය එම්. ගනේෂ්මූර්ති මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය. |
| 4. | නන්දසිරි කීඹිය හෙට්ටි මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය. |
| 5. | ඒ.බී. විජේසූරිය මයා | - | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| 6. | එම්. ඒ. අයි. පී. පෙරේරා මිය | - | ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය. |
| 7. | ඩී.එල්.සී. රුවන් අජිත් කුමාර මයා | - | සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| 8. | එස්. ආර්. රත්නජීව මයා | - | සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය :**

| | | | |
|---|---|---|---|
| 01. | එස්.එන්.ඩබ්.එම්. විජේරත්න බංඩා මයා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යයන), මානව සම්පත් කළමනාකරණ ආයතනය. |
| 02. | එල්. අජන්තා විතාරණ මිය | - | නියෝජ්‍ය විදුහල්පති, ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ. |
| 03. | ඩබ්. ලයනල් මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, ධර්මපාල මහා විද්‍යාලය, කොට්ටාව. |
| 04 | කේ. පී. කරුණාරත්න මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, විජයබා ජාතික පාසල, හුංගම. |
| 05. | එම්.ඩී. පද්මිණී මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, සාන්ත තෝමස් උසස් බාලිකා විදුහල, මාතර. |
| 06. | කේ.පී. චන්ද්‍රලතා මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, ආනන්ද විද්‍යාලය, කොට්ටාව. |
| 07. | තමරා ටී. කාරියවසම් මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, සංඝමිත්තා බාලිකා විද්‍යාලය, ගාල්ල. |
| 08. | අයි. පී. එස්. පද්මිණී මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, ශාන්ත ජෝෂප් බාලිකා මහා විද්‍යාලය, කෑගල්ල. |
| 09. | ඒ.එම්.එෆ්. මදනියා මිය | - | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| 10. | එල්.ජී. ප්‍රේමතිලක මයා | - | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොත්මලේ. |

| | | |
|---|---|---|
| 11. එච්.එම්.වික්‍රමරත්න මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, අම්පිටිය මහා විද්‍යාලය, අම්පිටිය, මහනුවර. |
| 12. බී.එස්. තිලකරත්න මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, සරසවි උයන මහා විද්‍යාලය, මහනුවර. |
| 13. ඒ.එම්.ජී.එම්. අධිකාරී මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, වැතර මහා විද්‍යාලය, පොල්ගස්ඕවිට. |
| 14. සාලිය යාලපොල මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, මහානාම මහා විද්‍යාලය, මහනුවර. |
| 15. කේ.ටී. සමරසිංහ මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය, අනුරාධපුරය. |
| 16. ඒ.එච්.ජී. අමරා විජේවර්ධන මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, බෙල්ලන්කඩවල මහා විද්‍යාලය, තඹුත්තේගම. |
| 17. කේ.එම්. පියසේන මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, මහානාම මහා විද්‍යාලය, මොණරාගල. |
| 18. හෂීනා මුසාදික් මිය | - | ශ්‍රී ලංකා ගුරු සේවය, ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, බම්බලපිටිය. |
| 19. කේ.එන්. නිශාන්ත මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, ඇඹිලිපිටිය මධ්‍ය මහා විද්‍යාලය, ඇඹිලිපිටිය. |
| 20. එම්.කේ.ඒ. පද්මසිරි මයා | - | ශ්‍රී ලංකා ගුරු සේවය, දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය, බුත්තල. |

**පරිගණක වදන් සැකසුම :**

එච්.එම්. යෙහාන් රවිත්‍ර රත්නායක මයා - ජාතික අධ්‍යාපන ආයතනය.

**විවිධ සහාය :**

| | | |
|---|---|---|
| යමුනා පී. හේවාවිතාරණ මිය | - | ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| පුෂ්පා අමරසිංහ මිය | - | ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

**වෙබ් අඩවිය : www.nie.lk**

# පටුන


| | පිටුව |
|---|---|
| පෙරවදන | iii |
| සංඥාපනය | iv |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය | v |
| ලේඛක මණ්ඩලය | vi-viii |
| ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කිරීමට උපදෙස් | 01-02 |
| ඉගෙනුම් ඵල හා ආදර්ශ ක්‍රියාකාරකම් | 03-131 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය | 132 |
| හැඳින්වීම | 133-135 |
| ඉගෙනුම් - ඉගැන්වීම් ඇගයීම් සැලසුම් | 136-143 |
| මූලාශ්‍ර | 144 |

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

වර්ෂ 2009 සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා ක්‍රියාත්මකවීමට නියමිත ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. එම විෂය නිර්දේශයේ අඩංගු අංක 07 සිට 12 දක්වා වන නිපුණතා ආවරණය වන පරිදි මෙම ආර්ථික විද්‍යාව 13 වන ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙළ වී ඇත. මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් ආර්ථික විද්‍යාවට අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම පමණක් නොව ආර්ථික විද්‍යානුකූල ව සිතීමටත් ඒ අනුව හැසිරීමටත් අදාළ ආකල්ප, කුසලතා හා පුරුදු ලබාදීම ද අපේක්ෂා කෙරේ.

එම අරමුණු පෙරදැරි කරගෙන සිසුන්ගේ නිපුණතා සංවර්ධනය වන ආකාරයට ගුරුවරයා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා මග පෙන්වීමක් වශයෙන් මෙහි ආදර්ශ ක්‍රියාකාරකම් කිහිපයක් ඇතුළත් කර ඇත. මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත්තේ පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතු අනුක්‍රමය අනුව ය. විෂය නිර්දේශයේ ඇති සෑම නිපුණතා මට්ටමක් සඳහා ම ඉගෙනුම් ඵල ඉදිරිපත් කර ඇත. එම ඉගෙනුම් ඵලවලට හා අදාළ නිපුණතා මට්ටමට සියලු ම සිසුන් ළඟා වන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ඔබ විසින් අනුගමනය කරනු ඇතැ යි අපේක්ෂිත ය. ඒ සඳහා ඔබට කරන මගපෙන්වීමක් ලෙස තෝරාගත් නිපුණතා මට්ටම් කිහිපයක් සඳහා **පිවිසුම හා ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්** ඉදිරිපත් කර ඇත. එම උපදෙස් එලෙස ම අනුගමනය කිරීම අනිවාර්ය නොවන අතර සුදුසු යැයි හැඟෙන ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට පූර්ණ නිදහස ඇත.

එසේ ම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ක්‍රියාකාරකම අවසානයේ දී **"විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්"** ඉදිරිපත් කර ඇත. එය ඔබ පන්ති කාමරයේ දී ක්‍රියාකාරකම් තුළින් අනාවරණය කර ගත යුතු හා සිසුන්ට සටහනක් ලෙස ලබා දිය යුතු විෂය කරුණුවලට මගපෙන්වීමක් ලෙස සලකන්න.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පිවිසුම හෝ ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ඉදිරිපත් කර නොමැති නිපුණතා මට්ටම් ද මෙහි ඇතුළත් වේ. එම නිපුණතා මට්ටම් සඳහා සුදුසු ප්‍රවේශයක් හා යෝග්‍ය ඉගෙනුම සඳහා වූ උපදෙස් පත්‍රිකාවක් සකස් කර සිසුන් ක්‍රියාකාරී ව ඉගෙනුමෙහි යොදවන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

විෂය නිර්දේශයේ ඒ ඒ නිපුණතාවලට වෙන් කොට ඇති කාලච්ඡේද සංඛ්‍යාවට වඩා වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක් වර්ෂයකට තිබෙන අතර එම අමතර කාලය සිසු නිපුණතා වර්ධනය කිරීමට යෝග්‍ය වැඩසටහන් වලට අදාළ ප්‍රතිපෝෂණ වැඩසටහන් තක්සේරුව හා ඇගයීම් ක්‍රම පිළිවෙත් සඳහා යොදා ගත හැකි ය.

ආර්ථික විද්‍යාව මිනිසාට ඉතා සමීප හා ප්‍රායෝගික විෂයක් වන බැවින් ඔබගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් මෙම විෂයය සිසුන් අතර වඩාත් ජනප්‍රිය කළ හැකි වේ.

# ඉගෙනුම් ඵල සහ ආදර්ශ ක්‍රියාකාරකම්

**නිපුණතාව 7** : සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වයට බලපාන මිල මට්ටම්වල වෙනස්වීම් විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : සාමාන්‍ය මිල මට්ටම ආශ්‍රිත මිනුම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

**ඉගෙනුම් ඵල** :

- සාමාන්‍ය මිල මට්ටම අර්ථ දක්වයි.
- මිල දර්ශකයක් යන්න අර්ථ දක්වයි.
- දී ඇති සංඛ්‍යා දත්ත පදනම් කරගෙන මිල දර්ශක සකස් කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පසුගිය වාර පරීක්ෂණයේ දී සිසුන් ලබා ගත් ලකුණුවල සාමාන්‍ය ගණනය කිරීමට උපදෙස් ලබා දෙන්න.
- ලකුණුවල සාමාන්‍ය ලබා ගත් ආකාරය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - එක් එක් විෂයයන්වල ලකුණුවල මුලු එකතුව විෂයයන් ගණනින් බෙදීමෙන් ලකුණුවල සාමාන්‍ය අගය ලබාගත හැකි බව.
    - මේ ආකාරයට භාණ්ඩ හා සේවාවල මිල ගණන්වල ද සාමාන්‍ය අගය සොයා ගත හැකි බව.
    - රටක සියලු ම භාණ්ඩ හා සේවාවල මිල ගණන්වල සාමාන්‍ය අගය ඇසුරෙන් ලබා ගන්නා මිල මට්ටම සාමාන්‍ය මිල මට්ටම හෙවත් පොදු මිල මට්ටම ලෙස හඳුන්වන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් මිල ගණන් ඇතුළත් සංඛ්‍යා ලේඛන අතරින් ඔබේ කණ්ඩායමට ලැබී ඇති සංඛ්‍යාලේඛනය කෙරෙහි අවධානය යොමු කරන්න.

(1)

| භාණ්ඩ වර්ගය (කි.ග්‍රෑ. 1 මිල රුපියල්) | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
| සහල් | 35 | 40 | 42 | 45 | 48 |
| සීනි | 40 | 42 | 45 | 48 | 50 |
| තිරිඟු පිටි | 25 | 30 | 32 | 35 | 38 |
| **එකතුව** | | | | | |

(2)

| භාණ්ඩ වර්ගය (කි.ග්‍රෑ. 1 මිල රුපියල්) | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
| කැරට් | 40 | 43 | 45 | 47 | 49 |
| බෝංචි | 35 | 37 | 39 | 40 | 42 |
| ලීක්ස් | 25 | 27 | 28 | 30 | 32 |
| **එකතුව** | | | | | |

(3)

| භාණ්ඩ වර්ගය (කි.ග්‍රෑ. 1 මිල රුපියල්) | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
| අන්නාසි | 30 | 32 | 35 | 37 | 40 |
| දොඩම් | 20 | 23 | 25 | 28 | 30 |
| දෙළුම් | 35 | 37 | 40 | 42 | 45 |
| **එකතුව** | | | | | |

- ඔබට ලැබී ඇති එක් එක් වර්ෂය සඳහා භාණ්ඩ තුනෙහි මිල ගණන්වල එකතුව ගණනය කරන්න.
- 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල භාණ්ඩ තුනෙහි මිල ගණන්වල එකතුව 2005 වර්ෂයට සාපේක්ෂ ව වැඩි වී හෝ අඩු වී ඇති ප්‍රමාණය ගණනය කරන්න.
- එම වැඩි වීම හෝ අඩු වීම 2005 වර්ෂයේ භාණ්ඩ තුනෙහි මිලෙහි එකතුවෙහි ප්‍රතිශතයක් ලෙස පෙන්වන්න.
- එක් එක් වර්ෂයේ මිල ගණන්වල වෙනසෙහි ප්‍රතිශතය ඊට පෙර වර්ෂයේ ප්‍රතිශතය සමග සසඳා බලන්න.
- මෙම තොරතුරු ඇසුරෙන් ඔබට එළඹිය හැකි නිගමන කණ්ඩායම් සාකච්ඡාවක් මගින් තීරණය කරන්න.
- ඔබ විසින් අනාවරණය කරගත් තොරතුරු සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පොදු මිල මට්ටම යනු සියළුම භාණ්ඩ හා සේවාවල මිල ගණන් නිරූපණය කරන දර්ශකයක් බව.
- මෙහි දී එක් එක් භාණ්ඩවල රුපියල් ශත වලින් ප්‍රකාශිත මිල ගණන් සරල ලෙස එකතු කිරීම තුළින් පමණක් පොදු මිල මට්ටම පිළිබඳ අර්ථවත් අගයක් ලබා ගත නොහැකි බව.
- එම නිසා රුපියල් ශත අගය වෙනුවට දර්ශකාංකවලින් ප්‍රකාශිත අගයක් ලබා ගත යුතු බව.
- කාලයත් සමග වෙනස්වන ඕනෑ ම විචල්‍යයක වටිනාකම දර්ශකාංකවලින් ප්‍රකාශ කළ හැකි බව.
- පාදක වර්ෂයට සාපේක්ෂ ව කාල ශ්‍රේණි අගයන් වෙනස්වන ආකාරය ප්‍රතිශතාත්මක ව දැක්වීමට දර්ශකාංක යොදා ගනු ලබන බව.
- පාද වර්ෂය දර්ශකාංකයේ 100 ක් ලෙස සැලකුවිට සෙසු වර්ෂවල කාල ශ්‍රේණි අගය කවර ප්‍රතිශතයකින් වෙනස් වී ඇත්දැයි එමගින් ගණනය කළ හැකි බව.
- මිල සාපේක්ෂයන් පහත සඳහන් සංඛ්‍යාලේඛනය භාවිතයෙන් ඉදිරිපත් කළ හැකි බව.

| **භාණ්ඩය** | **මිල සාපේක්ෂය** | | |
|---|---|---|---|
| | **පළමු වර්ෂය** | **දෙවන වර්ෂය** | **තෙවන වර්ෂය** |
| I සහල් | 100 | 160 | 240 |
| II තිරිඟු පිටි | 100 | 150 | 200 |
| III සීනී | 100 | 120 | 160 |
| **එකතුව** | 300 | 430 | 600 |
| සාමාන්‍ය මිල (I+II+III) ÷3 | 100 | 143.3 | 200 |

- පාද වර්ෂයට සාපේක්ෂ ව II වන වර්ෂයේ පොදු මිල මට්ටම 43% කින් හා තෙවැනි වර්ෂයේ පොදු මිල මට්ටම 100% කින් ඉහළ ගොස් ඇති බව.

**නිපුණතා මට්ටම 7.2** : ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම් මනින මිල දර්ශක විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- සාමාන්‍ය මිල මට්ටම මැනීමට ශ්‍රී ලංකාව භාවිත කරන මිල දර්ශක නම් කර පැහැදිලි කරයි.
- එක් එක් මිල දර්ශකවල ඇති වැදගත්කම පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම මැනීමට යොදා ගැනෙන මිල දර්ශකවල අඩුපාඩු සාකච්ඡා කරයි

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටම මැනීම සඳහා භාවිත කෙරෙන දර්ශක රාශිකයක් ඇති බව.
- එම දර්ශක අතුරින් ඇතම් ඒවා පාරිභෝගික මිල දර්ශක හා ඇතැම් ඒවා සමස්ත මිල මට්ටම මැනීමට යොදා ගන්නා බව.
- වර්තමානයේ ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටම මැනීම සඳහා නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය, තොග මිල දර්ශකය හා ගම්‍ය මිල දර්ශකය භාවිත කරන බව.
- 2008 වර්ෂයේ මැයි මාසයේ සිට ශ්‍රී ලංකවේ මිල දර්ශකය වන්නේ නව කොළඹ පාර්භෝගික මිල දර්ශකය බව.
- 1952 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ නිල ජීවන වියදම් දර්ශකය ලෙස කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිත වුවත් එහි පැවති දුර්වලතා හේතුවෙන් නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය හඳුන්වා දුන් බව.
- නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පාද වර්ෂයේ 2002 බව.
- එම මිල දර්ශකය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාස් පතා ගණනය කොට රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන බව.
- නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ නියැදිය මගින් කොළඹ දිස්ත්‍රික්කයේ කුටුම්භ 1300 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන බව.
- 2002 වර්ෂයේ කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණය මත නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ වර්ග තෝරා ගැනීමත් බර තැබීමත් සිදු වී ඇති බව.
- පහතින් දැක්වෙන මධ්‍යස්ථාන වලදී නව මිල දර්ශකය සඳහා දත්ත රැස්කරන බව. පිටකොටුව, මරදාන, වැල්ලවත්ත, දෙමටගොඩ, ග්‍රෑන්පාස්, බොරැල්ල, කිරුළපන, දෙහිවල, කෝට්ටේ, නුගේගොඩ, කොලොන්නාව සහ රත්මලාන
- ඉහත සඳහන් වෙළෙඳපොළවලින් මාසිකව රැස්කරගන්නා මිල ගණන් මිල නාමික අගයන් ගණනය කිරීමෙන් දර්ශකය සකසා ගනු ලබන බව.

- පාදක කාලපරිච්ඡේදයේ දී මිල දී ගනු ලැබූ භාණ්ඩ හා සේවා ප්‍රමාණයම අදාළ වෙනත් කාලපරිච්ඡේදයක දී මිල දී ගන්නේ නම් කොතරම් වියදමක් දැරීමට සිදු වන්නේ ද යන්න මෙම දර්ශකය මඟින් පෙන්නුම් කරන බව.
- මෙම මිල දර්ශකය සැකසීම සඳහා පහත සමීකරණය භාවිත කළ හැකි බව.

$$\text{පාරිභෝගික මිල දර්ශකය} = \frac{\Sigma\ P_1Q_0}{\Sigma\ P_0Q_0} \times$$

$P_1$ = අදාළ වර්ෂයේ වෙළෙඳපොළේ පැවැති මිල

$P_0$ = පාදක වර්ෂයේ වෙළෙඳපොළෙ පැවති මිල

$Q_0$ = පාදක වර්ෂයේ දී ගෙන පරිහරණය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

$\Sigma$ = එකතුව

- සමස්ත ශ්‍රී ලංකාවේ ම වියදම් රටාව නියෝජනය නොවීම මෙම දර්ශකයේ අඩුපාවක් බව.
- මහ බැංකුව 1977 දී තොග මිල දර්ශකය හඳුන්වා දුන් බව.
- ප්‍රාථමික වෙළෙඳපොළේ මිල ගණන් වෙනස්වීම මැනීම සඳහා මෙය යොදා ගන්නා බව.
- 1974 පාද වර්ෂය ලෙස සලකා භාණ්ඩ කාණ්ඩ 13 කට බෙදා බර තබා දර්ශකය සකසා ඇති බව.
- ප්‍රාථමික වෙළෙඳපොළ මිල මට්ටමේ වෙනස්කම් පදනම් කරගෙන සිල්ලර වෙළෙඳපොළේ මිල ගණන් පුරෝකථනය කල හැකි බව.
- සේවා ඇතුළත් නො වී ම මෙහි අඩුපාඩුවක් බව.
- ස්ථාවර මිල යටතේ හා වර්තන මිල යටතේ ගණනය කරන ලද දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පදනම් කරගෙන ගම්‍ය මිල දර්ශකය සකස් කරනු ලබන බව.
- එකම වර්ෂයක දී ස්ථාවර මිලට හා වර්තන මිලට ගණනය කළ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම අතර අනුපාතයෙන් පෙන්නුම් කරණුයේ මිල වෙනස් වූ ප්‍රමාණය බව.
- මෙම අනුපාතය අවධමනකය නමින් හඳුන්වන බව.
- එම අනුපාතය 100 න් ගුණකල විට මිල දර්ශකයක් ලෙස භාවිත කළ හැකි බව
- මෙය ගණනය කිරීම සඳහා පහත සූත්‍රය යොදා ගන්නා බව.

$$\text{ගම්‍ය මිල දර්ශකය} = \frac{\text{අදාළ වර්ෂයේ වර්තන මිලට අනුව ද.දේ.නිෂ්පාදනය}}{\text{අදාළ වර්ෂයේ ස්ථාවර මිලට අනුව ද.දේ.නිෂ්පාදනය}}$$

- දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු සැකසීම සඳහා යොදාගනු ලබන සියලුම භාණ්ඩ හා සේවා මිල ගණන් මෙහි ඇතුළත් වීම සුවිශේෂ ලක්ෂණයක් බව.

**නිපුණතා මට්ටම 7.3** : උද්ධමනය පිළිබඳ සංකල්ප විග්‍රහ කරමින් උද්ධමන ප්‍රභේද අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- උද්ධමනය අර්ථ දක්වයි.
- උද්ධමනය මැනීමට භාවිත කරන මිනුම් ඉදිරිපත් කරයි.
- උද්ධමනයේ ප්‍රභේද නම් කර පැහැදිලි කරයි.
- උද්ධමන ආශ්‍රිතව ඉදිරිපත්වන විවිධ සංකල්ප සාකච්ඡා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- ආර්ථිකයේ පොදු මිල මට්ටමෙහි හටගන්නා අඛණ්ඩ ඉහළ යාමක් උද්ධමනයක් ලෙස හඳුන්වන බව.
- ආර්ථිකයක උද්ධමනයේ ප්‍රමාණය තීරණය වනුයේ එක් එක් භාණ්ඩයේ මිලෙහි හටගන්නා වෙනස මගින් නොව සියළු භාණ්ඩ හා සේවාවල මිල ගණන්වල සාමාන්‍ය අගය මගින් බව.
- පොදු මිල මට්ටමෙහි සැබෑ වශයෙන් හටගන්නා ඉහළ යාම මතුපිට උද්ධමනය බව.
- මූලික උද්ධමනය හෙවත් යටිදැරි උද්ධමනය නමින් හැඳින්වෙන්නේ තාවකාලික මිල වෙනස්කම් සටහන් කිරීම සඳහා ගැලපුම්කරන ලද උද්ධමන අනුපාතිකය බව.
- මූල්‍ය ප්‍රතිපත්තින් වැනි ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තින් පිළිබඳ තීරණ ගැනීමේ දී සැලකිලිමත් විය යුත්තේ මූලික උද්ධමනය පිළිබඳ ව බව.
- ජාත්‍යන්තර සම්මත ඔස්සේ යමින් ශ්‍රී ලංකාව ද මූලික උද්ධමනය ගණනය කිරීම සඳහා ආහාර හා ඉන්ධන යන අයිතමයන් දෙක ඉවත් කරන බව.
- උද්ධමන වේගය පදනම් කරගෙන ප්‍රසර්පණ උද්ධමනය, ජවන උද්ධමනය, අතිඋද්ධමනය, සර්පිල උද්ධමනය හා මර්දිත උද්ධමනය වශයෙන් උද්ධමනය ප්‍රභේද හඳුනාගන්නා බව
- උද්ධමන වේගය ක්‍රමයෙන් අඩුවීම නිරුද්ධමනය බව.
- ආර්ථිකයක පොදු මිල මට්ටමෙහි හට ගන්නා අඛණ්ඩ පහළයාමක් අවධමනයක් ලෙස හඳුන්වන බව.

**නිපුණතා මට්ටම 7.4** : උද්ධමනය විග්‍රහ කරන විවිධ ප්‍රවේශ අනුසාරයෙන් උද්ධමනයට බලපාන හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- උද්ධමනය බලපාන හේතු විවිධ ප්‍රවේශ ඔස්සේ පැහැදිලි කරයි.
- උද්ධමනයේ ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- උද්ධමනය පාලනය කිරීමට යොදගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- උද්ධමනය පහත සඳහන් ප්‍රවේශ ඇසුරින් විශ්ලේෂණය කල හැකි බව.
  - ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය
  - පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය
  - ව්‍යුහාත්මක උද්ධමනය
- සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස ඇදී යන අති විශාල මුදල් ප්‍රමාණයක් හේතුවෙන් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් ඇති වන බව.
- ඉල්ලුම වැඩි වීම කෙරෙහි මූල්‍ය ප්‍රසාරණය, රාජ්‍ය ණය වර්ධනය හා රාජ්‍ය වියදම් ඉහළයාම ඉවහල් වන බව.
- ඉල්ලුම් උද්ධමන න්‍යායේ ප්‍රවේශ මුදල් ප්‍රමාණවාදී විග්‍රහය හා කේන්සියානු විග්‍රහය වශයෙන් දෙආකාර බව.
- යෙදවුම් මිල ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය වැඩි වීමෙන් භාණ්ඩ හා සේවාවන් හි මිල ඉහළ යාම පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය බව.
- ජාතික ආදායම් පංගු අත්පත් කර ගැනීමට විවිධ කණ්ඩායම් අතර පවත්නා ගැටුම මත ඇතිවන පිරිවැය ඉහළ යාම නිසා මිල මට්ටම වැඩිවන බව.
- නිදසුන් වශයෙන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නිසා වැටුප් වැඩිවීම දැක්විය හැකි බව.
- ඉල්ලුමෙන් ඇදුණු හා පිරිවැයෙන් තල්ලු වු උද්ධමනය ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කළ හැකි බව.
- ආර්ථික ව්‍යුහයේ පවතින දෘඪතා, සීමා හා අනම්‍යතා ආදීය හේතුවෙන් ව්‍යුහාත්මක උද්ධමනයක් ඇති වන බව.
- උද්ධමනය නිසා විවිධ ආර්ථික ප්‍රතිවිපාක ඇතිවන බව.
- මුදලේ මූර්ත අගය අඩුවීම ස්ථාවර ආදායම් ලබන්නන්, ඉතිරි කරන්නන් සහ ණය හිමියන් හට අහිතකර ලෙස බලපාන බව.
- විචල්‍ය ආදායම් ලබන්නන්ට හා ණය ගැතියන් හට උද්ධමනය වාසි දායක වන බව
- මූර්ත ආදායම පහත සූත්‍රය භාවිතයෙන් ගණනය කළ හැකි බව.

$$\text{මූර්ත ආදායම} = \frac{\text{නාමික ආදායම}}{\text{මිළ දර්ශකය}}$$

- උද්ධමනය හේතුවෙන් ආර්ථික කටයුතුවල කාර්යක්ෂමතාව අඩුවීම උද්ධමනයේ ආර්ථික පිරිවැය බව.
- උද්ධමනය පාලනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය යොදා ගත හැකි බව.

**නිපුණතාව 8** : ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට මුදල් හා බැංකු පද්ධතිය දායක වන ආකාරය විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම 8.1** : මුදල්, මුදල් වර්ග හා මුදලේ කාර්යයන් විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- මුදල් අර්ථකතනය කරමින් හොඳ මුදලක ලක්ෂණ පැහැදිලි කරයි.
- මුදල් වර්ග කරමින් ඒවාට නිදසුන් ඉදිරිපත් කරයි.
- මුදලේ කාර්යයන් නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- මුදලේ අගය හඳුන්වමින් එහි අභ්‍යන්තර හා බාහිර අගය තීරණය වන ආකාරය පෙන්වා දෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සෘජු හුවමාරු ක්‍රමය යටතේ භාණ්ඩ හුවමාරුවේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වූ බව.
- භාණ්ඩ හුවමාරුවේ දී වුවමනා අතර ද්විත්ව සමපාතයක් පැවතිය යුතු බව.
- ඒ හැරුණු විට භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දී වෙනත් දුෂ්කරතාවන්ට ද මුහුණ දීමට සිදු වූ බව.
- මුදල් භාවිතයත් සමග එම දුෂ්කරතාවයන්ගෙන් බොහෝමයකට විසඳුම් ලැබුණු බව.
- පොදු පිළිගැනීමක් ඇති හුවමාරු මාධ්‍යයක් ලෙස කටයුතු කරන ඕනෑ ම දෙයක් මුදල් ලෙස සැලකිය හැකි බව.
- අනෙකුත් වත්කම් අතරින් 'මුදල්' නැමති වත්කමෙහි සුවිශේෂී ලක්ෂණ පවතින බව
- හොඳ මුදලක පහත සඳහන් ලක්ෂණ දක්නට ඇති බව.
  - පොදු පිළිගැනීමක් පැවතීම
  - කල් පවත්නා බව
  - සමජාතීය බව
  - කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
  - පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි වීම
  - වටිනාකම විචලනය නොවීම
  - වංචනික ලෙස අනුකරණය කළ නොහැකි වීම
- වර්තමානයේ භාවිතවන මුදල් වර්ග රාශියක් පවතින බව.
- රට තුළ ඕනෑ ම ගනුදෙනුවක් සඳහා නීතියෙන් වලංගු මුදල් ව්‍යාවහාර මුදල් බව.
- වාණිජ බැංකුවල පවතින ජංගම ගිණුම් බැංකු මුදල් බව.
- ව්‍යවහාර මුදල් සහ චෙක්පත් නූතන මුදල් වශයෙන් හඳුන්වන බව.

- පහසුවෙන් හුවමාරු මාධ්‍යයක් බවට පත්කර ගත හැකි වත්කම් ආසන්න මුදල් බව.
- වටිනාකමේ සංචිතියක් වශයෙන් ක්‍රියා නොකරන, එහෙත් තාවකාලික හුවමාරු මාධ්‍යක් වශයෙන් කටයුතු කරන දෑ මුදල් ආදේශක බව.

  නිදසුන් :- ණයපත්
- භෞතික මුදල් විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කර තබා මෘදුකාංගයක් මගින් ගනුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදයක් විද්‍යුත් මුදල් වන බව.
- මුදලේ පහත දැක්වෙන කාර්යයන් පවතින බව.
  - හුවමාරු මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
  - වටිනාකමේ සංචිතියක් ලෙස කටයුතු කිරීම
  - ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
  - විලම්බිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
- ගනුදෙනුවක් සිදු කිරීමේ දී අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම හුවමාරු මාධ්‍යක් ලෙස කටයුතු කිරීම ලෙස හැඳින්වෙන බව.
- අනාගත අයෝජනය සඳහා ධනය රැස්කර තබා ගැනීම වත්කමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ලෙස හැඳින්වෙන බව.
- භාණ්ඩයක හෝ සේවාවක වටිනාකම පොදු ඒකකයකින් ප්‍රකාශ කිරීමේ හැකියාව ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම ලෙස හැඳින්වෙන බව.
- කල්පසු වූ ගෙවීම් වඩාත් කාර්යක්ෂම ව සිදු කිරීමට ඇති හැකියාව විලම්බිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම ලෙස හැඳින්වෙන බව.
- කිසියම් අවස්ථාවක මුදල් ඒකකයකින් මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය මුදලේ අගය වන බව.
- මුදලේ අගය අභ්‍යන්තර සහ බාහිර වශයෙන් කොටස් කළ හැකි බව.
- යම් රටක මුදල් ඒකකයකින් ඒ රට තුළ දී මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය මුදලේ අභ්‍යන්තර අගය වන බව.
- යම් රටක මුදල් ඒකකයකින් විදේශ රටක දී මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය මුදලේ බාහිර අගය වන බව.
- මුදලේ අභ්‍යන්තර අගය දේශීය මිල මට්ටම අනුව තීරණය වන අතර මුදලේ බාහිර අගය විනිමය අනුපාතිකය මත තීරණය වන බව.
- මුදලේ බාහිර අගය සහ අභ්‍යන්තර අගය අතර ධන සම්බන්ධතාවයක් පවතින බව.

**නිපුණතා මට්ටම 8.2** : මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි

**ඉගෙනුම් ඵල** :

- මුදල් ඉල්ලුම අර්ථකතනය කරයි.
- මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරයි.
- මුදල් ඉල්ලුම හා ඒ කෙරෙහි බලපාන සාධක අතර පවතින සම්බන්ධතාව ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- සිසුන්ට මුදල් අවශ්‍යවීමට හේතු විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ආහාර පාන මිල දී ගැනීම, බෙහෙත් මිලදී ගැනීම, හදිසි අවශ්‍යතාවක දී ප්‍රයෝජනයට ගැනීම හා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම වැනි කටයුතු සඳහා පුද්ගලයින් මුදල් ළඟ තබා ගන්නා බව.
    - මෙලෙස මහජනයා මුදල් ළඟ තබා ගැනීමට ඇති කැමැත්ත මුදල් ඉල්ලුම බව.
    - මුදල් ඉල්ලුමට විවිධ සාධක බලපාන බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ පුද්ගලයකුට මුදල් අවශ්‍ය වන අවස්ථා කිහිපයකි. ඒ අතරින් ඔබ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - සහල් මිල දී ගැනීම සඳහා
    - නිවසේ දී ඇතිවන හදිසි අවශ්‍යතාවක් සඳහා
    - කොටස් වෙළෙඳපොළේ ආයෝජනය සඳහා
- ඔබ කණ්ඩායමට ලැබී ඇති අවස්ථාව කෙරෙහි සැළකිලිමත් වන්න.
- ඒ වැනි ම වූ මුදල් අවශ්‍ය වන වෙනත් අවස්ථා සඳහා නිදසුන් හැකිතාක් ලැයිස්තුගත කරන්න.
- ඔබට යම් නිශ්චිත මාසික ආදායමක් පවතී යැයි උපකල්පනය කරන්න.
- එයින් කොපමණ මුදලක් ඔබ කණ්ඩායමට අදාළ කාර්යය සඳහා වෙන් කරන්නේ දැයි තීරණය කරන්න.

- ඉහත මාසික ආදායම දෙගුණ වුවහොත් අදාළ කාර්යයන්ට වෙන් කරන මුදල තීරණය කරන්න.
- ඉහත තොරතුරු ඇසුරෙන් ආදායම වෙනස් වීමක් හා අදාළ කාර්යයට මුදල් වෙන් කිරීම අතර සම්බන්ධතාව දැක්වෙන ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (තීරස් අක්ෂයේ අදාළ කාර්යය වෙන් කරන මුදල, සිරස් අක්ෂයේ ආදායම)
- ඉහත ප්‍රස්තාරය ඇසුරින් ආදායම හා ඔබට අදාළ කාර්යයට මුදල් වෙන් කිරීම අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණය සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- කිසියම් අවස්ථාවකදී මුදල්, මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනයා තුළ ඇති කැමැත්ත මුදල් ඉල්ලුම වශයෙන් අර්ථකතනය කළ හැකි බව.
- මුදලට ඇති ඉල්ලුම පහත දැක්වෙන ප්‍රධාන කරුණු තුන පදනම් කරගෙන සිදුවන බව.
  - ගණුදෙනු චේතනාව
  - ආරක්ෂණ චේතනාව
  - සමපේක්ෂණ චේතනාව
- පුද්ගලයාට ආදායම් ලැබීම සහ වියදම් කිරීම එකිනෙකට නොගැලපීම නිසා ගණුදෙනු කිරීමේ අරමුණින් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ගණුදෙනු චේතනාව නිසා ඇතිවන මුදල් ඉල්ලුම ලෙස හැඳින්වෙන බව.
- ප්‍රධාන වශයෙන් පුද්ගලයාගේ ආදායම් මට්ටම අනුව ගණුදෙනු සඳහා ඇතිවන මුදල් ඉල්ලුම වෙනස්වන බව.
- ආදායම් මට්ටම හා ගණුදෙනු සඳහා මුදල් ඉල්ලුමත් අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින බව.
- එය පහත දැක්වෙන ආකාරයට ශ්‍රිතයක් සහ ප්‍රස්තාරයක් ඇසුරෙන් දැක්විය හැකි බව.




- ආදායම් හැර වෙනත් කරුණු ද ගණුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුමට බලපාන බව.
- අනපේක්ෂිත අවස්ථාවල දී සිදුවන වියදම් දැරීම සඳහා මුදල් ශේෂ ළඟ තබා ගැනීම ආරක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම වන බව.
- ආරක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම ද ආදායම මත තීරණය වන බව.
- ආදායම සහ ආරක්ෂණ චේතනාවත් මත මුදලට ඇති ඉල්ලුමත් අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින අතර එම සම්බන්ධතාව ශ්‍රිතාත්මක ව හා ප්‍රස්තාරික ව පහත අයුරින් නිරූපණය කළ හැකි බව.




- අනාගතයේ ලාභ ඉපයීමේ අරමුණින් අය වස්තුවක් ලෙස මුදලට ඇති ඉල්ලුම සමපේක්ෂණ චේතනාව මත මුදලට ඇති වන ඉල්ලුම බව.

- සම්පේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති වන ඉල්ලුමත් වෙළෙඳපොළ පොලී අනුපාතයත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව.
- එය ශ්‍රිතාත්මක ව හා ප්‍රස්තාරික ව පහත පරිදි නිරූපණය කළ හැකි බව.

$M_s^d$ = සම්පේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම

R = වෙළෙඳපොළ පොලී අනුපාතිකය



**නිපුණතා මට්ටම 8.3** : ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම විශ්ලේෂණාත්මක ව පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- මුදල් සැපයුම අර්ථකතනය කරයි.
- මුදල් සැපයුම තීරණය කරන සාධක පැහැදිලි කරයි.
- මූල්‍ය සමස්තයන් පෙළගස්වා ඒවා වෙන් වෙන් වශයෙන් විග්‍රහ කරයි.
- මහ බැංකුවේ වගකීම් සහ වත්කම් ඇසුරෙන් පදනම් මුදල් අතර සම්බන්ධතාවය විග්‍රහ කරයි.
- මුදල් ගුණකය අර්ථකතනය කරමින් එය තීරණය වන ආකාරය සමීකරණ ඇසුරෙන් ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මහජනයා අතර විවිධාකාරයේ මුදල් ගණුදෙනු සිදුවිය හැකි බව.
- එලෙස සිදුවන ගණුදෙනුවල දී මහජනයා අත මුදල් සංසරණය වන බව.
- මෙලෙස කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනයා අත සංසරණය වන මුලු මුදල් තොගය මුදල් සැපයුම ලෙස හඳුන්වන බව.
- මුදල් සැපයුම තොග සංකල්පයක් බව.
- බැංකු වගකීම් වන මූල්‍ය සමස්තයන්ට අයත් වන දෑ පහත පරිදි කොටස් කළ හැකි බව.
  - පදනම් මුදල්/ අධි බලැති මුදල්/ සංචිත මුදල් සැපයුම
  - පටු මුදල් සැපයුම
  - පුළුල් මුදල් සැපයුම
- පුළුල් මුදල් සංකල්පය නැවත පහත පරිදි කොටස් කළ හැකි බව.
  - $M_2$ පුළුල් මුදල් සැපයුම
  - $M_2b$ ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම
  - $M_4$ වඩාත් පුළුල් මුදල් සැපයුම
  - $M_5$ පුළුල් මුදල් සැපයුම
- ඉහත සංකල්ප පහත පරිදි වෙන් වෙන් ව පැහැදිලි කළ හැකි බව.
  - පටු මුදල් සැපයුම = මහජනයා සතු කාසි හා නෝට්ටු + වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු

    $M_1 = CP + DDP$

- පුළුල් මුදල් සැපයුම = පටු මුදල් සැපයුම + මහජනතාව සතු වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතුරුම් තැන්පතු

  $M_2 = M_1 + TSD$

- ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම = පුළුල් මුදල් සැපයුම + අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු + විදේශ ව්‍යවහාර බැංකු ඒකකවල නේවාසික තැන්පතු

  $M_2b = M_2 + TSD_{NRFC} + RD_{FCBU}$

- වඩාත් පුළුල් මුදල් සැපයුම = ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම + බලපත්‍රලාභී විශේෂිත බැංකුවල මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු + ලියාපදිංචි කළ මූල්‍ය සමාගම්වල නේවාසික තැන්පතු

  $M_4 = M_2b + RD_{LSB} + RD_{FC}$

  $M_4 = M_1$ + ආසන්න මුදල්

- $M_5$ මුදල් සැපයුම සඳහා ඇතුළත් කර ගන්නා ආසන්න මුදල් පහත පරිදි දැක්විය හැකි බව.
- $M_5$ පුළුල් මුදල් සැපයුම = $M_4$ + විනිමය බිල්, වාණිජ බිල් ආදී ද්‍රවශීල මූල්‍ය වත්කම්
- ශ්‍රී ලංකාවේ පුළුල් මුදල් සැපයුම තීරණය වීම කෙරෙහි මහ බැංකුවේ ශේෂ පත්‍රය සහ වාණිජ බැංකු ශේෂ පත්‍රයක් පදනම් කර ගන්නා බව.
- පුළුල් මුදල් සැපයුම තීරණය වීම සඳහා බලපාන සාධකවලට අදාළ සමීකරණ පහත පරිදි දැක්විය හැකි බව.

$M2$ / හෝ $(CP + DDP + TSD) = NFA_B + NCG_B + GPS_{KB} + NOA_B$

- ඉහත සමීකරණයේ දකුණු පැත්තේ පදවලින් දැක්වෙන පුළුල් මුදල් තීරණය වීම කෙරෙහි බලපාන සාධක පහත පරිදි පෙන්විය හැකි බව.

  $NFA_B$ = බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම්

  $NCG_B$ = බැංකු ක්‍රමය මගින් රජයට සැපයෙන ශුද්ධ ණය

  $GPS_{KB}$ = වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ණය

  $NOA_B$ = බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම්

- මුදල් සැපයුම සඳහා බලපාන සාධක පහත පරිදි දැක්විය හැකි බව

  $M_2b = NFA + NDA + NOA$

  NFA = ඒකාබද්ධ බැංකු ක්‍රමයේ ශුද්ධ විදේශ වත්කම්

  NDA = ඒකාබද්ධ බැංකු ක්‍රමයේ ශුද්ධ දේශීය වත්කම්

  NOA = ඒකාබද්ධ බැංකු ක්‍රමයේ අනිකුත් ශුද්ධ විදේශ වත්කම්

- ඉහත පෙන් වූ පරිදි මූල්‍ය සමස්තයන්ගේ තීරක ක්‍රම දෙකකට පරීක්ෂා කළ හැකි බව.
  - වත්කම් හා වගකීම් ප්‍රවේශය
  - අධි බලැති මුදල් ප්‍රවේශය
- අධි බලැති මුදල් (පදනම් මුදල්/ සංචිත මුදල) යනු මහ බැංකුවේ සෘජු මූල්‍ය වගකීම් බව.
- ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය පදනම් මුදල් බව.
- අධි බලැති මුදල් ආකාර දෙකකට විග්‍රහ කළ හැකි බව.
  - වගකීම් ඇසුරෙන්
  - වත්කම් ඇසුරෙන්
- අධි බලැති මුදල් තීරණය කරන සාධක පහත පරිදි දැක්විය හැකි බව.
  - මහ බැංකුව රජයට දුන් ශුද්ධ ණය
  - මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම්
  - මහ බැංකුවේ ශුද්ධ අනෙකුත් වත්කම්
  - මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සපයන ලද ණය
- භාවිතීය පදනම මත අධි බලැති මුදල්වල සංයුතිය පහත පරිදි වන බව.
  - සංසරණයෙහි පවත්නා කාසි හා නෝට්ටු
  - වාණිජ බැංකු සතු මහ බැංකුවේ ඇති තැන්පතු
  - රාජ්‍ය නියෝජිත ආයතන සතු මහ බැංකුවේ ඇති තැන්පතු
- මුදල් සැපයුම හා අධි බලැති මුදල් අතර අනුපාතය මුදල් ගුණකය බව.
- මේ අනුව අධි බල මුදල් ප්‍රමාණය හා මුදල් ගුණකයේ ගුණිතය මුදල් සැපයුම බව.
- මුදල් සැපයුම, අධි බලැති මුදල්, මුදල් ගුණකය අතර සම්බන්ධතාවය පහත සමීකරණවලින් පෙන්විය හැකි බව.

M = මුදල් තොගය

MH/K = මුදල් ගුණකය

H = අධි බලැති මුදල්

M = K X H  මුදල් සැපයුම = මුදල් ගුණකය X මුදල් පදනම

$$H = \frac{M}{K} \longrightarrow \text{මුදල් පදනම} = \frac{\text{මුදල් සැපයුම}}{\text{මුදල් ගුණකය}}$$

$$K = \frac{M}{H} \longrightarrow \text{මුදල් ගුණකය} = \frac{\text{මුදල් සැපයුම}}{\text{මුදල් පදනම}}$$

- මුදල් ගුණකයේ ප්‍රභේද පහත පරිදි දැක්විය හැකි බව.
  - පටු මුදල් ගුණකය $\longrightarrow \frac{M_1}{H}$
  - පුළුල් මුදල් ගුණකය $\longrightarrow \frac{M_2}{H}$
  - ඒකාබද්ධ පුළුල් මුදල් ගුණකය $\longrightarrow \frac{M_2b}{H}$
  - වඩාත් පුළුල් මුදල් ගුණකය $\longrightarrow \frac{M_4}{H}$

- මුදල් ගුණකය නිරතුරුව ම එකට වැඩි අගයක් ගන්නා බව.
- පහත සඳහන් සූත්‍රය අදාළ කරගෙන මුදල් ගුණකය කෙරෙහි බලපාන සාධක හඳුනා ගත හැකි බව.

$$K = \frac{1+C}{C+E+R}$$

$$\text{මුදල් ගුණකය} = \left\{ \frac{1 + \text{ව්‍යවහාර මුදල් හා බැංකු තැන්පතු අතර අනුපාතය (C)}}{\text{C + අධි සංචිත හා බැංකු තැන්පතු අතර අනුපාතය (E) + ව්‍යවස්ථාපිත සංචිත හා බැංකු තැන්පතු අතර අනුපාතය (R)}} \right\}$$

- ඉහත සූත්‍රයට අනුව මුදල් ගුණකය කෙරෙහි බලපාන සාධක පහත පරිදි දැක්විය හැකි බව.
  - ව්‍යවහාර මුදල් තොගය (C)
  - අධි සංචිත අනුපාතය (E)
  - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (R)

**නිපුණතා මට්ටම 8.4** : ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය මහ බැංකු වාර්තාවට අනුව වර්ග කරයි.
- එක් එක් මූල්‍ය ආයතන කෙටියෙන් පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය පහත සඳහන් පරිදි වර්ග කළ හැකි බව.
  - බැංකු අංශය
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
    - ලියාපදිංචි මූල්‍ය සමාගම්
    - සමූපකාර ග්‍රාමීය බැංකු
    - සකසුරුවම් හා ණයදෙන සමූපකාර සමිති
  - අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන
    - විශේෂිත කල් බදු සමාගම්
    - ප්‍රාථමික වෙළෙඳුන්
    - වාණිජ බැංකු
    - කොටස් තැරැව්කාර සමාගම්
    - ඒකක භාර
    - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
    - ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන
  - ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතන
    - රක්ෂණ සමාගම්
    - සේවක අර්ථසාධක අරමුදල
    - සේවක භාරකාර අරමුදල
    - අනිකුත් අර්ථසාධක අරමුදල
    - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
  - ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම සඳහා පිහිට වූ ස්වාධීන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව බව.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්ය වනුයේ පොලී අනුපාතිකය හා මුදල් සැපයුම හැසිරවීමට මූල්‍ය උපකරණ කළමනාකරණය කිරීම බව.
- බලපත්‍රලාභී වාණිජ බැංකු ලෙස සැලකෙන්නේ ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු) පවත්වාගෙන යාම සහ විදේශ විනිමය ගණුදෙනුවල නිරතවන මූල්‍ය අතරමැදි ආයතන බව.

  (ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකු පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.)
- ඉතුරුම් හා කාලීන තැන්පතු භාර ගැනීම, ණය සැපයීම ප්‍රමුඛ කොට ගෙන ක්‍රියාත්මක වන මූල්‍ය අතරමැදි ආයතන බලපත්‍රලාභී විශේෂිත බැංකු ලෙස සැලකෙන බව.
- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බලපත්‍රලාභී විශේෂිත බැංකු පහත පරිදි විශ්ලේෂණය කළ හැකි බව.
  - ප්‍රාදේශීය සංවර්ධන බැංකු
  - ජාතික ඉතිරි කිරීමේ බැංකු
  - දිගු කාලීන ණය දෙන ආයතන
  - නිවාස ණය දෙන ආයතන
  - පෞද්ගලික ඉතිරි කිරීමේ හා සංවර්ධන බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කාර්යභාරය පහත සඳහන් පරිදි පෙළගැස්විය හැකි බව.
  - ඉතුරුම් හා කාලීන තැන්පතු පවත්වා ගෙන යාම
  - කෙටි කාලීන හා දිගු කාලීන ණය සැපයීම
  - උකස් කටයුතු කිරීම
  - දිගු කාලීන ආයෝජන
- කාලීන තැන්පතු භාර ගැනීම සහ කුලී සින්නක්කර ක්‍රමයට ණය සැපයීම යන කාර්යයන් ප්‍රමුඛකොට ගෙන ක්‍රියාත්මක වන මූල්‍ය ආයතන මූල්‍ය ලියාපදිංචි සමාගම් ලෙස සැලකෙන බව.
- සමූපකාර ග්‍රාමීය බැංකු සමූපකාර සමිතිවල බැංකු අංශය වන බව.
- සමූපකාර ග්‍රාමීය බැංකු සාමාජික හා සාමාජික නොවන ජනතාවගේ ඉතුරුම් හා කාලීන තැන්පතු ලබා ගෙන සාමාජිකයින්ට ණය ලබා දෙන බව.
- සමූපකාර ග්‍රාමීය බැංකු සමූපකාර පනත යටතේ ලියාපදිංචි කොට පිහිටවිය යුතු බව.
- සමිති සාමාජිකයින්ගේ තැන්පතු හා සාමාජික කොටස් මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය ලබා දීමට සමූපකාර පනත යටතේ ලියාපදිංචි කර පිහිට වූ මූල්‍ය ආයතන සකසුරුවම් හා ණය ගණුදෙනු සමූපකාර සමිති බව.

- වාහන, යන්ත්‍ර උපකරණ ආදී ප්‍රාග්ධන වත්කම් කල් බදු හිමියා විසින් (මූල්‍ය ආයතනය) මිලට ගෙන එම වත්කම් පාවිච්චි කිරීමේ කැප අයිතිය බදුකරු වෙත සැපයීම හා ඒ වෙනුවෙන් බදුකරුගේ මාසික වාරික මුදල් අය කිරීමේ යෙදෙන මූල්‍ය ආයතන කල් බදු සමාගම් බව.
- නියමිත කාලසීමාව තුළ අදාළ වත්කමේ වටිනාකම බදුකරු විසින් ගෙවා නිමකල පසු එහි සින්නක්කර හිමිකාරිත්වය බදු හිමිකරු වන කල්බදු සමාගම විසින් බදුකරු වෙත පවරා දෙන බව.
- ශ්‍රී ලංකාව තුළ කල්බදු සමාගම් 20ක් පමණ තිබෙන අතර ඒවා වාණිජ බැංකුවලට, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ මූල්‍ය සමාගම්වලට අයත් බව.
- මහ බැංකුව නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සියල්ලම මිලදී ගෙන නැවතත් මහජනයා වෙත විකිණීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කර ඇති ආයතන ආණ්ඩුවේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළෙන්දන් බව.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳුන් 11 ක් පත් කොට ඇති බව.
- ප්‍රාරක්ෂණ සේවා, නිකුතු කළමනාකරණ සේවා, ආයෝජන උපදෙස් සේවා, ශක්‍යතා අධ්‍යයන සැකසීම හා ණය සංවිධානය කිරීම සහ ප්‍රතිග්‍රහණ මූල්‍ය සේවාව ආදී ක්‍රියාකාරකම්වල නිරත වන ආයතන වණික් බැංකු බව.
- වණික් බැංකු සේවා සැපයීමේ දී මූල්‍ය අතරමැදිකරණයේ නිරතවන වාණිජ බැංකු ප්‍රමුඛ වන බව.
- සීමිත පොදු සමාගම්වල ව්‍යාපාර කොටස් හා ණය හුවමාරු කිරීමේ දී විකුණුම්කරු හා ගැනුම්කරු සම්බන්ධ කිරීමේ අතරමැදි කාර්යභාරය ඉටු කරන ආයතන කොටස් තැරැව්කාර සමාගම් බව.
- ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළේ තැරැව්කාර සමාගම් 15 ක් පමණ සිටින බව.
- කොටස් වෙළෙඳපොළේ කොටස් හුවමාරුව සඳහා තැරැව්කරුවන්ගේ අතරමැදිකරණ සේවය අනිවාර්යයෙන් යොදා ගත යුතු බව.
- විශාල ප්‍රාග්ධන සමුච්චයක කොටස් ආයෝජකයින් වෙත අලෙවිකර එක් රැස්කර ගනු ලබන ආයෝජන අරමුදල ඒකක භාරයක් බව.
- ඒකක භාර අරමුදල් ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ එහි කොටස් මිලට ගත් ඒකක භාර හිමියන් අතර ගිවිසගත් ක්‍රමයකට බෙදාහරිනු ලබන බව.
- ශ්‍රී ලංකාව තුළ ඒකක භාර 12 ක් පමණ පවතින බව.
- ව්‍යාපාරික සේවා සැපයීම නව ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට නව ව්‍යාපාර ආරම්භ කිරීමට, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට, ව්‍යාපාර පවරා ගැනීමට හා මිල දී ගැනීමට අරමුදල් සැපයීමේ නිරතවන ආයතන ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් බව.

- ණය ශ්‍රේණිගත කිරීම යනු ණයකර හෝ මූල්‍ය උපකරණ හෝ නිකුත් කරන්නාගේ මූල්‍ය ශක්තිය පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කිරීම බව.
- ණය මුදලක් දුන්විට ණය ආපසු අය කර ගැනීමේ ශක්තිය පිළිබඳ තක්සේරුවක් ලබාදීම ණය ශ්‍රේණිගත කිරීමේ දී සිදුවන බව.
- මූල්‍ය උපකරණවල ආයෝජනය කරන ආයෝජකයින්හට එම උපකරණවල ගුණාත්මක තත්ත්වය හා විශ්වසනීයත්වය නිවැරදි ව හඳුනාගෙන ආයෝජන තේරීම් කිරීමට විධිමත් මග පෙන්වීමක් ණය ශ්‍රේණිගත කිරීම මගින් සිදුවන බව.
- ණය ශ්‍රේණිගත කිරීමේ කීර්තිමත් ජාත්‍යන්තර ආයතන කීපයක් පහත දැක්වෙන බව.
  - මූඩීස් සමාගම
  - ස්ටෑන්ඩර්ඩ් හා ප්‍රවර්ස් සමාගම
  - ෆිච් රේටින්ග්ස් සමාගම
- කිසියම් රටක ආණ්ඩුවක ණය ආපසු ගෙවීමේ හැකියාව, ස්වාධීන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් මගින් තක්සේරු කර ගැනීම ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම ලෙස හඳුන්වන බව.
- පුද්ගලයින් හා යම් ආයතන මුහුණ දෙන අවදානම් බාර ගෙන හානියක් ඇති වූ අවස්ථාවල දී එම හානි ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් වන ආයතන රක්ෂණ ආයතන බව.
- රක්ෂණ ආයතන විසින් විවිධ වර්ගයේ රක්ෂණ ඔප්පු නිකුත් කර ඒ සඳහා ගාස්තු අය කරනු ලබන බව.
- මෙරට තුළ ක්‍රියාත්මක වන රක්ෂණ ආයතන රක්ෂණ පනත යටතේ ලියාපදිංචි විය යුතු බව.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ ආයතන 15 ක් පමණ ක්‍රියාත්මක වන බව.
- සේව්‍ය හා සේවක යන දෙපාර්ශවයේ දායකත්වයෙන් සේවකයාට හිමිකම් ලැබෙන පරිදි, කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවත්වාගෙන යන අරමුදල සේවක අරමුදල බව.
- සේවකයා විශ්‍රාම යන අවස්ථාවේ දී සේවකයා නමින් සේවක අර්ථසාධක අරමුදලේ ඇති දායක මුදල් හා ඊට අදාළ පොළී ප්‍රතිලාභ සේවකයා වෙත ගෙවන බව.
- සේවක අර්ථසාධක අරමුදලේ සේවකයා නමින් අරමුදල් තැන්පත් කිරීම නීත්‍යානුකූල අනිවාර්ය ගිවිසගත් ඉතිරි කිරීමක් බව.

**නිපුණතා මට්ටම 8.5** : බැංකු පද්ධතිය තුළ වාණිජ බැංකුවල කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- වාණිජ බැංකු අර්ථ දක්වයි.
- වාණිජ බැංකුවල කාර්යයන් විස්තර කරයි.
- වාණිජ බැංකුවක වත්කම් ව්‍යුහය විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කරයි.
- වාණිජ බැංකුවක සුවිශේෂී කාර්යයක් වන මුදල් මැවීම සිදුවන ආකාරය සංඛ්‍යා දත්ත ඇසුරෙන් විග්‍රහ කරයි.
- වාණිජ බැංකුවක මුදල් මැවීම තීරණය කරන සාධක ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූලික වශයෙන් ලාභ ඉපයීමේ අරමුණ සහිත ව මූල්‍ය අතරමැදිකරණයේ නිරත වන මූල්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ඉතා ප්‍රබල හා ප්‍රමුඛ මූල්‍ය ආයතන විශේෂය වාණිජ බැංකු බව.
- වාණිජ බැංකුවලින් සපයන සේවාවන් පහත පරිදි දැක්විය හැකි බව.
  - තැන්පතු භාර ගැනීම
  - ණය සැපයීම
    - කෙටි කාලීන ණය
    - දිගු කාලීන ණය
  - නියෝජිත සේවා
  - පොදු උපයෝගිතා සේවා
    - විදේශ බැංකු කටයුතුවල දී සහාය වීම
    - උගස් සේවා සැපයීම
    - සුරැකුම් සේවා පවත්වාගෙන යාම
    - විදේශ විනිමය ගණුදෙනුවලට අදාළ පහසුකම් සැපයීම
- වාණිජ බැංකුවක ශේෂ පත්‍රයෙහි ඇතුළත් අයිතමයන් විග්‍රහ කිරීමෙන් බැංකුවේ ව්‍යාපාර කටයුතු පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි බව.
- ශේෂ පත්‍රයෙහි වම්පස කොටසින් පෙන්වන්නේ වාණිජ බැංකුවේ වගකීම් සංරචකයන් වන අතර දකුණු පස කොටසින් පෙන්වන්නේ වත්කම් සංරචකයන් බව.
- ශේෂ පත්‍රයෙහි වගකීම්වල එකතුව වත්කම්වල එකතුවට සමාන විය යුතු බව.

(ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ඇසුරෙන් වාණිජ බැංකු ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබා දෙන්න.)

- වාණිජ බැංකුවක් ව්‍යාපාරික කටයුතු මූලික අරමුණු දෙකක් මුල් කරගෙන ඉටුකරන අතර එම අරමුණු පහත දැක්වෙන බව.
  - ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීම
  - ලාභදායීත්වය ඉහළ නංවා ගැනීම
- මෙම අරමුණු අතර ගැටීමක් පවතින බව.
- වාණිජ බැංකුවක් විසින් මහ බැංකු නියමයන්ට අනුව තම තැන්පතු ප්‍රමාණයෙන් කිසියම් ප්‍රතිශතයක් මුදල් සංචිත ලෙස පවත්වා ගෙන යා යුතු වන අතර, එම අනුපාතය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නමින් හඳුන්වන බව.
- මහ බැංකුව මෙම අනුපාතය කලින් කලට වෙනස් කරනු ලබන බව.
- වාණිජ බැංකු තුළ ව්‍යවස්ථාපිත සංචිත ප්‍රමාණය ඉක්මවා ඇති සංචිත ප්‍රමාණය අධි සංචිත ලෙස හැඳින්වෙන අතර එය පහත පරිදි සෙවිය හැකි බව.

  අධි සංචිතය = පවත්නා මුදල් සංචිත - ව්‍යවස්ථාපිත සංචිතය
- අධි සංචිතය පහත සාධක මත තීරණය වන බව.
  - ණය සඳහා පවතින ඉල්ලුම
  - ද්‍රවශීලතාව හා ලාභදායකත්වය අතර වාණිජ බැංකු තේරීම
  - මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති
- තැන්පතු ගුණකය යනු, ඉල්ලුම් තැන්පතුවක් පදනම් කොට ණය මැවීමේ (තැන්පතු ප්‍රසාරණයේ) වාර ගණන වන අතර වැඩි වූ සංචිතය මෙන් කොපමණ ගුණයකින් ඉල්ලුම් තැන්පතු වැඩිවේද යන්න බැංකු තැන්පතු ප්‍රසාරණ ගුණකයෙන් දැක්වෙන බව.
- තැන්පතු ගුණකය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ පරස්පරයට සමාන බව.

$$\text{බැංකු තැන්පතු ප්‍රසාරණ ගුණකය} = \frac{1}{\text{ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය}} = \frac{1}{r}$$

**නිදසුන් :-** බැංකු තැන්පතු ගුණකය (K) $= \frac{1}{r}$

r =10% නම් තැන්පතු ගුණකය $= \frac{1}{\left(\frac{10}{100}\right)} = 10$

- ද්‍රවශීලතාව ආරක්ෂා කිරීමට යාමේ දී ලාභදායිත්වය අඩුවන අතර ලාභදායිත්වය ආරක්ෂා කිරීමට යාමේ දී ද්‍රවශීලතාවය අඩු වන බව.
- ඉහත අරමුණු දෙක අතර ගැටුමක් පවතින බැවින් අරමුණු දෙක තුලනය වන ආකාරයට වත්කම් පවත්වා ගත යුතු බව.

- වාණිජ බැංකු විසින් තම අධි සංචිත ණයට දීම තුළින් පැවති ප්‍රමාණය මෙන් කීප ගුණයක තැන්පතු බිහි කිරීම මුදල් මැවීම බව.
- ඒකාධිකාරී බැංකු ක්‍රමයක් ඇති විටෙක එක් බැංකුවක් පමණක් ක්‍රියාත්මක වන නිසා මුදල් මැවීම කළ හැකි වුවත් බැංකු පද්ධතියක් පවතින විට තනි බැංකුවකට මුදල් මැවීම කළ නොහැකි බව.
- බැංකු පද්ධතියක ණය මැවීමේ ක්‍රියාවලිය සඳහා පහත සඳහන් උපකල්පන පදනම් කර ගන්නා බව.
  - මූලික තැන්පතු ව කළ පසු බැංකු ක්‍රමය තුළට අලුතෙන් මුදල් ගලා ඒමක් හෝ බැංකු ක්‍රමයෙන් පිටතට මුදල් ගලා යාමක් හෝ සිදු නොවීම.
  - සියලුම ණය ගැණුම්කරුවන් තමා ලද ණය මුදල සම්පූර්ණයෙන් ම වෙනත් බැංකුවක තැන්පත් කරිම.
  - කිසිඳු බැංකුවක් අධි සංචිත පවත්වා නොගැනීම.
- මුදල් මැවීම තීරණය කිරීම සඳහා බලපාන සාධක කීපයක් ඇති බව.
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (r)වැඩි වන විට තැන්පතු ගුණකය අඩු වන අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (r) අඩුවන විට තැන්පතු ගුණකය වැඩි වන බව.
- තැන්පතු මැවීම පිළිබඳ පහත සඳහන් සීමාවන් පවතින බව.
  - මහජනයා ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමට වැඩි අභිරුචියක් පෙන්නුම් කළ හොත් වාණිජ බැංකුවල අධි සංචිත අඩු වීම.
  - බැංකු අධි සංචිත පවත්වාගෙන යාමට පෙළඹීමෙන් තැන්පතු මැවීම අඩුවීම.
  - ණය සඳහා ඉල්ලුම අඩු වීම.
  - මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති යටතේ ණය ප්‍රසාරණය පිළිබඳ පනවනු ලබන සීමා

**නිපුණතා මට්ටම 8.6** : ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු විග්‍රහ කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් දක්වමින් එම කාර්යයන් අරමුණු අනුව පෙළ ගස්වයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකා අර්ථිකයේ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම සඳහා පිහිට වූ ස්වාධීන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව බව.
- ප්‍රතිපත්ති, උපදේශ, කැපවීම සහ විශිෂ්ටත්වය තුළින් තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා ආර්ථික හා මිල ස්ථායීතාවය සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය පවත්වා ගෙන යාම මහ බැංකුවේ මෙහෙවර බව.
- පහත දැක්වෙන පරිදි මහ බැංකුවේ අරමුණු ද්විත්වයන් පවතින බව.
  - ආර්ථික හා මිල ස්ථායීතාවය පවත්වා ගෙන යාම
  - මූල්‍ය ක්‍රමයේ මිල ස්ථායීතාවය පවත්වා ගෙන යාම
- ආර්ථික හා මිල ස්ථායිතාවය යන්නෙන් අදහස් කරන්නේ අඩු උද්ධමන වේගයක් වෙත ළඟා වීම බව.
- මිල ස්ථායිතාව වැදගත් වන්නේ පහත සඳහන් හේතු මත බව.
  - ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට
  - කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීමට
  - නිෂ්පාදකයින් පාරිභෝගිකයන් හා ආයෝජකයින්ගේ අවදානම් අවම කිරීමට
  - ආර්ථික සැලසුම් සාර්ථක කර ගැනීමට
- මූල්‍යක්‍රමයේ ස්ථායිතාවයින් අපේක්ෂා කරනුයේ තැන්පත්කරුවන්ට හා ආයෝජකයන්ට හිතකර වාතාවරණයක් උදාකර දීම සඳහා යටිතල පහසුකම් වන ඵලදායී නියාමන රාමුව ශක්තිමත් හා ආරක්ෂාකාරී ගෙවීම් පියවීම් කටයුතු සම්පාදනය කිරීම බව.
- මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය වැදගත් වන්නේ පහත සඳහන් හේතු සඳහා බව.
  - මූල්‍ය ආයතන හා මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමට
  - ගෙවුම් ශේෂ අර්බුද වැළැක්වීමට
  - වත්කම්වල මිල සංවර කිරීමට
  - වෙළෙඳපොළ ද්‍රවශීලතාව සුරක්ෂිත කිරීමට
- ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය ප්‍රතිපත්තියේ ස්ථායිතාව යන අරමුණු වෙත ළඟාවීමට පොලී අනුපාතිකය සහ මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට මූල්‍ය උපකරණ හැසිරවීමේ ක්‍රියාවලිය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස හැඳින්විය හැකි බව.
- මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ ඉලක්ක පහත සඳහන් ලෙස දැක්විය හැකි බව.
  - මෙහෙයුම් ඉලක්කය - අධි බලැති මුදල් ප්‍රමාණය
  - අතරමැදි ඉලක්කය - පොළිය සහ මුදල් සැපයුම
  - අවසාන ඉලක්කය - මිල මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව

**නිපුණතා මට්ටම 8.7** : ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණවල භාවිත විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථකතනය කරයි.
- මූල්‍ය ප්‍රතිපත්ති උපකරණය අර්ථකතනය කරයි.
- ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් කරමින් ඒවා විග්‍රහ කරයි.
- ගුණාත්මක ණය පාලන උපකරණ නම් කරමින් ඒවා විග්‍රහ කරයි.
- මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය විස්තර කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- වැවක සොරොව්වකින් සිදු කරන කාර්යය පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - වැවක ජල කළමනාකරණයේ දී සොරොව්ව භාවිත කළ අතර අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය ස්ථානවලට ජලය බෙදා හැරීම හා පාලනය එමගින් සිදු කළ බව.
  - එලෙස ම ශ්‍රී ලංකා මහ බැංකුව ද රටේ මුදල් සැපයුම පාලනය සඳහා විවිධ උපකරණ භාවිත කරන බව.
  - මෙලෙස මුදල් සැපයුම පාලනය කිරීම සඳහා භාවිත කරන විවිධ උපකරණ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හඳුන්වන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ මහ බැංකුව විසින් පසුගිය වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස ගනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයකි. එයින් ඔබ කණ්ඩායමට ලැබුණු ක්‍රියාමාර්ගය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - බැංකු පොලී අනුපාතය 10% සිට 14% දක්වා වැඩි කිරීම
  - රබර් වගාව සඳහා ණය පොලී අනුපාතිකය 12% සිට 10% දක්වා අඩු කිරීම
  - මහ බැංකුව විවෘත වෙළෙඳපොළේ රුපියල් මිලියන 05 ක් වටිනා සුරැකුම්පත් විකිණීම
- වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු සංචිත ප්‍රමාණය 7% සිට 10% දක්වා වැඩි කිරීම
- ඔබට ලැබී ඇති ක්‍රියාමාර්ගය හොඳින් අධ්‍යයනය කරන්න.
- එම ක්‍රියාමාර්ගය ඇසුරින් ආර්ථිකයේ මුදල් සැපයුම හා ණය සැපයුමට සිදුවන බලපෑම සාකච්ඡා කරන්න.
- ඔබට අදාළ අවස්ථාව හා ණය පාලනය අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පංතියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පොලී අනුපාතිකයත් මුදල් සැපයුමත් වෙනස් කිරීම මගින් ණය පිරිවැයට ද ද්‍රවශීලතාවයට ද බලපෑම් කිරීම මූල්‍ය ප්‍රතිපත්තිය වශයෙන් හැඳින්වෙන බව.
- ප්‍රමාණාත්මක මූල්‍ය උපකරණ හා ගුණාත්මක මූල්‍ය උපකරණ යනුවෙන් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපකරණ දෙකක් පවතින බව.
- ණය සැපයුම අඩු කිරීම සඳහා පොදුවේ ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණාත්මක ණය පාලන උපකරණ ලෙසත්, ණය පරිමාව සහ ණය ගලා යන දිශාව පාලනය කිරීම සඳහා මහ බැංකුව ගන්නා ක්‍රියාමාර්ග ගුණාත්මක ණය පාලන උපකරණ ලෙසිනුත් හැඳින්වෙන බව.
- ප්‍රමාණාත්මක මූල්‍ය උපකරණ, බැංකු පොලී අනුපාතිකය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සහ විවට වෙළෙඳපොළ කටයුතු වශයෙන් ප්‍රධාන ආකාර තුනක් වන බව.
- ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස
  - බැංකු පොලී අනුපාතිකය
  - ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය
  - ප්‍රති විකුණුම් අනුපාතිකය දැක්විය හැකි බව.
- මේ අතරින් ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රති විකුණුම් අනුපාතිකය විවිට වෙළෙඳපොළ කටයුතු සඳහා යොදා ගන්නා බව
- ගුණාත්මක ණය පාලන උපකරණ ද විවිධ ස්වරූපයෙන් පවතින බව.
  - ණය සීමා නියම කිරීම
  - ණය සඳහා ඇප සුරැකුම් නියම කිරීම
  - වර්ණාත්මක පොලී අනුපාතික නියම කිරීම

- යහ පෙළඹුම්

- මුදල් සැපයුමේ වෙනස්වීමක් සමස්ත වියදම හා සමතුලිත නිමවුම වෙනස්වීම දක්වා ගමන් කරන ආකාරය මූල්‍ය සම්ප්‍රේෂණ යාන්ත්‍රණය යනුවෙන් හැඳින්වෙන බව.
- ඒ තුළින් සමස්ත වියදමට හා සමතුලිත නිමවුමට වන බලපෑම පැහැදිලි කළ හැකි බව.

**මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ**




- මේ එකිනෙකක් නිසා මූල්‍ය ප්‍රසාරණයට හා ණය සැපයුමට ඇතිවන බලපෑම පැහැදිලි කළ හැකි බව.
- මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය
  - පොලී අනුපාතික
  - වත්කම් මිල
  - ණය සැපයුම
  - විනිමය අනුපාතිකය
  - ව්‍යාපාරික හා කුටුම්භ අපේක්ෂා

**නිපුණතා මට්ටම 8.8** : ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.
- මූල්‍ය වෙළෙඳපොළ වර්ග කර දක්වයි.
- මුදල් වෙළෙඳපොළ අර්ථ දක්වමින් එහි ක්‍රියාත්මක වන උප වෙළෙඳ පොළවල් පැහැදිලි කරයි.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ අර්ථ දක්වමින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ගණුදෙනු කරන ආයතන පැහැදිලි කරයි.
- මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ අතර පවතින් වෙනස්කම් සසඳයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- මූල්‍ය වත්කම්වල හුවමාරුව සඳහා අවශ්‍ය පහසුකම් සපයන ආයතන හෝ වැඩපිළිවෙළ මූල්‍ය වෙළෙඳපොළ නමින් හඳුන්වන බව.
- මූල්‍ය වෙළඳපොළ, මුදල් වෙළෙඳපොළ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ වශයෙන් ප්‍රධාන වර්ග දෙකකින් සමන්විත වන බව.
- ණය උපකරණවල ද්‍රවශීලතාවය හා පරිණතවීමේ කාලය මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළ වෙන්කරගන්නා නිර්ණායක බව
- මුදල් හා කෙටි කාලීන මූල්‍ය උපකරණ ගණුදෙනු වන වෙළෙඳපොළ මුදල් වෙළෙඳපොළ බව.
- කෙටිකාළින ණය ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් සම්බන්ධ කිරීම එහි ප්‍රධාන කාර්යය බව.
- කෙටි කාලීන මූල්‍ය උපකරණ යනු සාමාන්‍යයෙන් වර්ෂයකට අඩු පරිණත කාලයක් සහිත බිල්පත් හා සුරුකුම්පත් ආදිය බව.
- මුදල් වෙළෙඳපොළේ ගණුදෙනු වන උපකරණ ලෙස ඒක්ෂණ ණය, භාණ්ඩාගාර බිල්පත්, සුරැකුම්පත්, දේශිය හා විදේශිය විනිමය බිල්පත් සහ වානිජ පත්‍රිකා ප්‍රතිමිළදී ගැනුම් ගිවිසුම් යනාදිය දැක්විය හැකි බව.
- මුදල් වෙළෙඳපොළේ පවතින උප වෙළෙඳපොළ පහත සඳහන් වන බව.
  - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
  - ප්‍රාථමික හා ද්විතීක භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
  - දේශිය හා විදේශිය විනිමය වෙළෙඳපොළ
  - සීමිත එතෙර බැංකු වෙළෙඳපොළ

- කෙටි කාලීන ණය වෙළෙඳපොළ
    - වානිජ පත්‍රිකා වෙළෙඳපොළ
    - ප්‍රති මිළදී ගැනුම් ගිවිසුම් වෙළෙඳපොළ
- ව්‍යාපාර ආයතනවලට හා රජයට අවශ්‍ය මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයන්නේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් බව.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ පහත සඳහන් ආයතනවලින් සමන්විත වන බව.
    - කොළඹ කොටස් හුවමාරුව.
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු.
    - වණික් බැංකු.
    - කල්බදු සමාගම්.
    - මූල්‍ය සමාගම්.
    - ඒකක භාර.
    - ඉතුරුම් ආයතන.
- වර්ෂයකට වඩා වැඩි කල් පිරෙන ණය ලියවිලි මෙම වෙළෙඳ පොළේ අලෙවි කෙරෙන බව.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ හුවමාරුවන ප්‍රධාන උපකරණ පහත සඳහන් බව.
    - ණය
    - සාමාන්‍ය කොටස්
    - පිළිණපත්
- ප්‍රාග්ධන වෙළෙඳපොළේ උප වෙළෙඳපොළවල් පහත සඳහන් බව.
    - කොටස් වෙළෙඳපොළ
    - පිළිණ පත් වෙළෙඳපොළ
    - වානිජ බැංකු දිගු කාලීන ණය වෙළෙඳපොළ
    - බැංකු නොවන මූල්‍ය ආයතනවල දිගු කාලීන ණය වෙළෙඳපොළ

**නිපුණතාව 9** : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහිලා රජය මැදිහත්වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 9.1** : වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීමට හේතු තාර්කිකව ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීම අර්ථ දක්වයි.
- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීමට බලපාන හේතු විග්‍රහ කරයි.
- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීමට බලපාන හේතු වෙළෙඳපොළ ක්‍රමය අසාර්ථක වීමට බලපාන අයුරු විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීම යනුවෙන් අදහස් කරන්නේ සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් බෙදා හැරීමේ ලා වෙළෙඳපොළ යාන්ත්‍රණය අපොහොසත් වීම බව.
- ස්වාර්ථය මත කරනු ලබන තේරීම් සමාජයේ යහපතට සැමවිටම දායක නොවන බව.
- මෙහිදී සම්පත් අකාර්යක්ෂමව ලෙස බෙදීයාමක් සිදුවන බව
- වෙළෙඳපොළ අසමත් වීමට පහත සඳහන් හේතු බලපාන බව.
  - බාහිරතා
  - අපූර්ණ තරඟය
  - තොරතුරු අපූර්ණත්වය
  - පොදු භාණ්ඩ නොසැපයීම
  - අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්තව නො සැපයීම
  - සුභසාධන භාණ්ඩ ප්‍රශස්තව නො සැපයීම
- නිෂ්පාදනය නිසාත් පරිභෝජනය නිසාත් එයට සෘජු සම්බන්ධයක් නැති විවිධ පාර්ශව වලට ඇති වන වන්දි පූර්ණය නොකළ යහපත් හා අයහපත් බලපෑම් බාහිරතා වන අතර එවා සැලකිල්ලට නොගැනීම නිසා වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීම සිදුවන බව.
- වෙළෙඳපොළ ක්‍රමයේ දී තරගකාරිත්වය හිලිහී ගොස් ඒකාධිකාරී තත්ත්වයක් ඇතිවීම අපූර්ණ තරගය ලෙස හැඳින්වෙන බව.
- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීම කෙරෙහි අපූර්ණ තරගය පහත පරිදි බලපාන බව.
  - සම්පත් අකාර්යක්ෂම ව බෙදීයාම
  - නිෂ්පාදනය සමාජ ප්‍රශස්ත නිෂ්පාදනයට වඩා අඩු වීම.
  - භාණ්ඩයේ මිල තරගකාරී තත්ත්වයක දී පවතින මිලට වඩා වැඩි වීම.

- එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය වෙනත් පුද්ගලයෙකුගේ පරිභෝජනය සීමා කිරීමට හේතුනොවන, පරිභෝජනයේදී තරගකාරිත්වයක් නොමැති සහ මිලක් නොගෙවන්නන් පරිභෝජනයෙන් බැහැරකල නොහැකි භාණ්ඩ හා සේවා පොදු භාණ්ඩ බව.
  නිදසුන් : විථි ආලෝකය, ප්‍රදීපාගාර, ඔර්ලෝසු කණු, ජාතික ආරක්ෂාව
- පොදු භාණ්ඩ වලින් මිලක් අයකර ගත නොහැකි නිසාත්, ලාභයක් ලැබිය නොහැකි නිසාත් වෙළෙඳපොළ ක්‍රමයෙන් පොදු භාණ්ඩ සැපයීම සිදු නොවන බව.
- වෙළෙඳපොළ ක්‍රමයේ දී පොදු භාණ්ඩ නොසැපයීම නිසා පොදු භාණ්ඩ සැපයීමට රජයට මැදිහත් වීමට සිදුවන බව.
- පරිභෝජනයේදී තරගකාරිත්වයක් නොමැති නමුත් මිලක් නොගෙවන්නන් පරිභෝජනයෙන් බැහැර කළ හැකි භාණ්ඩ හා සේවා අර්ධ පොදු භාණ්ඩ බව.
  නිදසුන් : අධිවේගී මහාමාර්ග, උමං මාර්ග
- වෙළෙඳපොළ ක්‍රමයේ දී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව සැපයීම සිදු නොවන නිසා රජයට මැදිහත් වී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්තව සැපයීමට කටයුතු කරීමට සිදුවන බව.
- පරිභෝජනයේ දී පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩ හා සේවා සුභසාධන භාණ්ඩ බව.
  නිදසුන් : අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, සනීපාරක්ෂක සේවා
- වෙළෙඳපොළ ක්‍රමයේ දී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව සැපයීම සිදු නොවන නිසා ඌන පරිභෝජනයක් සිදුවන බව.
- මේ නිසා සුභ සාධන භාණ්ඩ පාරිභෝජනයට පාරිභෝගිකයා පෙළඹවීම සඳහා රජයට මැදිහත් වීමට සිදුවන බව.
- පරිභෝජනයේදී පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා අඩු සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩ හා සේවා සමාජයට අහිතකර භාණ්ඩ (අවගුණ භාණ්ඩ) බව.
- වෙළෙඳපොළ ක්‍රමයේ දී සමාජයට අහිතකර භාණ්ඩ (අවගුණ භාණ්ඩ) සැපයීමේදී සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා වැඩි නිෂ්පාදනයක් සිදුවන බව.
- මේ නිසා සමාජයට අහිතකර භාණ්ඩ (අවගුණ භාණ්ඩ) නිෂ්පාදනය හෝ පාරිභෝජනය සීමා කිරීම සඳහා රජයට මැදිහත් වීමට සිදුවන බව
- වෙළෙඳපොළ ක්‍රමයේ දී පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට තීරණ ගැනීමට අවශ්‍ය කරන තොරතුරු කාර්යක්ෂම ව නොලැබීම තොරතුරු අපූර්ණත්වය බව.
- වෙළෙඳපොළ අසමත්වීම් වැඩ පැවැත්වීම සඳහා රජයකට විවිධ ක්‍රියා මාර්ග ගතහැකි බව.

**නිපුණතා මට්ටම 9.2** : වෙළෙඳපොළ ක්‍රමය අසාර්ථකවීම කෙරෙහි බාහිරතාවල බලපෑම පරීක්ෂා කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- බාහිරතා නිර්වචනය කරයි.
- ධන බාහිරතා හා සෘණ බාහිරතා අතර වෙනස නිදසුන් සහිතව පැහැදිලි කරයි.
- නිෂ්පාදනයේදී හා පරිභෝජනයේ දී ඇතිවන ධන හා සෘණ බාහිරතාවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- පාරිභෝජනයේදී හා නිෂ්පාදනයේ දී ඇතිවන බාහිරතා ප්‍රස්තාර සටහන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- බාහිරතා හේතු කොටගෙන වෙළෙඳපොළ ක්‍රමය අසාර්ථක වන ආකාරය පැහැදිලි කරයි.
- බාහිරතා හේතුවෙන් හටගන්නා වෙළෙඳපොළ අසාර්ථක වීම් වළක්වාලීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- විශාල කරන ලද බාහිරතා දැක්වෙන පින්තූර දෙකක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
  නිදසුන් :- කර්මාන්තශාලාවක් සහ තැඹිලි කෝම්බවල ජලය පිරී පැවතීමක්
- පින්තූරවල අඩංගු දෑ වලින් සමාජයට සිදුවන යහපත් සහ අයහපත් ප්‍රතිඵල පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පින්තූරවල අඩංගු දෑ වලින් සමාජයට යහපත් සහ අයහපත් ප්‍රතිඵල අත්වන බව
    නිදසුන් :-
    - කර්මාන්තශාලාව නිසා නවාතැන් පහසුකම් වල මිල ඉහල යාම
    - තැඹිලි කෝම්බවල ජලය පිරීම නිසා ඩෙංගු සහ බරවා වැනි වසංගත ඇති වීම
  - ඒ වෙනුවෙන් සමාජයට වන්දියක් ලැබීම හෝ සමාජය විසින් වියදමක් දැරීම හෝ සිදු නොවන බව.
  - මේ ආකාරයට කිසියම් ආර්ථික කටයුත්තක් නිසා ඊට සම්බන්ධ නොවන බාහිර පාර්ශ්වයකට අත්වන වන්දි විචලනය නොකරන ලද වාසි හෝ අවාසි බාහිරතා ලෙස හඳුන්වන බව.
  - නිෂ්පාදනයේ දී මෙන්ම පරිභොජනයේ දී ද බාහිරතා හටගන්නා බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙ හි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :

- පහත සඳහන් මාතෘකා අතුරෙන් ඔබට ලැබී ඇති මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
  - නිෂ්පාදනයේ බාහිරතා
  - පාරිභෝජනයේ බාහිරතා
- ඔබට ලැබී ඇති මාතෘකාව අවබෝධ කර ගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මාතෘකාවලට අදාළව ඔබට ලැබී ඇති අත්දැකීම් සාකච්ඡා කර තොරතුරු රැස්කර ගන්න
- ඔබ රැස්කර ගත් තොරතුරු ඇසුරෙන් බාහිරතා ලැයිස්තු ගත කර එම බාහිරතා හිතකර හා අහිතකර බාහිරතා ලෙස වෙන් කොට දක්වන්න.
- බාහිරතා ඇතිවීමට හේතු හා ඒවායේ ප්‍රතිඵල හඳුනාගන්න.
- එම බාහිරතා වළක්වා ගැනීමේ වැදගත්කම හා ඒවා වළක්වා ගන්නා ආකාරය පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පංතියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- බාහිරතා යනු කිසියම් ආර්ථික කටයුත්තක් නිසා ඊට සම්බන්ධ නොවන බාහිර පාර්ශවයන්ට සිදු වන වන්දි නොගෙවන ලද වාසි හෝ අවාසි බව.
- නිෂ්පාදන මෙන්ම පාරිභෝජනයෙන් ද බාහිරතා පැන නගින බව.
- නිෂ්පාදන කටයුත්තක් නිසා බාහිර පාර්ශවයන්ට ඇතිවන වාසි හෝ අවාසි නිෂ්පාදනයේ බාහිරතා බව.
- පරිභෝජන කටයුත්තක් නිසා බාහිර පාර්ශවයන්ට ඇතිවන වාසි හෝ අවාසි පාරිභෝජනයේ බාහිරතා බව.
- බාහිර පාර්ශවයන්ට ඇතිවන වාසි සහගත තත්ත්ව ධන බාහිරතා ලෙසත් අවාසි සහගත තත්ත්ව ඍණ බාහිරතා ලෙසත් සැලකෙන බව.
- නිෂ්පාදනයේ ධන බාහිරතා වලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
  - නව තාක්ෂණය සඳහා යොමු වූ පර්යේෂණ
  - අලංකාර උයන් වතු

- නිෂ්පාදනයේ සෘණ බාහිරතාවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
    - පොසිල ඉන්ධන දහනය කරන නිෂ්පාදන ක්‍රියා
    - වායුගෝලයේ ඕසෝන් ස්ථරයට හානි දෙන නිෂ්පාදන කටයුතු
- පරිභෝජනයේ ධන බාහිරතාවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
    - රෝග වළක්වන එන්නත්
    - අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන්
- පරිභෝජනයේ සෘණ බාහිරතාවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
    - අපද්‍රව්‍ය එක්රැස්වීම
    - මෝටර්රථ වලින් දුම් පිටවීම
- සෘණ බාහිරතා නිසා බාහිර පිරිවැයත් ධන බාහිරතා නිසා බාහිර ප්‍රතිලාභත් හටගන්නා බව.
- බාහිර පිරිවැය හා බාහිර ප්‍රතිලාභ පදනම් කරගෙන සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ හටගන්නා බව.

    පෞද්ගලික පිරිවැය + බාහිර පිරිවැය = සමාජ පිරිවැය

    පෞද්ගලික ප්‍රතිලාභ + බාහිර ප්‍රතිලාභ = සමාජ ප්‍රතිලාභ
- වෙළෙඳපොළ ක්‍රමයේ දී සැළකිල්ලට ගැනෙන්නේ පෞද්ගලික පිරිවැය හා පෞද්ගලික ප්‍රතිලාභ පමණක් බව.
- බාහිරතා සැළකිල්ලට නොගන්නා නිසා වෙළෙඳපොළ ක්‍රමයේ නිෂ්පාදන හා පරිභෝජන තීරණ ප්‍රශස්ත නොවන බව.
- මෙය පහත සඳහන් ප්‍රස්තාර සටහන් ඇසුරෙන් පැහැදිලි කළ හැකි බව.



මෙම ප්‍රස්තාර සටහනේ

MSC = ආන්තික සමාජ පිරිවැය

MSB = ආන්තික සමාජ ප්‍රතිලාභ

MPB = ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ ලෙස දැක්වෙන බව.

- ඉහත ප්‍රස්තාර සටහනට අනුව වෙළෙඳපොළ ප්‍රශස්ත සමතුලිතය වන්නේ ආන්තික සමාජ පිරිවැය (MSC) ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ (MPB) වලට සමාන වන A ලක්ෂය වන අතර $Q_0$ සමතුලිත නිමවුම ප්‍රශස්ත නිමවුම බව.
- සමාජ දෘෂ්ටිකොණයෙන් ප්‍රශස්ත සමතුලිතය වන්නේ ආන්තික සමාජ පිරිවැය (MSC) ආන්තික සමාජ ප්‍රතිලාභ (MSB) වලට සමාන වන B ලක්ෂය වන අතර $Q_1$ සමතුලිත නිමවුම ප්‍රශස්ත නිමවුම බව.
- පරිභෝජනයේ ධන බාහිරතාවක් පවතින අවස්ථාවක සමාජ දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත පරිභෝජනය වෙළෙඳපොළ ප්‍රශස්ත පරිභෝජනය ඉක්මවන බව.




මෙම ප්‍රස්තාර සටහනේ

MC = ආන්තික පිරිවැය

MSC = ආන්තික සමාජ පිරිවැය

MSB = ආන්තික සමාජ ප්‍රතිලාභ ලෙස දැක්වෙන බව

- ඉහත ප්‍රස්තාර සටහනට අනුව වෙළෙඳපොළ ප්‍රශස්ත නිෂ්පාදනය වන්නේ ආන්තික පිරිවැය (MC) ආන්තික සමාජ ප්‍රතිලාභ (MSB) වලට සමාන වන A ලක්ෂය වන අතර $Q_0$ සමතුලිත නිමවුම ප්‍රශස්ත නිමවුම බව.
- සමාජ දෘෂ්ටිකොණයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය වන්නේ ආන්තික සමාජ පිරිවැය (MSC) ආන්තික සමාජ ප්‍රතිලාභ (MSB) වලට සමාන වන B ලක්ෂය වන අතර $Q_1$ සමතුලිත නිමවුම ප්‍රශස්ත නිමවුම බව.
- ඒ අනුව නිෂ්පාදනයේ ධන බාහිරතාවක් පවතින අවස්ථාවක වෙළෙඳපොළ ප්‍රශස්ත නිෂ්පාදනයට වඩා සමාජ දෘෂ්ටිකොණය අනුව ප්‍රශස්ත නිෂ්පාදනය වැඩි බව.
- මේ අනුව වෙළෙඳපොළ ක්‍රමයේ අසාර්ථකත්වයට බාහිරතා හේතුවේ යන්න පැහැදිලි වන බව.
- බාහිරතා නිසා ඇතිවන අසාර්ථක වීම් වළක්වාලීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගත හැකි බව.
  - වන්දි ගෙවීම
  - අභ්‍යන්තර ගත කිරීම
  - සලාකනය කිරීම
  - බලපත්‍ර ගාස්තු අය කිරීම
  - දඩ ගැසීම
  - නීති පැනවීම
- බාහිරතා වළක්වා ගැනීම සඳහා ආයතන විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති බව.

  නිදසුන් :-
  - හානි පූර්ණය කිරීමට ලාභයෙන් කොටසක් වෙන් කිරීම
  - ශබ්ද දූෂණය වළක්වා ගැනීමට කර්මාන්තශාලා තුළ නවීන උපකරණ සවිකර තැබීම.
  - අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම.

**නිපුණතා මට්ටම 9.3** : වෙළෙඳපොළ ආර්ථිකයක රාජ්‍ය කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය හඳුන්වයි.
- ඒවා අර්ථකතනය කරයි
- එම කාර්යයන් වෙළෙඳපොළ කාර්යක්ෂමතාව ඇති වීමට බලපාන ආකාරය පෙන්වා දෙයි.
- වෙළෙඳපොළ අර්ථිකයක රජයේ කාර්යභාරය ඉටු කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග නිදසුන් සහිතව විග්‍රහ කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය ඉටුකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගවල ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය ඉටු කිරීමට යාමේ දී රාජ්‍යය අසාර්ථකවීම විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැකි බව.
    - සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම
    - ආදායම හා ධනය සාධාරණව බෙදා හැරීම
    - නීතිරීති සම්පාදනය හා යහපාලනය
    - සාර්ව ආර්ථික ස්ථායීකරණය ඇති කිරීම
    - ආර්ථික වර්ධනය සහ තිරසාර සංවර්ධනය ඇති කිරීම
    - යටිතල පහසුකම් සැපයීම
- වෙළෙඳපොළ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කරන නෛතික පදනම හා සමාජයීය පරිසරය සම්පාදනය කිරීම සඳහා රජය කටයුතු කරන බව.
- වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන අකාර්යක්ෂමතාවන් ඉවත් කිරීම සඳහා රජයක් පහත පරිදි ක්‍රියාත්මක වන බව.
    - පොදු භාණ්ඩ හා ශුභ සාධන භාණ්ඩ සම්පාදනය
    - අපූර්ණ තරගය වැළැක්වීම
    - පරිසර දූෂණය වැනි බාහිරතා පිළිබඳ අවධානය යොමු කිරීම
    - පොදු සම්පත් පිළිබඳ හිමිකාරිත්වය තහවුරු කිරීම

- සාධාරණත්වය ස්ථාපිත කිරීම සඳහා රජය පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා බව.
    - ආදායම් හා ධන ප්‍රතිව්‍යාප්තිය ඇති කිරීම
    - ධන සමුච්චය පිළිබඳ සීමා
    - ඉඩම් ප්‍රතිසංස්කරණ
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා උද්ධමනය හා සේවා වියුක්තිය වැනි තත්ත්වයන් ඉවත් කිරීමට රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නා බව.
- ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඉහළ නැංවීම සඳහා රජය කටයුතු කරන බව.
- යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා පහත පරිදි රජය කටයුතු කරන බව.
    - භෞතික යටිතල පහසුකම් සැපයීම

      නිදසුන් :- මහා මාර්ග, අධිවේගී මාර්ග, පාලම්, ගුවන් තොටුපල, ගොඩනැගිලි
    - ආයතනික යටිතල පහසුකම් සැපයීම

      නිදසුන් :-නීති පද්ධති, උසාවි, නියාමන ආයතන
- වෙළෙඳපොළ ආර්ථිකයකට රජය මැදිහත් වීමේදී රාජ්‍ය අංශයට ආවේනික වූ ඇතැම් දුර්වලතා හේතුකොට අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ අකාර්යක්ෂමතා වර්ධනය වීම රාජ්‍ය අසමත් වීම ලෙස හඳුන්වන බව.
- වෙළෙඳපොළ අසමත්වීම මැඩ පවත්වා ගැනීමට රජය විසින් ආර්ථිකය තුළ කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අසමත් වීම සඳහා බලපානු ලබන බව.

**නිපුණතා මට්ටම 9.4** : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නා ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් කරමින් පැහැදිලි කරයි.
- විවිධ සාර්ව ආර්ථික අරමුණු ඉටු කරගැනීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නා ආකාරය නිදසුන් සහිතව විග්‍රහ කරයි.
- සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමේ දී මතුවන ගැටළු පැහැදිලි කරයි.
- සාර්ව ආර්ථික අරමුණු ඉටු කරගැනීමේ දී මතුවන ගැටළු අවම කර ගැනීම යෝජනා ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය තුළින් ආර්ථිකයක් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු සාර්ව ආර්ථික අරමුණු බව.
- සෑම ආර්ථිකයක්ම පොදුවේ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන සාර්ව ආර්ථික අරමුණු කිහිපයක් පවතින අතර ඒවා පහත දැක්වෙන බව.
  - පූර්ණ සේවා නියුක්තිය
  - ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනිම
  - මිල ස්ථායිතාවය
  - ගෙවුම් ශේෂ සමතුලිතතාව
  - තිරසාර සංවර්ධනය
- ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය මත සාර්ව ආර්ථික අරමුණුවල ඉටුවීම රඳා පවතින බව.
- සාර්ව ආර්ථික විචල්‍යයන් හි මට්ටම හා කාලය අනුව ඒවා වෙනස් වන ආකාරය මත ආර්ථිකයක ක්‍රියාකාරිත්වය තීරණය වන බව.
- ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් ගණනාවක් ආර්ථිකයක් තුළ පවතින බව.
  නිදසුන් :- නිෂ්පාදනය, සේවා නියුක්තිය, මිල මට්ටම, පරිභෝජනය
- සාර්ව ආර්ථික විචල්‍යයන් හි මට්ටමත්, එය කාලයත් සමඟ වෙනස් වන ආකාරයත් තීරණය වන්නේ අභ්‍යන්තර හා බාහිර සාධක මත බව.
- සාර්ව ආර්ථික විචල්‍යයන් යහපත් අයුරින් වෙනස් නොවන විට ආර්ථික ක්‍රියාකාරිත්වය අයහපත් වන බව.

- ආර්ථිකයක සමස්ත ක්‍රියාකාරීත්වය තුළින් ඇති වන ප්‍රශ්න සාර්ව ආර්ථික ප්‍රශ්න වන බව.

  නිදසුන් :- සේවා වියුක්තිය, උද්ධමනය ඉහළ යාම, විනිමය අනුපාතිකය පිරිහීම
- සාර්ව ආර්ථික විචල්‍යයන් අපේක්ෂිත මට්ටමට ගෙන ඒමෙන් මෙම ප්‍රශ්නවලට විසඳුම් ලබා ගත හැකි බව.
- ආර්ථිකයක සාර්ව ආර්ථික අරමුණු කරා ළඟාවීම සඳහා ආර්ථිකයක් මෙහෙයවීම සාර්ව ආර්ථික කළමණාකරණය ලෙස හැඳින්වෙන බව.
- සාර්ව ආර්ථික කළමණාකරණයේ දී ගනු ලබන ක්‍රියා මාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හඳුන්වන බව.

  නිදසුන් :- මූල්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය
- රාජ්‍ය ආදායම ද රාජ්‍ය වියදම ද හැසිරවීම මගින් සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය (ෆිස්කල් ප්‍රතිපත්තිය, අයවැය ප්‍රතිපත්ති) බව.
- රාජ්‍ය බදු, රාජ්‍ය වියදම් සහ රාජ්‍ය ණය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපකරණ බව.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මඟින් සමාහාර ඉල්ලුමට බලපෑම් කෙරෙන බැවින් මූල්‍ය ප්‍රතිපත්තිය සේම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ද ඉල්ලුම් කළමණාකරණ ප්‍රතිපත්තියක් ලෙස හැඳින්වෙන බව.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ යොදා ගනිමින් සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට යාමේ දී අරමුණු අතර ගැටීමක් මතු වන බව.

  නිදසුන් :-
  - පූර්ණ සේවා නියුක්තිය අත් කර ගැනීමට ප්‍රසාරණාත්මක මාර්ගවලින් ගනු ලබන රාජ්‍ය ණය ප්‍රමාණය වැඩි කිරීමට පියවර ගත්තේ නම් වැටුප් ඉහළ යාම හේතුවෙන් උද්ධමනය ඇති වීම හා ඒ අනුව මිල ස්ථායිතා අරමුණු ඉටු කර ගැනීම දුෂ්කර වීම
  - බදු සහන ආදිය ලබා දීම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීමට උත්සාහ ගැනීමේ දී එම අරමුණු ඉටු වුව ද තිරසාර සංවර්ධනයට අයහපත් බලපෑම් ඇති වීම
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගනිමින් සාර්ව ආර්ථික අරමුණු සියල්ල ඉටු කර ගැනීම දුෂ්කර වන්නේ එකී අරමුණු අතර ගැටීමක් සිදු වන නිසා බව.
- මෙම ගැටළු අවම වන ආකාරයට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව.

**නිපුණතා මට්ටම 9.5** : රාජ්‍ය ආදායමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස බදු ක්‍රමය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රාජ්‍ය ආදායමේ ප්‍රධාන මූලාශ්‍ර නම්කර පැහැදිලි කරයි.
- රාජ්‍ය බදු ආදායමෙහි සහ බදු නොවන ආදායමේ සංයුතිය ඉදිරිපත් කරයි.
- බදු මූලධර්ම නම් කරමින් ඒවා පැහැදිලි කරයි.
- විවිධ ස්වරූපයන් යටතේ බදු වර්ගකර දක්වයි.
- බදු ක්‍රමයකින් ආර්ථිකයට ඇතිවන හිතකර හා අහිතකර බලපෑම් ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ ව්‍යුහය ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ උපනති පරීක්ෂා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- රාජ්‍යය ආදායම් ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකක් පවතින බව.
  - බදු ආදයම
  - බදු නොවන ආදායම
- බදු අය කිරීමේ විවිධ මූලධර්ම පවතින බව.
- අවසාන වශයෙන් බදු බර දැරීම බදු ආපාතය බව.
- බදු ආපාතය මත ඍජු බදු හා වක්‍ර බදු වශයෙන් නැවත බදු කොටස් දෙකකට බෙදා වෙන්කළ හැකි බව.
- ඍජු බදුවලදී බද්දට හසුවන පුද්ගලයා හෝ ආයතන විසින් ම බදු ගෙවීම සිදුවන අතර එය ආදායම, ධනය හෝ දේපොළ මත රඳා පවතින බව.

  නිදසුන් :- අදායම් බදු, මුද්දර බදු
- බදු ගෙවන්නා මත ම බදු බර නොපැටවෙන විතැන් කළහැකි බදු වක්‍ර බදු බව.

  නිදසුන් :-භාණ්ඩ හා සේවා මත පනවන බදු, පිරිවැටුම් බදු
- බදු අයකිරීමේ අනුපාත අනුව ආකාර තුනකට බදු වර්ග කළ හැකි බව.
  - සමානුපාතික බදු
  - අනුක්‍රමික බදු
  - ප්‍රතික්‍රමික බදු
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ සංයුතිය සහ උපනතින් බැංකු වාර්තාව ඇසුරින් පරීක්ෂා කළ හැකි බව.

  (රාජ්‍ය ආදායමේ සංයුතිය සහ උපනතින් පිළිබඳ කාලීන තොරතුරු බැංකු වාර්තාව ඇසුරින් සිසුන් සමග සාකච්ඡා කරන්න)

**නිපුණතා මට්ටම 9.6** : රාජ්‍ය වියදම් සංයුතිය අධ්‍යයනයෙන් මෑත කාලීන වෙනස්කම් අනාවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රාජ්‍ය වියදම් අර්ථ දක්වයි.
- ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍යය වියදම් වර්ගකර ඒවා නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- කාර්ය බද්ධ වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම් වර්ගකර පැහැදිලි කරයි.
- උපනතීන් ඉදිරිපත් කරයි.
- වියදම්වල ආර්ථික ප්‍රතිවිපාක ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- රාජ්‍ය කටයුතු කරගෙන යාමට රජය කරන වියදම් රාජ්‍ය වියදම් බව.
- ප්‍රධාන ක්‍රම දෙකකට රාජ්‍ය වියදම් වර්ග කළ හැකි බව.
- ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම් පහත ලෙසින් වන බව.




(මෙම වර්ගීකරණයේ ඒ ඒ කොටස්වලට අදාළ වියදම් සඳහා නිදසුන් මහ බැංකු වාර්තාව ඇසුරෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න.)

- වර්තන වියදම් පරිභෝජන වියදම් සහ පුනරාවර්තන වියදම් ලෙස ද, ප්‍රාග්ධන වියදම් ආයෝජන වියදම් ලෙසද හැඳින්විය හැකි බව.

- රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා කරන වියදම් වර්තන වියදම් බව.

.

නිදසුන් :- සේවක වැටුප්, කාර්යාල ලිපි ද්‍රව්‍ය ගොඩනැගිලි කුලී, ප්‍රවාහන වියදම්, විදුලි ගාස්තු සහ විදුලි සංදේශ සේවා

- ප්‍රාග්ධන භාණ්ඩ බිහි කිරීම සඳහා රජය කරන වියදම් ප්‍රාග්ධන වියදම් බව.

  නිදසුන් :- කාර්යාලීය ගෘහ භාණ්ඩ, කාර්යාලීය ගෘහ උපකරණ, ගොඩනැගිලි, රථ වාහන සහ මහා මාර්ග ඉදි කිරීම්

- මූර්ත වත්කම් අත්පත් කර ගැනීමේ ප්‍රාග්ධන වියදම්වලට දේපල ගොඩනැගිලි යනාදිය මිලට ගැනීම අයත් වන බව.
- ප්‍රාග්ධන පැවරුම්වලට රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ආයතන හා රාජ්‍ය උප ආයතන යනාදියට කරන පැවරුම් අයත් වන බව.
- කාර්යය බද්ධ වර්ගීකරණයට අනුව රජයේ වියදම් ගැලීම් සටහනකින් පහත ලෙස දැක්විය හැකි බව.




(මෙම වර්ගීකරණයේ ඒ ඒ කොටස්වලට අදාළ වියදම් සඳහා නිදසුන් මහ බැංකු වාර්තාව ඇසුරෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න.)

- මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය වියදම් ප්‍රමාණාත්මක වශයෙන් ක්‍රමයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට ඇති බව.
- අනාගත ප්‍රතිලාභ රාශියක් ජනිත කිරීමට හේතු වන රජයේ ප්‍රාග්ධන වියදම් ශුද්ධ ණය දීම් යනාදිය රාජ්‍ය අයෝජන බව.
- රාජ්‍ය ආයෝජන සඳහා රජය මැදිහත් වන්නේ ප්‍රධාන වශයෙන් පහත හේතු නිසා බව.
  - පෞද්ගලික අංශය ඉදිරිපත් නොවන ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීම අවශ්‍ය වන නිසා ඒ තුළින් ආර්ථික වර්ධනය රුකුලක් වීම
  - පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පහසුකම් හා සේවා සැලසීමට
- මෑතක් වන තුරු රජයේ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් පහත හේතු නිසා සීමා වී ඇති

බව.

- ඉහළ නැගුණු ආරක්ෂණ වියදම්
- ඉහළ නැගුණු ණය සේවා ගෙවීම් (විශේෂයෙන් පොලී ගෙවීම්)
- වර්තන පැවරුම් ඉහළ යාම

- මෑත වර්ෂවල රජයේ ප්‍රාග්ධන වියදම්වල ප්‍රමාණාත්මක අගය වැඩි වීමට පහත හේතු බලපා ඇති බව.
- මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘතිවලට නිදසුන් පහත සඳහන් වන බව.
  - රන්දොර
  - ගම නැගුම
  - දකුණු පළාත් ග්‍රාමීය අභිවර්ධන ව්‍යාපෘතිය
  - කුඩා වාරිමාර්ග ව්‍යාපෘති
  - පුනරුත්ථාපන හා පළාත් පාලන ව්‍යාපෘති

**නිපුණතා මට්ටම 9.7** : රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විශ්ලේෂණාත්මකව සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රාජ්‍ය අයවැය ලේඛනය අර්ථ දක්වා එහි ආකෘතිය ඉදිරිපත් කරයි.
- හිඟ, අතිරික්ත සහ තුලිත ලෙස අයවැය වර්ග කරයි.
- අයවැය ප්‍රතිපත්ති පැහැදිලි කරමින් ප්‍රසාරණාත්මක හා සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විමසා බලයි.
- ආදායමට අනුව වියදම සකස්කර ගැනීමේ වැදගත් කම පිළිබඳව අදහස් දක්වයි.
- ආර්ථිකයක් සඳහා වඩාත් යෝග්‍ය අයවැය ප්‍රතිපත්ති යෝජනා කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පහත සඳහන් පුවත්පත් සිරස්තලය පන්තියට ඉදිරිපත් කරන්න.

## "රජයේ අයවැය හෙට පාර්ලිමේන්තුවට"

- එම සිරස්තලය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අයවැය මගින් ඉදිරි වර්ෂය සඳහා රජයේ අපේක්ෂිත ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන බව.
  - විවිධ ක්‍රම මඟින් ලැබෙන ආදායම් මගින් රජයේ වියදම් පියවා ගන්නා බව.
  - වියදම් පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවුහොත් ඒ සඳහා රජයට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදුවන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ රටවල් තුනක ඉදිරි වර්ෂයට අපේක්ෂිත රජයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ය. එයින් ඔබ කණ්ඩායමට ලැබී ඇති තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන්න.

"ඒ" රට

| **ආදායම්** | රු.ද.ල |
|---|---|
| ආදයම් බදු | 20 |
| භාණ්ඩ හා සේවා බදු | 70 |
| අන්තර් ජාතික වෙළෙඳාම මත බදු | 10 |
| බදු නොවන ආදායම් | 50 |
| **වියදම්** | |
| වැටුප් හා වේතන | 70 |
| පොලී ගෙවීම් | 10 |
| සහනාධාර හා සංක්‍රාම | 18 |
| අනෙකුත් භාණ්ඩ හා සේවා | 12 |
| ප්‍රාග්ධන වියදම් | 35 |
| වෙනත් වියදම් | 05 |

"බී" රට

| **ආදායම්** | රු.ද.ල |
|---|---|
| ආදායම් බදු | 30 |
| භාණ්ඩ හා සේවා බදු | 70 |
| අන්තර් ජාතික වෙළෙඳාම මත බදු | 100 |
| බදු නොවන ආදායම් | 100 |
| **වියදම්** | |
| වැටුප් හා වේතන | 100 |
| පොලී ගෙවීම් | 50 |
| සහනාධාර හා සංක්‍රාම | 80 |
| අනෙකුත් භාණ්ඩ හා සේවා | 70 |
| ප්‍රාග්ධන වියදම් | 100 |
| වෙනත් වියදම් | 20 |

"සී" රට

| ආදායම් | රු.දි.ල |
|---|---|
| ආදායම් බදු | 80 |
| භාණ්ඩ හා සේවා බදු | 85 |
| අන්තර් ජාතික වෙළෙඳාම මත බදු | 135 |
| බදු නොවන ආදායම් | 100 |
| **වියදම්** | |
| වැටුප් හා වේතන | 100 |
| පොලී ගෙවීම් | 30 |
| සහනාධාර හා සංක්‍රාම | 70 |
| අනෙකුත් භාණ්ඩ හා සේවා | 50 |
| ප්‍රාග්ධන වියදම් | 70 |
| වෙනත් වියදම් | 60 |

- ඔබ කණ්ඩායමට ලැබී ඇති රටට අදාළ ව සපයා ඇති ආදායම් සහ වියදම් හොඳින් අධ්‍යයනය කරන්න.
- ඔබ දන්නා ආකෘතියක් යොදාගෙන ආදායම් සහ වියදම් ගලපමින් එයින් ලැබෙන අවසාන ප්‍රතිඵලය ලබාගන්න.
- ඉහත ආදායම් සහ වියදම් ගැළපීමට අනුව ඉදිරි වර්ෂයට රට තුළ පවතින තත්ත්වය කෙබඳුවිය හැකි දැයි පැහැදිලි කරන්න.
- එම තත්ත්වයට මුහුණදීමට අදාළ රටේ රජයට ඔබ යෝජනා කරන ක්‍රියාමාර්ග පෙන්වන්න.
- එම ක්‍රියාමාර්ග රටේ ආර්ථිකයට බලපාන ආකාරය කණ්ඩායම් සාකච්ඡාවක් මගින් මතු කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පංතියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ඉදිරි වර්ෂය තුළ රජයේ කටයුතු සඳහා දැරීමට අපේක්ෂිත වියදමත් එකී වියදම පියවා ගැනීම සඳහා මුදල් සපයා ගන්නා මාර්ගත් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කර සම්මත කරගන්නා වාර්තාව රාජ්‍ය අයවැය ලේඛනය බව
- පෞද්ගලික අයවැය ලේඛනය සහ රාජ්‍ය අයවැය ලේඛනය අතර වෙනසක් පවතින බව
- රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් ගැළපීමෙන් සමස්ත අයවැය ශේෂය ලබා ගන්නා බව
- සමස්ත අයවැය ශේෂයේ ස්වභාවය මත හිඟ අයවැය, අතිරික්ත අයවැය හා තුළිත අයවැය ලෙසින් වර්ගීකරණය කළ හැකි බව
- අයවැය හිඟයක් පැවතුනහොත් එය මූල්‍යණය කිරීමට සිදුවන බව
  (මහබැංකු වාර්තාව ඇසුරෙන් අයවැය ලේඛනය සැකසෙන ආකාරය සිසුන්ට ඉදිරිපත් කරන්න.)
- මූල්‍යණය සඳහා ප්‍රසාරණාත්මක හා සංකෝචනාත්මක අයවැය, ප්‍රතිපත්ති යොදා ගන්නා බව
- අයවැය ලේඛනයේ හිඟය පියවා ගැනීම සඳහා ලබා ගන්නා ණය රටේ මුදල් සැපයුම ඉහළ නැංවීමට හේතු වේ නම් එකී ණය ප්‍රසාරණාත්මක ණය ලෙස හැඳින්වෙන බව
- ණය මාර්ගවලින් මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ නම් එකී ණය සංකෝචනාත්මක ණය ලෙසින් ද හඳුන්වන බව
- ප්‍රසාරණාත්මක ණය සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව
  - රජය මහ බැංකුවෙන් ණය ලබා ගැනීම
  - වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීම
  - විදේශ ණය ලබා ගැනීම
- සංකෝචනාත්මක ණය සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව
  - බැංකු නොවන ආයතනවලින් ණය ලබා ගැනීම
  - මහජනතාවගෙන් රජය ණය මුදල් ලබා ගැනීම
- සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්ති හෝ ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්ති අනුගමනය කිරීම් ආර්ථිකයට හිතකර හෝ අහිතකර ද යන්න තීරණය වන්නේ අදාළ රටේ පවතින සාර්ව ආර්ථික වටපිටාව අනුව බව.

**නිපුණතා මට්ටම 9.8** : ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හා එහි ආර්ථික ප්‍රතිවිපාක විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය තත්ත්වය සංඛ්‍යාත්මක තොරතුරු අසුරෙන් පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ අයවැය හිඟයට හේතු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ අයවැය හිඟයෙහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- අයවැය හිඟය පියවීමේ මූලාශ්‍ර විමසා බලයි.
- අයවැය හිඟය පියවා ගැනීමට වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

(ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය තත්ත්වය පිළිබඳ කාලීන තොරතුරු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.)

- මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ අයවැය හිඟයට විවිධ හේතු සාධක බලපෑ බව.

  නිදසුන් :

  - විවිධ බදු සහන ලබා දීම හේතුවෙන් බදු ආදායම අඩු වීම
  - ණය ආපසු ගෙවීමේ වියදම් ඉහළ යාම
  - පොලී ගෙවීම ඉහළ යාම
  - රජයේ සංක්‍රාම වියදම ඉහළ යාම
  - රාජ්‍ය සේවා වියදම ඉහළ යාම

- ශ්‍රී ලංකාවේ අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කොට ඇති බව.

  නිදසුන් :

  - විදේශීය මූල්‍යණය
    - විදේශීය ණය
    - විදේශීය ප්‍රදාන
  - දේශීය මූල්‍යණය
    - වෙළෙඳපොළ ණය ගැනීම
      - බැංකු නොවන ණය
      - බැංකු (මූල්‍ය අධිකාරිය, වානිජ බැංකු)
    - අනෙකුත් ණය ගැනීම්

(ශ්‍රී ලංකාවේ අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා ගෙනඇති විවිධ ක්‍රියාමාර්ග පිළිබඳ කාලීන තොරතුරු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.)

- අයවැය හිඟයක් දිගින් දිගටම පැවතීමෙන් ආර්ථිකයට අහිතකර ප්‍රතිවිපාක ඇති වන බව.

  නිදසුන් :

  - රාජ්‍ය ණය ඉහළ යාම
  - උද්ධමනය ඉහළ යාම
  - පෞද්ගලික අංශයේ ආයෝජන අඩු වීම
  - පොලී අනුපාතිකය ඉහළ යාම
  - අන්තර්ජාතික විශ්වාසනීයතාව අඩු වීම
  - විදේශ විනිමය අනුපාතිකය පිරිහීම
  - දේශීය ඉතුරුම් අඩු වීම

- අයවැය හිඟය අඩු කර ගැනීමෙන් ආර්ථිකයට නොයෙකුත් වාසි අත් වන බව.
- වර්තන ගිණුමේ හිඟයක් පැවතීමෙන් අර්ථිකයට අහිතකර ප්‍රතිවිපාකත් වර්තන ගිණුමේ අතිරික්තයක් පැවතීමෙන් හිතකර ප්‍රතිවිපාකත් ඇති වන බව.
- වර්තන ගිණුමේ අතිරික්තයක් පැවතීමෙන් ඇතිවන හිතකර ප්‍රතිවිපාක වලට නිදසුන් පහත දැක්වෙන බව.

  - රාජ්‍ය ණය බර අඩු කර ගත හැකි වීම
  - උද්ධමනාත්මක ප්‍රතිවිපාක අඩු වීම
  - රාජ්‍ය ආයෝජන වැඩ කළ හැකි වීම
  - පොලී අනුපාතිකය පහළ මට්ටමක පවත්වා ගත හැකි වීම
  - පෞද්ගලික ආයෝජන වැඩි කර ගත හැකි වීම
  - ජනතාව වෙත පැවරෙන බදු බර අඩු කර ගත හැකි වීම
  - සාර්ව ආර්ථික ස්ථායිකරණයට මඟ පෑදීම

- ආර්ථිකයේ අවධමනාත්මක තත්ත්වයක් පවතින අවස්ථාවක දී අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා ප්‍රසාරණාත්මක නොවන මාර්ග අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය බව.

**නිපුණතා මට්ටම 9.9** : ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සංයුතිය හා එහි ප්‍රවණතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රාජ්‍ය ණය අර්ථ දක්වමින් රාජ්‍ය ණය මූලාශ්‍ර ගැලීම් සටහන් මගින් ඉදිරිපත් කරයි.
- රාජ්‍ය ණය බරෙහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- රාජ්‍ය ණය සේවා කරන ගෙවීම් විස්තර කරයි .
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි මෑතකාලීන උපනතීන් පරීක්ෂා කර බලයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- පොලිය ද සමග ආපසු ගෙවීමේ පොරොන්දුව මත රජය ලබා ගන්නා මුදල් රාජ්‍ය ණය වශයෙන් හැඳින්වෙන බව.
- දේශීය මෙන්ම විදේශීය මූලාශ්‍ර වලින් රජය ණය ලබා ගන්නා බව.
- එය මූලාශ්‍ර ගැලීම් සටහනකින් පහත දැක්වෙන ආකාරයට ඉදිරිපත් කළ හැකි බව.




- මුදල් වෙළෙඳපොළෙන් ද ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් ද රජය ලබා ගන්නා ණය, වෙළඳපොළ ණය ලෙස හැඳින්වෙන බව.

- රාජ්‍ය ණය ඉහළ යාම නිසා නොයෙකුත් ආර්ථික ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවන බව.

  නිදසුන් :

  - රාජ්‍ය ආදායමෙන් විශාල කොටසක් ණයත් ණය පොලියත් ගෙවීමට යොමු වීම.
  - වෙනත් අවශ්‍යතා හා සංවර්ධන අරමුණු වියදම්වලට ඉතා සුළු මුදල් ප්‍රමාණයක් ඉතිරි වීම.
  - දේශීය වෙළඳපලේ පොලී අනුපාතික ඉහළ යාම.
  - දේශීය මුදල් ඒකකයේ බාහිර අගය පිරිහීම.
  - පෞද්ගලික අංශය සඳහා පවතින සම්පත් ප්‍රමාණය අඩු වීම නිසා පෞද්ගලික ආයෝජන අඩු වී ආර්ථික වර්ධනයට අහිතකර බලපෑම් ඇති වීම
  - රාජ්‍ය මූල්‍ය කළමණාකරණය හා රාජ්‍ය ණය කළමණාකරණය වඩාත් දුෂ්කර වීම
  - බැංකු ක්‍රමයෙන් ණය ගැනීමට සිදු වීමෙන් උද්ධමනය ඇති වීම
  - සමස්ත වියදම වැඩිවීමෙන් ගෙවුම් ශේෂ ප්‍රශ්න මතු වීම
  - අන්තර්ජාතික ණය අර්බුදයකට මුහුණ දීමට සිදුවීම
  - දේශීය ඉතුරුම් අනුපාතිකය පහත වැටීම
  - දේශීය උද්ධමනය හේතුවෙන් මූර්ත විනිමය අනුපාතිකය පහළ යන විට අන්තර් ජාතික තරගකාරීත්වයට හානි පැමිණිම

- රජය ලබා ගෙන ඇති මුළු ණය වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරික ඊට අදාළ පොලියත් සමග ආපසු ගෙවීම ණය සේවාකරණ ගෙවීම් යනුවෙන් හැඳින්වෙන බව.
- රජය ලබා ගෙන ඇති මුළු ණය වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරික සහ ඒ සඳහා ගෙවිය යුතු පොලිය යන කරුණු දෙක දේශීය නිෂ්පාදිකයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම ණය සේවා අනුපාතිකය ලෙස හැඳින්වෙන බව.

$$\text{රාජ්‍ය ණය සේවා අනුපාතිකය} = \frac{\text{ණය වාරික} + \text{ණය පොලී}}{\text{දළ දේශීය නිෂ්පාදිතය}}$$

- ණය වාරික හා ණය පොලිය යන දෙක අපනයන ආදායම, රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම යනාදියේ අනුපාත ලෙස ද ප්‍රකාශ කරමින් විවිධ ආකාරයේ ණය සේවා අනුපාතික ගණනය කළ හැකි බව.
- ණය සේවා දර්ශක ලෙසින් දැක්වෙන්නේ ද විවිධාකාරයෙන් ගණනය කෙරෙන ණය සේවා අනුපාතිකයන් බව.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි මෑතකාලීන උපනතීන් වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය අඛණ්ඩ ලෙස පහළ යාම
  - සමස්ත රජයේ ණය වලින් වැඩි ප්‍රමාණයක් දේශීය ණය වීම
  - පරිණත කාලය අනුව මැදි හා දිගුකලින ණය කෙටිකාලීන ණය වලට වඩා වැඩි අගයක් වීම
  - ආයතන අනුව ගත් විට බැංකු ක්ෂේත්‍රයට වඩා බැංකු නොවන ක්ෂේත්‍රයෙන් ලබා ගත් ණය ප්‍රමාණය වැඩි අගයක් වීම
  - දේශීය නොපිය වූ රාජ්‍ය ණයෙහි ප්‍රධානතම උපකරණය භාණ්ඩාගාර බැඳුම් කර වීම
  - විදේශීය ණය තුළ සහනදායි ණය වැඩි වැදගත්කමක් ගැනීම
  - දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්වල අඩුවීමක් දක්නට ලැබීම
- රාජ්‍ය ණය මනා කළමණාකරණයකින් යුතුව යොදා ගැනීම වැදගත් වන බව.

**නිපුණතා මට්ටම 9.10** : රාජ්‍ය සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විශ්ලේෂණාත්මකව සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය අර්ථකතනය කරයි.
- විවිධ සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පැහැදිලි කරමින් ඒවාට නිදසුන් ඉදිරිපත් කරයි.
- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා පහසුකම් සැපයීම සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය ලෙස හැඳින්වෙන බව.
- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට ආයෝජන වැඩිවීම සහ නිෂ්පාදන පිරිවැය අඩු වී නිෂ්පාදන සාධකවල ඵලදායිතාවයද වැඩි වන බව.
- මේ ලෙසින් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය අපේක්ෂිත මට්ටම කරා ගෙන ඒමට සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය මගින් කටයුතු කෙරෙන බව.
- නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා විවිධ සැපයුම් ප්‍රවර්ධනය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යොදා ගත හැකි බව සහ එම ක්‍රියා මාර්ග පහත ආකාරයේ ඒවා වන බව.
  - බදු ප්‍රතිසංස්කරණය
  - පෞද්ගලීකරණය
  - නියාමනහරණය
  - ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය
  - ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය
- නිෂ්පාදනය ඉහළ නැංවෙන ආකාරයට බදු ක්‍රමයෙහි වෙනස්කම් ඇතිකිරීම බදු ප්‍රතිසංස්කරණ යන්නෙන් අදහස් වන බව.
- වෙළෙඳපොළ තරගකාරි ක්‍රියාකාරිත්වයට බදු අය කිරීම මගින් යම් යම් බලපෑම් සිදු වන බව.
- එනම් බදු හේතුවෙන් නිෂ්පාදනයේත්, පරිභෝජනයේත්, ආයෝජනයේත්, ඉතිරි කිරීම්වලත් ප්‍රශස්ත මට්ටම් ගිලිහී යන බව.
- මේ නිසා වෙළෙඳපොළ තරගකාරි ක්‍රියාකාරිත්වයට බදු අය කිරීම මගින් සිදු වන බලපෑම අවම වන ආකාරයෙන් බදු අය කිරීමේ දී සානුබල සැපයීම කළ යුතු බව.
  නිදසුන් :- බදු සමා ලබා දීම, බදු කපා හැරීම සහ බදු අඩු කිරීම ආදී

- මෙවැනි සානුබලයන් ලබා දීම මගින් නිෂ්පාදන පිරිවැය අඩුවීමෙන් නිෂ්පාදනය ඉහළ යන බව.
- බදු මගින් සානුබල සැපයීම ආර්ථිකයට හිතකර මෙන්ම අහිතකර ලෙස බලපෑ හැකි බව. නිදසුන් :-
    - බදු අඩු කිරීම නිසා රජයේ ආදායම අඩු වීම, ආදායම් ව්‍යාප්ති විෂමතාවය වැඩිවීම සහ පාරිභෝගිකයින් අනවශ්‍ය භාණ්ඩ පරිභෝජනයට නැඹුරු වීම ආදිය බදු ප්‍රතිසංස්කරණයක අහිතකර ආර්ථික ප්‍රතිවිපාක ලෙස දැක්විය හැකි බව.
    - නිෂ්පාදන වැඩි වීම සහ පරිභෝජනයේ, ආයෝජනයේ සහ ඉතිරි කිරීම්වලින් ප්‍රශස්ත මට්ටම් බදු මගින් සානුබල සැපයීම නිසා බොහෝ දුරට ආරක්ෂා වීම බදු ප්‍රතිසංස්කරණ මගින් සිදු වන යහපත් ප්‍රතිවිපාක වන බව.
- මේ සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් වශයෙන් බදු ප්‍රතිසංස්කරණ යොදා ගැනීමේ දී එමගින් ආර්ථිකයට ඇති වන අහිතකර ප්‍රතිවිපාක හැකි තරම් දුරට අවම වන ආකාරයට එය සිදු කිරීම වඩා වැදගත් වන බව.
- රජයේ හිමිකාරිත්වය යටතේ පැවැති ව්‍යාපාර කාර්ය සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීම පෞද්ගලීකරණය යන්නෙන් අදහස් වන බව.
- පහත පරිදි ආකාර කිහිපයකින් පෞද්ගලීකරණය සිදු විය හැකි බව.
    - රාජ්‍ය ව්‍යවසායවල සම්පූර්ණ අයිතිය හෝ අයිතියෙන් කොටසක් පෞද්ගලික අංශයට විකිණීම හෝ පැවරීම
    - රාජ්‍ය ව්‍යවසායවල කළමණාකරණය පෞද්ගලික අංශයට පැවරීම
    - රාජ්‍ය අංශයට අයත් ඇතැම් සේවා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම
- පෞද්ගලීකරණය නිසා ආර්ථිකයට හිතකර මෙන්ම අහිතකර ආකාරයේ ප්‍රතිවිපාක අත් විය හැකි බව.
- හිතකර ප්‍රතිවිපාක වලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
    - වඩාත් ඵලදායි ලෙස නිෂ්පාදන සම්පත් නිෂ්පාදන කටයුතුවලට යොමුවීමෙන් නිෂ්පාදනය කාර්යක්ෂම වීම
    - රාජ්‍ය ඒකාධිකාරය අහෝසි වී තරගකාරි වෙළෙඳපොළක් බිහි වීම
    - රාජ්‍ය අයවැයට බරක් නොවීම
    - ව්‍යාපාරවලට කෙරෙන දේශපාලන බලපෑම් ඉවත් වීම
    - ප්‍රාග්ධන හිඟයට පිළියම් ලැබීම
    - නිෂ්පාදිතවල ගුණාත්මකතාවය ඉහළයාම

- නිෂ්පාදන පිරිවැය අඩුවීම
- නාස්තිය, දූෂණය හා වංචා වැළකී යාම
- පාරිභෝගික අවශ්‍යතාවලට ඉක්මණින් ප්‍රතිචාර ලැබීම

- ආර්ථිකයක තරගකාරිත්වය අඩු වීමට බලපාන නීතියෙන් පනවන ලද හා සමාජීය ලෙස ඇති ව තිබෙන රෙගුලාසි හා බාධා ඉවත් කිරීම නියාමනහරණය (රෙගුලාසිහරණය) ලෙස හැඳින්වෙන බව.

  නිදසුන් :-
  - ව්‍යාපාරයක් ආරම්භ කිරීම සම්බන්ධව පවතින දැඩි නීති රීති ලිහිල් කිරීම (ව්‍යාපාරයක් ස්ථානගත කිරීම ආරම්භක ප්‍රාග්ධනය අවසර ලබා ගැනීමට ආදීය සම්බන්ධයෙන්)
  - නිදහස් වෙළෙඳමට බාධා වන ආකාරයේ රජයේ දැඩි අධීක්ෂණය අඩු කිරීම
  - සාමාජීය සාධකවල බලපෑම නිසා භාණ්ඩවල ගනුදෙනු පිරිවැය වැඩි වීම (මාළු අලෙවි කිරීමේ දී නිෂ්පාදකයා තීරණය කරනු මිලට වඩා වැඩි මිලකට ඒවා අලෙවි කිරීමට ඇතැම් පුද්ගලයින් නියෝග කිරීම හා එම වැඩි කරන ලද මිල නිෂ්පාදකයාට නොදී ඔවුන් විසින් ලබා ගැනීම) වළක්වාලීමට කටයුතු කිරීම

- නියාමනහරණය තුළින් වෙළෙඳපළ තරගකාරීත්වයට ඇතිවන බාධා ඉවත් වීම නිෂ්පාදකයින්ට ශක්තියක් වන අතර ඒ නිසා නිෂ්පාදන පිරිවැය අඩු වී නිෂ්පාදන සාධක ඵලදායිත්වය වැඩි වීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීමට රුකුලක් වන බව.
- නියාමනහරණය නිෂ්පාදන පිරිවැය අඩු වී, අයෝජනය වැඩි වී, නිෂ්පාදනය ඉහළ නැංවීමට හිතකර ලෙස බලපෑ හැකි වුවත් මුළුමනින් ම නියාමනහරණය කිරීම ආර්ථිකයට අහිතකර ලෙස බලපෑම් ඇති කළ හැකි බව.

  නිදසුන් :-
  - පාරිභෝජනයට අහිතකර භාණ්ඩ හා සේවා වෙළෙඳපෙළ තුළට ඇතුළත් වීම
  - ගුණාත්වයෙන් අඩු භාණ්ඩ නිපදවිය හැකි වීම. විදේශ වෙළෙඳම සම්බන්ධයෙන් ගත් විට ආනයනික භාණ්ඩ ආර්ථිකයට අනවශ්‍ය හෝ අහිතකර ඒවා විය හැකිවීම

- ආර්ථිකයට ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම වන ආකාරයට කිසියම් සීමාවකට යටත් ව නියාමනහරණයෙහි යෙදිය යුතු බව.
- ශ්‍රම වෙළෙඳපෙළ පවතින දෘඩතාවයන් ඉවත් වන ආකාරයෙන් ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම් සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීම ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ලෙසින් දැක්විය හැකි බව.
  - ශ්‍රම වෙළෙඳපොළේ තරගකාරිත්වයට බාධා එල්ල නොවන ආකාරයට කටයුතු කිරීම යන්නෙන් අදහස් වන්නේ ද ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය බව.

  නිදසුන් :
  - පීඩාකාරී කම්කරු නීති ඉවත් කිරීම

- සේවකයින් බඳවා ගැනීමේ දී ඇතැම් වෘත්තීන් සම්බන්ධයෙන් හැකියාවක් නොමැති අය එම වෘත්තීන්ට බඳවා නොගැනීමට කටයුතු කිරීම
- ඒ ඒ වෘත්තීන්ට අදාළ පුහුණුවීම් ආදිය පිළිබඳ ශ්‍රමිකයින් දැනුවත් කිරීම

- ඉල්ලුම හා සැපයුම සම්බන්ධයෙන් කරන ප්‍රතිසංස්කරණයන් නිසා තරගකාරි ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය වන බව.
- ඒ නිසා ආර්ථිකයේ නිෂ්පාදනය ඉහළ නංවා ගත හැකි බව.
- එහෙත් මෙවැනි ප්‍රතිසංස්කරණයන් කිරීමේ දී ද එය කිසියම් සීමාවකට යටත්ව සිදු කළ යුතු බව ඒ පිළිබඳ අවධානය යොමු නොකළහොත් ආර්ථිකයට අහිතකර ප්‍රතිවිපාකයන් ද ඇති විය හැකි බව.

  නිදසුන් :

  - පෞද්ගලික ව්‍යාපාරවල සේවා නියුක්ත කිරීමේ නිදහස එම ව්‍යාපාරවලටම ලබා දුනහොත් වැඩ අඩු කාලවල ශ්‍රමිකයින් සේවයෙන් ඉවත් කිරීමෙන් ශ්‍රමිකයින්ට කිසියම් අසාධාරණයක් සිදු වීම

- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් ලෙස ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ද යොදා ගත යුත්තේ අහිතකර ප්‍රතිවිපාක අවම වන ආකාරයට බව.
- නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා බාධාවක්ව පවතින ප්‍රාග්ධන හිඟය විසඳා ගත හැකි ආකාරයට කටයුතු කිරීම ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස සැලකිය හැකි බව.

  නිදසුන් :-

  - ප්‍රාග්ධනයේ ඵලදායිතාවය නැංවීම
  - ඍජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
  - සහනදායි කොන්දේසි මත විදේශ ණය ලබා ගැනීම
  - ඉතිරි කිරීම් වැඩි කිරීමට කටයුතු කිරීම

- මෙවැනි ප්‍රතිසංස්කරණයන් නිසා ආයෝජනය වැඩි වී නිෂ්පාදනය ඉහළ යාම හිතකර තත්ත්වයක් වන බව.
- අහිතකර තත්ත්වයන් ද මේ තුළින් ඇති විය හැකි බව.

නිදසුන් :-

- විදේශ ආයෝජන වැඩි කිරීම තුළින් ලාභ සහ ලාභාංශ විදේශ රටවලට ඇදී යාම විදේශ ණය ලබා ගැනීම නිසා ණය වාරික හා පොලී වෙනුවෙන් විශාල ප්‍රමාණයක වැය කිරීමට සිදු වීම
- රජය වර්තන වියදම් අඩු කළොත් එය වර්තමාන සමාජ ශුභ සාධනයට අහිතකර විය හැකි වීම
- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් ලෙස ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ යොදා ගැනීමේ දී ද එහි අහිතකර බලපෑම් ඉවත් වන ආකාරයට එය කළ යුතු බව.

**නිපුණතාව 10** : විදේශ වෙළෙඳාම හා මූල්‍ය, රටක සමස්ත ආර්ථිකයට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම 10.1** : අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

**ඉගෙනුම් ඵල** :

- අන්තර්ජාතික වෙළෙඳාම අර්ථ දක්වයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ නිරපේක්ෂ හා සාපේක්ෂ වාසි න්‍යායන් අර්ථ දක්වයි.
- දෙනලද සංඛ්‍යා දත්ත භාවිතයෙන් යම් භාණ්ඩයකට අදාළ ව නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය ඇති රට තෝරයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධවීම තුළින් රටවලට අත්වන වාසි ලැයිස්තුගත කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- ජපානය ශ්‍රී ලංකාවෙන් ඇඟලුම් මිල දී ගැනීමට සහ ශ්‍රී ලංකාව ජපානයෙන් මෝටර් රථ මිල දී ගැනීමට හේතු සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ජපානය මෝටර් රථ නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වඩා වැඩි කාර්යක්ෂමතාවක් උසුලන අතර ඇඟලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු කාර්යක්ෂමතාවක් උසුලන බව.
    - ශ්‍රී ලංකාව ඇඟලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් වැඩි කාර්යක්ෂමතාවක් උසුලන අතර මෝටර් රථ නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු කාර්යක්ෂමතාවක් උසුලන බව.
    - මෙම නිසා ශ්‍රී ලංකාව ඇඟලුම් වැඩි වශයෙන් නිෂ්පාදනය කර ජපානයට අලෙවිකර ජපානයෙන් මෝටර් රථ මිල දී ගන්නා බව.
    - ජපානය මෝටර් රථ වැඩි වශයෙන් නිෂ්පාදනය කර ශ්‍රී ලංකාවට අලෙවි කොට ශ්‍රී ලංකාවෙන් ඇඟලුම් මිල දී ගන්නා බව.
    - මේ ආකාරයට රට රටවල් අතර අන්තර්ජාතික වෙළෙඳාම සිදුවන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් රටවල් හතරක නිෂ්පාදන තොරතුරු ඇතුළත් වගු දෙකක් අතරින් ඔබට ලැබී ඇති වගුව කෙරෙහි අවධානය යොමු කරන්න.

  - වගුව 1

| නිෂ්පාදනය | ශ්‍රී ලංකාව | ඇමරිකාව |
|---|---|---|
| ඇඟලුම් (ඒකක/ මිනිස් පැයකට) | 12 | 02 |
| තිරිඟු පිටි (කිලෝ ග්‍රෑම්/ මිනිස් පැයකට) | 08 | 10 |

(රටවල් දෙකෙහි ම සමාන ශ්‍රම පිරිවැයක් පවතින බව උපකල්පනය කෙරේ.)

  - වගුව 2

| නිෂ්පාදනය | ජපානය | ශ්‍රී ලංකාව |
|---|---|---|
| මෝටර් රථ (ඒකක/ මිනිස් පැයකට) | 06 | 01 |
| පාවහන් (ඒකක/ මිනිස් පැයකට) | 04 | 02 |

(රටවල් දෙකෙහි ම සමාන ශ්‍රම පිරිවැයක් පවතින බව උපකල්පනය කෙරේ.)

- ඔබට ලැබී ඇති වගුවෙහි සඳහන් රටවල් දෙකේ භාණ්ඩ වර්ග දෙකෙහි නිෂ්පාදනයට අදාළ තොරතුරු සැලකිල්ලෙන් යුතු ව අධ්‍යයනය කරන්න.
- එම තොරතුරු ඇසුරින් රටවල් දෙකට අදාළ ව වැඩි කාර්යක්ෂමතාවකින් හා අඩු කාර්යක්ෂමතාවකින් නිපදවිය හැකි භාණ්ඩ වර්ගය හඳුනාගන්න.
- ඉහත භාණ්ඩ දෙකෙහි කාර්යක්ෂමතාව පදනම් කරගෙන අනෙක් රටක් සමඟ අන්තර්ජාතික වෙළෙඳාමෙහි යෙදීමට අපේක්ෂා කරන්නේ නම්, කුමන භාණ්ඩය වැඩියෙන් නිපදවා අපනයනය කරන්නේ ද? කුමන භාණ්ඩය ආනයනය කරන්නේ ද? යන්න පැහැදිලි කරන්න.
- රටවල් දෙකෙහි එක් එක් භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැයවන ආවස්ථික පිරිවැය ගණනය කරන්න.
- ඔබ ගණනය කරන ලද ආවස්ථික පිරිවැය ඇසුරින් රටවල් දෙකට කුමන භාණ්ඩය වැඩිපුර නිෂ්පාදනය කිරීම වාසිදායක වන්නේ ද? කුමන භාණ්ඩය ආනයනය කිරීම වාසි දායක වන්නේ ද? යන්න පැහැදිලි කරන්න.
- මෙලෙස රටවල් දෙක අතර අපනයන සහ ආනයන වෙළෙඳාමක් සිදුවූවොත් රටවල් අත්කර ගන්නා වාසි ලැයිස්තු ගත කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ලෝකයේ එක් රටක් ලෝකයේ තවත් රටවල් සමග භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම අන්තර්ජාතික වෙළෙඳාම හෙවත් විදේශ වෙළෙඳාම ලෙස හැඳින්වෙන බව.
- රටවල් විදේශ වෙළෙඳාමට සම්බන්ධ වීමට විවිධ හේතු සාධක බලපාන බව.
- අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ ව ඉදිරිපත් වී ඇති විවිධ න්‍යායන් තුළින් එම හේතු සාධක පිළිබඳ ව විග්‍රහ කරන බව.
- අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ ව විග්‍රහ කෙරෙන න්‍යායන්වලට නිදසුන් ලෙස නිරපේක්ෂ වාසි න්‍යාය සහ සාපේක්ෂ වාසි න්‍යාය දැක්විය හැකි බව.
- නිරපේක්ෂ වාසි න්‍යාය නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය මත පදනම් වන බව.
- නිරපේක්ෂ වාසි න්‍යාය ලොවට හඳුන්වා දුන් ආර්ථික විද්‍යාඥ "ඇඩම් ස්මිත්"ට (1776) අනුව එය පහත පරිදි නිර්වචනය කර ඇති බව .
  "යම් රටක සිය වෙළෙඳ සහකරු නිපදවනවාට වඩා අඩු සම්පත් පිරිවැයක් යටතේ යම් භාණ්ඩයක් නිපදවිය හැකි නම් එම භාණ්ඩය නිපදවා නිර්යාත කිරීමෙන් හා එසේ නොවන භාණ්ඩ ආයාත කිරීමෙන් වාසි ලබා ගත හැකි ය."
- නිරපේක්ෂ වාසි න්‍යාය පහත නිදසුන් ඇසුරෙන් පැහැදිලි කළ හැකි බව.

| නිෂ්පාදනය | ශ්‍රී ලංකාව | ඇමරිකාව |
|---|---|---|
| ඇඟලුම් (ඒකක/ මිනිස් පැයකට) | 12 | 02 |
| තිරිඟු පිටි (කිලෝ/ මිනිස් පැයකට) | 08 | 10 |

- ඉහත නිදසුනට අනුව ඇමරිකාවට වඩා අඩු සම්පත් පිරිවැයකින් ඇඟලුම් නිෂ්පාදන කිරීමට ශ්‍රී ලංකාවට හැකිවන නිසා ඇඟලුම් නිෂ්පාදන සම්බන්ධ ව නිරපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට අත්වන අතර නිරපේක්ෂ අවාසිය ඇමරිකාවට ඇති බව.
- ශ්‍රී ලංකාවට වඩා අඩු සම්පත් පිරිවැයකින් තිරිඟු පිටි නිෂ්පාදනය කිරීමට ඇමරිකාවට හැකිවන නිසා තිරිඟු පිටි නිෂ්පාදනය සම්බන්ධ ව නිරපේක්ෂ වාසිය ඇමරිකාවට අත්වන අතර ශ්‍රී ලංකාවට නිරපේක්ෂ අවාසිය අත්වන බව.
- මෙම නිසා ශ්‍රී ලංකාවට නිරපේක්ෂ වාසිය ඇති ඇඟලුම් වැඩි වශයෙන් නිපදවා අතිරික්තය ඇමරිකාවට අලෙවි කර නිරපේක්ෂ අවාසිය ඇති තිරිඟු පිටි ඇමරිකාවෙන් මිල දී ගැනීමෙන් වාසි ලබාගත හැකි බව.
- ඇමරිකාවට නිරපේක්ෂ වාසිය ඇති තිරිඟු පිටි වැඩි වශයෙන් නිපදවා අතිරික්තය ලංකාවට අලෙවිකර නිරපේක්ෂ අවාසිය ඇති ඇඟලුම් ලංකාවෙන් මිල දී ගත හැකි බව.

- මේ ආකාරයට නිරපේක්ෂ වාසිය පදනම් ව ලංකාව හා ඇමරිකාව අතර අන්තර්ජාතික වෙළෙඳාමක් සිදුවිය හැකි බව.
- නිරපේක්ෂ වාසි න්‍යායේ පවතින දුර්වලතා පෙන්වා දෙමින් ආර්ථික විද්‍යාඥ "ඩේවිඩ් රිකාඩෝ" (1817) දී සාපේක්ෂ වාසි න්‍යාය ලොවට හඳුන්වා දුන් බව.
- එය පහත පරිදි නිර්වචනය කර ඇති බව.
  "යම් රටක් සිය වෙළෙඳ සහකරු නිපදවනවාට වඩා වැඩි සම්පත් පිරිවැයක් දරා යම් භාණ්ඩයක් නිපදවන්නේ වී නමුත්, වෙළෙඳ සහකරු නිපදවනවාට අඩු ආවස්ථික පිරිවැයක් දරා නිපදවිය හැකි නම් එම භාණ්ඩය නිපදවා නිර්යාත කිරීමෙන් වාසි ලබා ගත හැකි ය."
- ඉහත නිර්වචනයට අනුව ලෝකයේ රටවල් දෙකක් අතරින් එක රටකට අනෙක් රටට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් යම් භාණ්ඩයක් නිපදවිය හැකි නම් එම රටට අදාළ භාණ්ඩය නිපදවීම සම්බන්ධ ව සාපේක්ෂ වාසියක් පවතී යන්න පැහැදිලි කෙරෙන බව.
- සාපේක්ෂ වාසි න්‍යාය පහත නිදසුන් ඇසුරෙන් පැහැදිලි කළ හැකි බව.

| **නිෂ්පාදනය** | **ජපානය** | **ඉන්දියාව** |
|---|---|---|
| මෝටර් රථ (ඒකක/ මිනිස් පැයකට) | 10 | 03 |
| ගුවන් විදුලි යන්ත්‍ර (ඒකක/ මිනිස් පැයකට) | 05 | 02 |

| **රට** | මෝටර් රථ (ඒකක/ මිනිස් පැයකට) | ගුවන් විදුලි යන්ත්‍ර (ඒකක/ මිනිස් පැයකට) | මෝටර් රථ ඒකකයක ආවස්ථික පිරිවැය | ගුවන් විදුලි යන්ත්‍ර ඒකකයක ආවස්ථික පිරිවැය |
|---|---|---|---|---|
| ජපානය | 10 | 05 | 0.5 | 02 |
| ඉන්දියාව | 03 | 02 | 0.66 | 1.5 |

- ඉහත නිදසුනට අනුව ජපානය ඉන්දියාවට වඩා අඩු ආවස්ථික පිරිවැයක් යටතේ මෝටර් රථ නිපදවීමත්, ඉන්දියාව ජපානයට වඩා අඩු ආවස්ථික පිරිවැයක් යටතේ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමත් කළ හැකි බව.
- ඒ අනුව ජපානයට මෝටර් රථ නිපදවීමේ සාපේක්ෂ වාසි ඇති අතර ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමේ සාපේක්ෂ වාසි ඇත්තේ ඉන්දියාවට බව.
- දෙරට වෙළෙඳාමේ යෙදෙනවිට ජපානය මෝටර් රථ නිෂ්පාදනයේ විශේෂීකරණයටත් ඉන්දියාව ගුවන්විදුලි යන්ත්‍ර නිෂ්පාදනයේ විශේෂීකරණයටත් යොමුවීම හේතුවෙන් බිහිවන අතිරික්ත නිෂ්පාදනය හුවමාරු කර ගැනීමෙන් දෙරටට ම වාසි අත් වන බව.
- අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වීම නිසා රටකට අත්වන වාසි පහත පරිදි ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැකි බව.
  - විශේෂීකරණයේ වාසි
  - හුවමාරුවේ වාසි
- රටක් අන්තර්ජාතික වෙළෙඳාමට යොමුකරන සාපේක්ෂ වාසි කොටස් දෙකකට බෙදා දැක්විය හැකි බව.
  - ස්ථිතික වාසිය
  - ගතික වාසිය
- නිෂ්පාදනය හා පරිභෝජනය මුල් කොටගෙන රටකට ස්වභාවිකව උරුමවී ඇති වාසිය ස්ථිතික වාසිය ලෙස හැඳින්වෙන අතර ඒවා හට ගැනීමට
  - සම්පත් සම්භාරය
  - රටවල් අතර අභිරුචීන්ගේ වෙනස්කම්
  - නිෂ්පාදනයේ පරිමාණානුකුල ඵල හේතු වන බව.
- තාක්ෂණික දියුණුව, භාණ්ඩ ප්‍රභේදනය, රාජ්‍ය ප්‍රතිපත්ති හා වෙළෙඳ ගිවිසුම් ආදි රටවල් නිර්මාණය කර ගනු ලබන තත්ත්වයන් නිසා හටගන්නා වාසි, ගතික වාසි ලෙස හැඳින්වෙන බව.
- ජාත්‍යන්තර වෙළෙඳාමේ සාපේක්ෂ වාසිය නිෂ්පාදන හැකියාව හා නිෂ්පාදන පිරිවැය යන දෙයාකාරයෙන්ම විග්‍රහ කළ හැකි බව.
- නිෂ්පාදන හැකියාව දක්වන සංඛ්‍යා ලේඛනයක නිමැවුම් ඒකක දැක්වෙන අතර නිෂ්පාදන පිරිවැය දැක්වෙන සංඛ්‍යා ලේඛනයක යෙදවුම් ඒකක දැක්වෙන බව.
- නිෂ්පාදන හැකියාව සහ නිෂ්පාදන පිරිවැය ආශ්‍රයෙන් ආවස්ථික පිරිවැය ගණනය කරන ආකාරය එකිනෙකට වෙනස් බව.

**නිපුණතා මට්ටම 10.2** : අන්තර්ජාතික වෙළෙඳාමේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- නිදහස් වෙළෙඳාම අර්ථ දක්වයි.
- ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවල ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- ආරක්ෂණවාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වී ඇති තර්ක විස්තර කරයි.
- ජාත්‍යන්තර වෙළෙඳාම නියාමනය කරන ආයතන හඳුන්වයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටවල් අතර භාණ්ඩ, සේවා හා සාධක නිදහසේ සංචලනයවීමට ඉඩහැරීම නිදහස් වෙළෙඳාම ලෙස දැක්විය හැකි බව.
- දේශීය වෙළෙඳපොළට විදේශීය භාණ්ඩ නිදහසේ ඇතුළුවීම සීමා කරන ඕනෑ ම ක්‍රියා පිළිවෙතක් ආරක්ෂණවාදය නම් වන අතර ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග පහත පරිදි කොටස් තුනකට වෙන් කළ හැකි බව.
  - තීරුබදු ක්‍රියාමාර්ග
  - තීරුබදු නොවන ක්‍රියාමාර්ග
  - වෙළෙඳ වර්ණ පිළිබඳ පොදු ක්‍රමය
- ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ලෙස තීරුබදු පහත පරිදි භාවිත කළ හැකි බව.
  - ආනයන තීරු බදු පැනවීම
  - අපනයන තීරු බදු පැනවීම
- තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග පහත පරිදි දැක්විය හැකි බව.
  - සලාක ක්‍රමය
  - විනිමය පාලනය
  - ආනයන තහනම් කිරීම
  - ආනයන අපනයන බලපත්‍ර ක්‍රම
  - වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
  - ප්‍රභවය පිළිබඳ නීති රීති
  - කාටල් පිහිටුවීම
  - කලාපීය ආර්ථික සහයෝගිතා
  - නිෂ්පාදන ප්‍රමිතීන් නිකුත් කිරීම
- ආරක්ෂණයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක පහත ආකාරයට වෙන්කොට දැක්විය හැකි බව.

| හිතකර ප්‍රතිවිපාක | අහිතකර ප්‍රතිවිපාක |
|---|---|
| 1. දේශීය ළදරු කර්මාන්ත විදේශ තරගයෙන් ආරක්ෂා වීම<br>2. ස්වයංපෝෂිතභාවය ගොඩනැගීම<br>3. සේවා වියුක්තිය වැළැක්වීම<br>4. ප්‍රපාතනය වැළැක්වීම<br>5. අහිතකර ගෙවුම් ශේෂ තත්ත්වයන් නිවැරදි කිරීම | 1. දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය<br>2. විදේශ වෙළෙඳාම සංකෝචනය වී ජාතික ආදායම අඩුවීම<br>3. දේශීය නිෂ්පාදනවල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති වීම නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහිවීම<br>4. ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ නිෂ්පාදනය අඩුවීම<br>5. දියුණු තාක්ෂණය සංක්‍රමණය නොවීම |

- ඉහත සඳහන් හිතකර හා අහිතකර ප්‍රතිවිපාක යටතේ පක්ෂ ව හා විපක්ෂ ව තර්ක ගොඩනැගී ඇති බව.
- ජාත්‍යන්තර වෙළෙඳාම නියාමනය කිරීමට ආයතන පවතින බව.
- ජාත්‍යන්තර වෙළෙඳාම නියාමනය කරන ප්‍රධාන ආයතනයක් ලෙස ලෝක වෙළෙඳ සංවිධානයේ හැඳින්විය හැකි බව.
- ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ලිහිල් කිරීම අරමුණු කරගෙන ලෝක වෙළෙඳ සංවිධානය බිහි වී ඇති බව.
- පහත සඳහන් පරමාර්ථ ඇතිව ලෝක වෙළෙඳ සංවිධානය පිහිටුවා ඇති බව.
  - නිදහස් වෙළෙඳාමට බාධාකාරී තීරුබදු පහත හෙළා ගෝලීය වෙළෙඳාම පුළුල් කිරීම
  - ජාත්‍යන්තර වෙළෙඳාමේ කෘෂිකර්මාන්තය වෙළෙඳාමට බලපාන ආයෝජනය හා බුද්ධිමය දේපල වැනි ක්ෂේත්‍රවලට නිදහස් වෙළෙඳාම ප්‍රචලිත කිරීම
  - වෙළෙඳාමට බලපාන තීරුබදු නොවන බාධක ලෙස සලකන ප්‍රපාතනය, අපනයන පංගු කිරීම සහ නිෂ්පාදන ප්‍රමිතීන් පැනවීම වැනි දේ ඉවත් කිරීම සඳහා යොමු වීම
  - වෙළෙඳාමේ අසමානතා ඉවත් කිරීම
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර සහයෝගීතාවය සමග සුහද ව ක්‍රියා කිරීම
- අතිරේක වෙළෙඳ වරණ පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යනු 2005 වසරේ දී හඳුන්වා දුන් යුරෝපා සංගමයට භාණ්ඩ අපනයනය කරන විට එය තීරුබදු රහිත ව සිදු කිරීමට ලබාදෙන තුන් අවුරුදු වැඩ පිළිවෙලක් බව.

**නිපුණතා මට්ටම 10.3** : ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමේ ව්‍යුහය හා උපනති විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාම හා ආනයන වෙළෙඳාම අර්ථකතනය කරයි.
- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහයේ හා ආනයන ව්‍යුහය සැකසී ඇති අයුරු විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහයේ හා ආනයන ව්‍යුහයේ උපනති පිළිබඳ සංසන්දනාත්මක විවරණයක යෙදෙයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පිවිසුම :**

- ශ්‍රී ලංකාව වැඩි විදේශ විනිමයක් උපයන භාණ්ඩ හා වැඩි විදේශ විනිමයක් වැය කර මිලදී ගන්නා භාණ්ඩ පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ශ්‍රී ලංකාව වැඩි විදේශ විනිමයක් රෙදිපිළි හා ඇඟලුම් විදේශ වෙළෙඳපොළට අලෙවි කිරීමෙන් උපයන බව.
    (2009 මහ බැංකු වාර්තාව අනුව)
  - ශ්‍රී ලංකාව වැඩි විදේශ විනිමයක් වැය කරන්නේ ඛනිජ තෙල් විදේශ වෙළෙඳපොළෙන් මිල දී ගැනීමට බව.
    (2009 මහ බැංකු වාර්තාව අනුව)
  - මේ ආකාරයට ශ්‍රී ලංකාව භාණ්ඩ හා සේවා රාශියක් අපනයන හා ආනයන කරන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - ආනයන වෙළෙඳාම
    - අපනයන වෙළෙඳාම
- ඔබට ලැබී ඇති මාතෘකාව හඳුනාගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මාතෘකාවට අදාළ සංරචක පෙළ ගස්වන්න.
- එම සංරචකවලට අදාළ සාපේක්ෂ දායකත්වය ප්‍රතිශතාත්මක ව පෙන්වන්න.
- කාලයක් තුළ අදාළ සංරචකවල දායකත්වය සහ ව්‍යුහයේ සිදු වී ඇති වෙනස්වීම් ඉදිරිපත් කරන්න.
- එම වෙනස්වීම්වලට බලපෑ කරුණු පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පංතියට ප්‍රස්තාර, ප්‍රතිශතක සහ වගු භාවිතයෙන් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- යම් රටක් ලෝකයේ වෙනත් රටවල්වලින් භාණ්ඩ හා සේවා මිල දී ගැනීම ආනයන වෙළෙඳාම බව.

  ***නිදසුන් :*** ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් මෝටර් රථ මිල දී ගැනීම
- කිසියම් රටක් ලෝකයේ වෙනත් රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළෙඳාම බව.

  ***නිදසුන් :*** ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදයට තේ අලෙවි කිරීම
- ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය පහත පරිදි දැක්විය හැකි බව.
    - පාරිභෝගික භාණ්ඩ
    - අන්තර් භාණ්ඩ
    - ආයෝජන භාණ්ඩ
    - වර්ග නොකළ ආනයන

    (2009 මහ බැංකු වාර්තාව අනුව)
- එම ආනයන ව්‍යුහය පහත පරිදි ප්‍රතිශතාත්මක ව දැක්විය හැකි බව.
    - පාරිභෝගික භාණ්ඩ - 19.3%
    - අන්තර් භාණ්ඩ - 55.55%
    - ආයෝජන භාණ්ඩ - 24%
    - වර්ග නොකළ ආනයන - 1.1%

    (2009 මහ බැංකු වාර්තාව අනුව)

- ආනයනය කරන පාරිභෝගික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි පෙන්විය හැකි බව.
    - සහල්, සීනි, තිරිඟු, කිරිපිටි
    - පෞද්ගලික මෝටර් රථ
    - විදුලි උපකරණ
- ආනයනය කරන අන්තර් භාණ්ඩවලට නිදසුන් පහත පරිදි පෙන්විය හැකි බව.
    - ඛනිජ තෙල්
    - පොහොර
    - රසායනික ද්‍රව්‍ය
    - රෙදිපිළි හා ඇඟලුම්
- ආනයනය කරන ආයෝජන භාණ්ඩවලට නිදසුන් පහත පරිදි පෙන්විය හැකි බව.
    - යන්ත්‍ර සූත්‍ර හා උපකරණ
    - ප්‍රවාහන උපකරණ
    - ගොඩනැගිලි ද්‍රව්‍ය
- 1977 සිට 2009 ආනයන ව්‍යුහය දක්වා කාලීන වශයෙන් වෙනස් වී ඇති ආකාරය පහත පරිදි පෙන්විය හැකි බව.

| **ආනයන ව්‍යුහය** | **1977** | **2009** |
|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 42% | 19% |
| අන්තර් භාණ්ඩ | 45% | 56% |
| ආයෝජන භාණ්ඩ | 12% | 24% |
| වෙනත් | 1% | 1% |

| **අන්තර් භාණ්ඩ** | **1977** | **2009** |
|---|---|---|
| බොරතෙල් | 23% | 10% |
| අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදන | 2% | 12% |
| රෙදිපිළි | 3% | 14% |
| පොහොර | 1% | 2% |
| කඩදාසි | 1% | 2% |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 15% | 16% |

(ඉහත තොරතුරු 2009 මහ බැංකු වාර්තාව අනුව ඉදිරිපත් කර ඇති අතර, ආසන්න වර්ෂයක මහ බැංකු වාර්තාව පරිශීලනය කරමින් ඉහත පරිදි අවශ්‍ය තොරතුරු සිසුන්ට ලබා දෙන්න.)

- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත ලෙස දැක්විය හැකි බව.
    - කෘෂිකාර්මික අපනයන
    - කාර්මික අපනයන
    - ඛනිජ ද්‍රව්‍ය අපනයන
    - වර්ග නොකළ අපනයන

    (2009 මහ බැංකු වාර්තාවට අනුව)
- එම අපනයන ව්‍යුහයන් පහත පරිදි ප්‍රතිශතාත්මක ව දැක්විය හැකි බව.
    - කෘෂිකාර්මික අපනයන 23.9%
    - කාර්මික අපනයන 74.9%
    - ඛනිජ ද්‍රව්‍ය අපනයන 1.3%

    (2009 මහ බැංකු වාර්තාව අනුව)
- අපනයන කරන කෘෂිකාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි පෙන්විය හැකි බව.
    - තේ, රබර්, පොල්, අනෙකුත් කෘෂිකාර්මික අපනයන
- අපනයන කරන කාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි පෙන්විය හැකි බව.
    - ආහාර පාන වර්ග හා දුම්කොළ
    - රෙදිපිළි හා ඇඟලුම්
    - ඛනිජ නිෂ්පාදිත
    - රබර් නිෂ්පාදිත
    - පිඟන් නිෂ්පාදිත
    - සම්, ගමන් මලු හා පාවහන්
    - යන්ත්‍ර සූත්‍ර හා උපකරණ
    - දියමන්ති හා ස්වර්ණාභරණ
    - අනෙකුත් කාර්මික අපනයන
- අපනයන කරන ඛනිජ අපනයනවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව
    - මැණික්
    - අනෙකුත් ආයෝජන භාණ්ඩ අපනයන
- 1977 සිට 2009 දක්වා අපනයන ව්‍යුහය කාලීන වශයෙන් වෙනස් වී ඇති ආකාරය පහත පරිදි පෙන්විය හැකි බව

| **අපනයන ව්‍යුහය** | **1977** | **2009** |
|---|---|---|
| කෘෂිකාර්මික භාණ්ඩ | 79% | 24% |
| කාර්මික භාණ්ඩ | 14% | 75% |
| වෙනත් | 7% | 1% |

- කාර්මික භාණ්ඩ අපනයනය විස්තරාත්මක ව දැක්වෙන බව

| කාර්මික භාණ්ඩ | 1977 | 2009 |
|---|---|---|
| රෙදිපිළි හා ඇගළුම් | 2% | 46% |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 9% | 2% |
| අනෙකුත් කාර්මික භාණ්ඩ | 3% | 6% |
| ආහාරපාන හා දුම්කොල | - | 6% |
| දියමන්ති හා ස්වර්ණාභරණ | - | 5% |
| රබර් නිෂ්පාදන | - | 5% |

- ඉහත සඳහන් උපනතිවලට බල පෑ හේතුවලට නිදසුන් පහත සඳහන් බව
  - අපනයන බෝගවල මිල උච්චාවචනය
  - අපනයන පරිමාව අඩුවීම
  - ලෝක වෙළෙඳපොළ තුළ පැවති දැඩි අවිනිශ්චිතතාව
  - අපනයන දිරිමත් කිරීමට රජය විසින් ගත් නොයෙක් ක්‍රියාමාර්ග
  - ස්වභාවික නිෂ්පාදන නිසා ගෝලීය ඉල්ලුම වර්ධනය වීම
  - ශ්‍රී ලංකාවේ ඇඟලුම් උසස් තත්ත්වයේ පිහිටීම හා ඒ පිළිබඳ ජාත්‍යන්තර විශ්වාසය දිනා ගැනීම
  - ගෝලීය ආර්ථික අවපාතය

**නිපුණතා මට්ටම 10.4** : වෙළෙඳ අනුපාතය ඇසුරින් විදේශ වෙළෙඳාමේ ආර්ථික ප්‍රතිවිපාක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- වෙළෙඳ අනුපාතය යන්න අර්ථ දක්වයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතය නම් කර ගණනය කර පෙන්වයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතයෙහි ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- ආදායම් වෙළෙඳ අනුපාතය නම් කර ගණනය කර පෙන්වයි.
- ආදායම් වෙළෙඳ අනුපාතයෙහි ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- ආසන්න මහ බැංකු වාර්තා ඇසුරෙන් ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළෙඳ අනුපාතයත් ආදායම් වෙළෙඳ අනුපාතයත් පිළිබඳ මෑතකාලීන තොරතුරු ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- අපනයන භාණ්ඩ ඒකකයකින් ගත හැකි ආනයන භාණ්ඩ ප්‍රමාණය වෙළෙඳ අනුපාතය බව.
- වෙළෙඳ අනුපාත වර්ග ප්‍රධාන කොටස් දෙකක් බව.
  - භාණ්ඩ වෙළෙඳ අනුපාතය
  - ආදායම් වෙළෙඳ අනුපාතය
- අපනයනවල ආනයන හැකියාව හෙවත් ක්‍රය ශක්තිය මැනීමට සකසනු ලැබූ දර්ශකය භාණ්ඩ වෙළෙඳ අනුපාතය බව.
- අපනයන මිල දර්ශකය ආනයන මිල දර්ශකයෙන් බෙදා එය සියයෙන් ගුණ කිරීමෙන් භාණ්ඩ වෙළෙඳ අනුපාතය ගණනය කළ හැකි බව.
- වෙළෙඳ අනුපාතය වර්ධනය වනවිට ආර්ථික සංවර්ධනයට හිතකර වන බව.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතය පිරිහීම සංවර්ධනයට අහිතකර වන බව.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතයෙන් රටක ආනයන ක්‍රය ශක්තිය මැනවින් පිළිඹිබු නොවන බව.
- අපනයන ආදායමෙහි ආනයන ක්‍රය ශක්තිය මැනීම සඳහා පිළියෙල කරන දර්ශකය ආදායම් වෙළෙඳ අනුපාතය බව.
- රටක භාණ්ඩ වෙළෙඳ අනුපාතය එහි අපනයන පරිමා දර්ශකයෙන් ගුණකළ විට ආදායම් වෙළෙඳ අනුපාතය ගණනය කළ හැකි බව.

$$I = \frac{P_x}{P_m} \ X \ Q_x$$

$I$ = ආදායම් වෙළෙඳ අනුපාතය

$P_x$ = අපනයන මිල දර්ශකය

$P_m$ = ආනයන මිල දර්ශකය

$Q_x$ = අපනයන පරිමා දර්ශකය

- ප්‍රාග්ධන භාණ්ඩ ආනයන කිරීමේ හැකියාව බොහෝදුරට රඳා පවතින්නේ ආදායම් වෙළෙඳ අනුපාතය මතය එම නිසා දියුණු වෙමින් පවතින රටවල අවශ්‍යයෙන් ම ආදායම් වෙළෙඳ අනුපාතය ඉහළ යා යුතු බව.

**නිපුණතා මට්ටම 10.5** : ගෙවුම් ශේෂ ලේඛනයක අන්තර්ගතය විශ්ලේෂණය කරමින් එහි ආකෘතියක් පිළියෙල කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ගෙවුම් ශේෂ සංකල්පය අර්ථ දක්වයි.
- ගෙවුම් ශේෂ ලේඛනයේ සංරචක නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- කල්පිත දත්ත ඇතුළත් කරමින් ගෙවුම් ශේෂ ලේඛනයක් පිළියෙල කරයි.
- ගෙවුම් ශේෂ ලේඛනයක ඇතුළත් සංරචකයන් හි අන්තර් බලපෑම විග්‍රහ කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පිවිසුම :**

- නිවසට ආදායම් ලැබෙන මාර්ග හා එම ආදායම් වැයකරන ආකාරය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - නිවසට පහත සඳහන් ආකාරයේ මාර්ගවලින් ආදායම් ලැබෙන බව.
    - නිවෙස් හිමියන්ගේ වැටුප්
    - ඉඩකඩම්වලින් ලැබෙන ආදායම්
    - බැංකුවල තැන්පතුවලින් ලැබෙන පොලිය
    - රැකියාවට අමතර ව කරන විවිධ ව්‍යාපාර කටයුතුවලින් ලැබෙන ආදායම
  - නිවසට ලැබෙන ආදායම පහත පරිදි විවිධ භාණ්ඩ හා සේවා පරිහරණයට වැය කරන බව.
    - ආහාර සහ ඇඳුම් පැළඳුම් මිල දී ගැනීමට
    - අධ්‍යාපන කටයුතුවලට
    - ගමන් බිමන් යාමට
    - විදුලි බිල්පත්, ජල බිල්පත්, හා දුරකථන බිල් යනාදිය ගෙවීමට
  - නිවසට ලැබෙන ආදායම් හා වැයකරන වියදම් සැසඳීමෙන් අවසානයේ ඉතිරියක් ද හිඟයක් ද යන්න සොයා ගත හැකි බව.
  - මේ ආකාරයට රටක් විදේශ ගනුදෙනුවලින් ලැබෙන ආදායම් සහ වියදම් ගිණුම්කරන පටිපාටියට අනුව වාර්තා කර අවසාන ප්‍රතිඵලය සොයාගත හැකි බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක් වේ. ඒ අතුරින් ඔබේ කණ්ඩායමට ලැබෙන තොරතුරු කාණ්ඩය කෙරෙහි අවධානය යොමු කරන්න.

**"ඒ" කාණ්ඩය**

| **අයිතමය** | **වටිනාකම (රු. දසලක්ෂ)** |
|---|---|
| ආහාර හා පාන වර්ග ආනයනය | 200 |
| තේ අපනයනය | 100 |
| රෙදිපිළි සහ ඇඟළුම් අපනයනය | 500 |
| රෙදිපිළි ආනයනය | 300 |
| පොහොර ආනයනය | 400 |
| මැණික් හා ස්වර්ණාභරණ අපනයන | 50 |
| බොරතෙල් ආනයනය | 200 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය | 50 |
| රබර් අපනයනය | 100 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනය | 100 |
| පොල් අපනයනය | 50 |

**"බී" කාණ්ඩය**

| **අයිතමය** | **වටිනාකම (රු. දසලක්ෂ)** |
|---|---|
| ගුවන් සේවාවලින් ලැබූ ආදායම | 500 |
| විදේශ නාවික යාත්‍රාවලට සේවය ලබා දීම | 300 |
| ශ්‍රී ලංකාවේ වෙනත් වරාය පහසුකම් ලබා දීම | 200 |
| ජාත්‍යන්තර සන්නිවේදන පද්ධතිවල සේවය ලබා ගැනීම | 1000 |
| විදේශ හෝටල් හා ආපනශාලා පහසුකම් ලබා ගැනීම | 100 |
| ශ්‍රී ලංකාවෙන් හෝටල් හා ආපනශාලා පහසුකම් ලබා දීම | 100 |

## "සී" කාණ්ඩය

| අයිතමය | වටිනාකම (රු. දස ලක්ෂ) |
|---|---|
| ශ්‍රී ලංකාව විදේශයන් ට ගෙවූ පොලී ආදායම | 600 |
| මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික කාන්තාවක් තම දරුවනට එවන ලද වැටුප | 500 |
| ශ්‍රී ලාංකිකයෙක් විදේශ ව්‍යාපාරයක මුදල් ආයෝජනය | 1300 |
| සුනාමි ව්‍යවසනය නිසා අප රටට ලැබුණු පරිත්‍යාග | 100 |
| විදේශිකයින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කොටස් මිල දී ගැනීම | 200 |
| උතුරු නැගෙනහිර සංවර්ධනයට විදෙශ ආධාර ලැබීම | 300 |
| විදේශ රටක ජීවත්වන අනේවාසිකයන්ට යවන මුදල් පරිත්‍යාග | 100 |
| ශ්‍රී ලංකාවෙන් වෙනත් රටකට කරනු ලබන පරිත්‍යාග | 300 |

- ඔබට ලැබී ඇති තොරතුරු කාණ්ඩයෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබෙන ගණුදෙනු ලැයිස්තු ගත කර මුළු විදේශ විනිමය ලැබීම් ගණනය කරන්න.
- ශ්‍රී ලංකාවට විදේශ විනිමය වැයවන ගණුදෙනු ලැයිස්තුවක් සකස් කර මුළු විදේශ විනිමය ගෙවීම් ගණනය කරන්න.
- ඉහත ගණනය කළ විදේශ විනිමය ලැබීම් හා ගෙවීම් සසඳමින් අවසාන ශේෂය ගණනය කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පංතියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

### විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- ලෝකයේ එක් රටක් ලෝකයේ සෙසු රටවල් සමග කරනු ලබන සියලුම ගණුදෙනු ලැබීම් සහ ගෙවීම් ලෙස සටහන් කරනු ලබන ලේඛනය ගෙවුම් ශේෂ ලේඛනය බව.
- මෙය ද්විත්ව සටහන් (ශේෂ පත්‍රයක ආකෘතිය ගන්නා නිසා) ලෙස ගිණුම් තැබීම නිසා ගෙවුම් තුලන ලේඛනය වශයෙන්ද හඳුන්වන බව.
- ගෙවුම් ශේෂ ලේඛනය ප්‍රධාන ගිණුම් දෙකකින් සමන්විත වන බව.
  - ජංගම ගිණුම
  - ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම
- ජංගම ගිණුම නැවත ප්‍රධාන ගිණුම් හතරකට බෙදන බව.
  - වෙළෙඳ ගිණුම (භාණ්ඩ ගිණුම)
  - සේවා ගිණුම (සාධක නොවන සේවා ගිණුම)
  - ආදායම් ගිණුම (සාධක සේවා ගිණුම)
  - වර්තන සංක්‍රාම ගිණුම (නිල හා පෞද්ගලික සංක්‍රාම ගිණුම)
- ලෝකයේ එක් රටක් ලෝකයේ සෙසු රටවල් සමග සිදුකරන භාණ්ඩ අපනයන හා ආනයනය පිළිබඳව තොරතුරු සටහන් කරන ගිණුම වෙළෙඳ ගිණුම නැතහොත් දෘෂ්‍ය භාණ්ඩ ගිණුම යනුවෙන් හැඳින්වෙන බව.

- මෙම ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂය වශයෙන් හැඳින්වෙන අතර එය ධන හෝ ඍණ අගයක් ගන්නා බව.
- අන්තර්ජාතික වෙළෙඳාමේ දී එක් රටක් තවත් රටවල් සමග සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම සේවා ගිණුම වශයෙන් හැඳින්වෙන බව.
- මෙම ගිණුමේ ශේෂය ධන හෝ ඍණ අගයක් ගත හැකි බව.
- අන්තර්ජාතික වෙළෙඳාමේ දී සාධක ආදායම් ලැබීම් හා සාධක ආදායම් ගෙවීම් පිළිබඳ සටහන් තබන ගිණුම ආදායම් ගිණුම වශයෙන් හැඳින්වෙන බව.
- ගෘහසේවිකාවන් විදේශගත වී එවනු ලබන වැටුප් මෙම ගිණුමට ඇතුළත් නොවීම විශේෂ කාරණයක් බව.
- මෙම ගිණුමේ ලැබීම් හා ගෙවීම් අතර ශේෂය ධන හෝ ඍණ අගයක් ගත හැකි අතර එය විදේශ ශුද්ධ සාධක ආදායම ලෙස හැඳින්වෙන බව.
- ලෝකයේ රටවල් සමග සම්බන්ධකම් පවත්වනවිට එක් රටක් ලෝකයේ තවත් රටකට කරනු ලබන පරිත්‍යාග රජයකින් තවත් රජයකට වන්නේ නම් එය නිල සංක්‍රාම වශයෙන් හැඳින්වෙන බව.
- එමෙන් ම කිසියම් රටක පුරවැසියකු විදේශ ගත වූ විට තම නෑදෑ, හිත මිත්‍රාදීන්ට එවනු ලබන තමාගේ වැටුප පෞද්ගලික සංක්‍රාමයක් ලෙස සැලකිය හැකි බව.
- මේ අනුව ජංගම සංක්‍රාම, නිල සංක්‍රාම හා පෞද්ගලික සංක්‍රාම වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව.
- ඉහත ගිණුම් හතරේ එකතුව ජංගම ගිණුමේ ශේෂය බව.
- එය ධන හෝ ඍණ අගයක් ගත හැකි බව.
- ප්‍රාග්ධන ගිණුමේ සටහන් වන්නේ ප්‍රාග්ධන සංක්‍රාම බව.
- මූල්‍ය ගිණුම දිගුකාලීන හා කෙටිකාලීන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන බව.
- දිගුකාලීන මූල්‍ය ගිණුමට සෘජු ආයෝජන, පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) සහ රජයේ දිගුකාලීන (ශුද්ධ) අයත් වන බව.
- කෙටිකාලීන මූල්‍ය ගිණුමට පහත සඳහන් දෑ අයත් වන බව.
  - විවිධ ආයෝජන (ශුද්ධ)
  - පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ)
  - වාණිජ බැංකු වත්කම් (ශුද්ධ)
  - වාණිජ බැංකු වගකීම් (ශුද්ධ)
  - රජයේ කෙටිකාලීන (ශුද්ධ)
  - විශේෂ ගැණුම් හිමිකම්(වි.ගැ.හි. )
- අගය ගණනය කිරීමේ ගැළපීම වැරදි සහ අත්හැරීම් ගැළපූවිට ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය සකස් කර ගත හැකි බව.


ගෙවුම් ශේෂ ලේඛනය
ජංගම ගිණුම
ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම
භාණ්ඩ ගිණුම (වෙළෙඳ ගිණුම)
සේවා ගිණුම
ආදායම් ගිණුම
සංක්‍රාම ගිණුම
ප්‍රාග්ධන සංක්‍රාම
දිගු කාලීන
• සෘජු ආයෝජන
• පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ)
• රජයේ දිගුකාලීන (ශුද්ධ)
කෙටි කාලීන
• විවිධ ආයෝජන
• පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ)
• වාණිජ බැංකු වත්කම් (ශුද්ධ)
• වාණිජ බැංකු වගකීම් (ශුද්ධ)
• රජයේ කෙටිකාලීන (ශුද්ධ)
භාණ්ඩ අපනයන ලැබීම්
භාණ්ඩ ආනයන ගෙවීම්
ලැබීම්
ගෙවීම්
ලැබීම්
ගෙවීම්
නිල සංක්‍රාම (ශුද්ධ)
පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ)
වෙළෙඳ ශේෂය
+
සේවා ගිණුමේ ශේෂය
+
ආදායම් ගිණුමේ ශේෂය
+
සංක්‍රාම ගිණුමේ ශේෂය
ජංගම ගිණුමේ ශේෂය
+
ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම් ශේෂය
+
අගය ගණනය කිරීමේ ගැළපීම වැරදි සහ අත්හැරීම් විශේෂ ගැණුම් හිමිකම
සමස්ත ශේෂය

**නිපුණතා මට්ටම 10.6** : විදේශ ගණුදෙනු ආර්ථිකයට ඇති කරන බලපෑම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනය ඇසුරෙන් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- මහ බැංකු වාර්ෂික වාර්තාව තුළින් ගෙවුම් ශේෂයේ මෑතකාලීන උපනති පැහැදිලි කරයි.
- ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළෙඳ ශේෂය, ජංගම ගිණුමේ ශේෂය සහ සමස්ත ශේෂයේ උපනති විශ්ලේෂණය කරයි.
- එම ගිණුම්වල ධන ශේෂයන් අගය කරමින් ඍණ ශේෂයන් අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගෙවුම් ශේෂ ලේඛනයක සමස්ත ගිණුමේ ශේෂය අතිරික්තයක් හෝ හිඟයක් පැවතීම ගෙවුම් ශේෂ අසමතුලිතතාවයක් ලෙස හැඳින්වෙන බව.
- මහ බැංකු වාර්ෂික වාර්තාව තුළින් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ මෑතකාලීන උපනති පරීක්ෂා කළහැකි බව.
- ගෙවුම් ශේෂ අතිරික්තයක ආර්ථික ප්‍රතිවිපාක වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - විදේශ සංචිත ඉහළ යාම
  - ආනයන සඳහා විදේශ සංචිත ප්‍රමාණවත් කාලය දීර්ඝ වීම
  - මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑම් ඇතිවීම
  - උද්ධමනයකට ඉඩකඩ සැලසීම
  - විදේශ විනිමය අනුපාතිකය අධිතක්සේරු වීම
  - අපනයන තරගකාරීත්වය දුර්වලවීම
- ගෙවුම් ශේෂ හිඟයක ආර්ථික ප්‍රතිවිපාක නිදසුන් පහත දැක්වෙන බව.
  - විදේශ සංචිත පහළ යාම
  - මුදල් සැපයුමේ සංකෝචනාත්මක බලපෑම
  - විනිමය අනුපාතිකය ක්ෂය වීම
  - ආරක්ෂණවාදී ප්‍රතිපත්ති කරා යොමුවීම
  - විදේශ ණය ඉහළ යාම

- ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි බව.

  නිදසුන් ඃ

  - වර්තන ගිණුමේ හිඟය පියවා ගැනීමට ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ සම්පත් යොදා ගැනීම
  - සමස්ත ශේෂයේ හිඟය පියවා ගැනීම සඳහා දිගුකාලීන ක්‍රියාමාර්ග ගැනීම.
    - ආනයන ආදේශනය
    - අපනයන විවිධාංගීකරණය
    - විදේශ ආයෝජන ලබා ගැනීම
    - විනිමය අනුපාත අවප්‍රමාණය
    - සංරචක විනිමය අනුපාත ක්‍රමය

    (මහ බැංකු වාර්ෂික වාර්තා ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ කාලීන තොරතුරු සහ උපනති පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.)

**නිපුණතා මට්ටම 10.7** : විදේශ විනිමය අනුපාතිකය තීරණය වීම සහ එහි ප්‍රතිවිපාක විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- විදේශ විනිමය වෙළෙඳපොළ සහ විදේශ විනිමය අනුපාතිකය අර්ථ දක්වයි.
- විදේශ විනිමය අනුපාතික වර්ගීකරණය කරමින් ඒවා විග්‍රහ කරයි.
- විවිධ විනිමය අනුපාතික භාවිතය තුළින් ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරයි.
- විනිමය අනුපාතික උච්චාවචන රටක ගෙවුම් ශේෂය කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳුදැයි විමර්ශනය කරයි.
- රටක් තුළ මුදල අවප්‍රමාණය වීම සහ ප්‍රතිප්‍රමාණය වන ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- විනිමය අනුපාතිකය ක්ෂයවීම හා අගය වැඩිවීම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විවිධ රටවල මුදල් වර්ග හුවමාරු වන වෙළෙඳපොළ, විදේශ විනිමය වෙළෙඳපොළ බව.
- එක් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමග හුවමාරු වන අනුපාතය විනිමය අනුපාතය බව.
- ශ්‍රී ලංකාවේ එක් එක් කාලවකවානුවල පහත සඳහන් විවිධ විනිමය අනුපාතිකයන් භාවිත කර ඇති බව.
  - ස්ථාවර විනිමය අනුපාතිකය
  - පාවෙන විනිමය අනුපාතිකය
  - පාලිත නම්‍ය විනිමය අනුපාතිකය
- විනිමය අවප්‍රමාණයක් හා ප්‍රතිප්‍රමාණයක් සිදුවිය හැකි බව.
- විනිමය අවප්‍රමාණයක් යනු දේශීය ව්‍යාවහාර මුදල් ඒකකයේ බාහිර අගය හෙවත් විදේශ ව්‍යවහාර මුදල්වලින් කෙරෙන තක්සේරුව පහත වැටීම බව.
- ප්‍රතිප්‍රමාණය යනු අවප්‍රමාණයේ ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය බව.
- අව ප්‍රමාණය හා ප්‍රතිප්‍රමාණය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය තුළ සිදුවන බව.
- විනිමය අනුපාතික ක්ෂයවීම යනු, නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් යටතේ දේශීය මුදල් ඒකකයක් මිලට ගැනීම සඳහා ගෙවිය යුතු විදේශ මුදල් ඒකක ප්‍රමාණය අඩුවීමක් හෝ විදේශ මුදල් ඒකකයක් මිලට ගැනීම සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ප්‍රමාණය වැඩිවීමක් බව.

නිදසුන් ඃ

- ඇමරිකා ඩොලරයක ගැනුම් මිල ශ්‍රී ලංකා රුපියල් 100 සිට 150 දක්වා ඉහළ යාම හෝ ශ්‍රී ලංකා රුපියලක ගැනුම් මිල ඇමරිකා ඩොලර් 0.01 සිට 0.0067 දක්වා පහළ යාම
- විනිමය අනුපාතිකයේ අගය වැඩිවීම යනු, විනිමය අනුපාතිකය ක්ෂයවීමේ ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය බව.

නිදසුන් ඃ

- ඇමරිකා ඩොලරයක ගැනුම් මිල ශ්‍රී ලංකා රුපියල් 150 සිට 100 දක්වා පහළ යාම හෝ ශ්‍රී ලංකා රුපියලක ගැනුම් මිල ඇමරිකා ඩොලර් 0.0067 සිට 0.01 දක්වා ඉහළ යාම
- එක් එක් රටවල අභ්‍යන්තර උද්ධමන අනුපාතිකය විනිමය අනුපාතිකය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව.
- නාමික විනිමය අනුපාතිකය යනු, එක් එක් විදේශ මුදල් වර්ග සමග දේශීය ව්‍යවහාර මුදල් හුවමාරු අනුපාතය වෙන් වෙන් ව ප්‍රකාශ කර ඒ අනුව මුදලේ බාහිර අගය වෙනස්වීම මැන දැක්වීම බව.
- මූර්ත විනිමය අනුපාතිකය යනු, රටවල් දෙකක මිල මට්ටම් අතර වෙනස්කම් සඳහා ගළපන ලද නාමික විනිමය අනුපාතිකය බව.
- රටවල් අතර මුදල් ඒකක මත සිදු කරන වෙළෙඳාමේ සාපේක්ෂ ප්‍රමාණ අනුව බර තබා සැකසූ විනිමය අනුපාත නාමික සඵල විනිමය අනුපාතිකය බව.
- මූර්ත සඵල විනිමය අනුපාතිකය යනු එසේ බර තබා සකසන ලද විනිමය අනුපාතිකයෙන් උද්ධමනයේ බලපෑම ඉවත් කර සකසන ලද විනිමය අනුපාතිකය බව.
- මූර්ත විනිමය අනුපාතය ඉහළ යාමෙන් පෙන්වන්නේ ද විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමක් බව.
- පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව විනිමය අනුපාතිකයේ අගය අඩුවීමට ඉඩදීමෙන් වෙළෙඳ ශේෂය හා වර්තන ගිණුම යහපත් කර ගත හැකි බව.
  - අපනයන ඉල්ලුම නම්‍ය වීම
  - ආනයන ඉල්ලුම නම්‍ය වීම
  - දේශීය මිල මට්ටම් ස්ථාවරව තිබීම
  - අපනයන සැපයුම් නම්‍යතාව ඉහල මට්ටමක තිබීම

**නිපුණතා මට්ටම 10.8** : විදේශ ආයෝජන, රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- විදේශ ආයෝජන, අර්ථ දක්වමින් ඒවා වර්ගීකරණය කරයි.
- විදේශ ආයෝජනවල හිතකර සහ අහිතකර ආර්ථික බලපෑම් විස්තර කරයි.
- විදේශ ආයෝජන ඉහළ යාම විදේශ වත්කම් ඉහළ යාමට බලපාන ආකාරය ශ්‍රී ලංකාවේ දත්ත ඇසුරින් විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටක ආයතනයක් හෝ පුද්ගලයකු හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිල දී ගැනීම හෝ නව ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාරවල කොටස් වැඩි සංඛ්‍යාවක් මිල දී ගැනීම විදේශ ආයෝජන වශයෙන් හැඳින්වෙන බව.
- විදේශ ආයෝජන ප්‍රධාන තේමා දෙකක් යටතේ විස්තර කෙරෙන බව.
  - සෘජු ආයෝජන
  - කළඹ ආයෝජන
- කර්මාන්ත ශාලා, ඉඩම්, ප්‍රාග්ධන භාණ්ඩ සහ තොග යන ආදියේ සිදු කෙරෙන මූර්ත ආයෝජන සෘජු ආයෝජන බව.
- සෘජු ආයෝජනයේ දී විදේශ ප්‍රාග්ධනය, කළමනාකරණය සහ තාක්ෂණය ආයෝජනය කරන රටට ගලා එන බව.
- සෘජු විදේශ ආයෝජනවල දී ආයෝජිත ප්‍රාග්ධනයේ අයිතිය විදේශ ආයෝජකයින්ට හිමිවන බව.
- කළඹ ආයෝජන යනු විදේශිකයන්, දේශීය මුදලින් ප්‍රකාශිත මූල්‍ය වගකීම්වල මුදල් ආයෝජනය කිරීම බව.
- කොටස්, ණයකර, වාණිජ පත්‍රිකා, භාණ්ඩාගාර බිල්පත්, සුරැකුම්පත සහ භාණ්ඩාගාර බැඳුම්කර ආදිය කළඹ ආයෝජන සඳහා යොදා ගන්නා, මූල්‍ය වත්කම්වලට නිදසුන් බව.
- විදේශ ආයෝජනවල වාසි වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - විදේශ විනිමය රටට ගලා ඒම
  - ගෙවුම් ශේෂ හිඟයට පිළිතුරක් වීම
  - ණය බර ඉහළ නොයාම

- නව තාක්ෂණය රටට ගලා ඒම
- ප්‍රාග්ධනය රටට ගලා ඒම
- කළමනාකරණය රට තුළට ගලා ඒම

- විදේශ ආයෝජනවල අවාසි වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - ලාභාංශ හා පොලී විශාල වශයෙන් පිට රටට ඇදී යාම
  - දේශීය ආර්ථික කටයුතුවලට අයහපත් බලපෑම් එල්ලවීම
  - ප්‍රාග්ධන සූක්ෂම නිෂ්පාදන ශිල්පීය ක්‍රම භාවිතය නිසා රැකියා අවස්ථා අහිමි වීම
  - ස්වභාවික සම්පත් අධි පාරිභෝජනයට ලක්වීම
  - දේශිය කර්මාන්ත අඩපණ වීම
  - රජයට බදු ආදායම් නියම ලෙස නොලැබී යාම
  - දේශිය ආයෝජකයින් සඳහා ඇති මුදල් විදේශ ව්‍යාපාර වෙත ඇදී යාම
  - දක්ෂ සේවකයන් දේශීය ව්‍යාපාරවලින් විදේශ ව්‍යාපාර වෙත ඇදී යාම

  (මහ බැංකු වාර්ෂික වාර්තා ඇසුරෙන් ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනවල කාලීන තොරතුරු සහ උපනති පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.)

**නිපුණතා මට්ටම 10.9** : අන්තර්ජාතික ආර්ථික සහයෝගීතාවය සඳහා ක්‍රියාත්මක වන විවිධ ආර්ථික සංවිධානවල වැදගත්කම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික ඒකාබද්ධවීම්වල අරමුණු විග්‍රහ කරයි.
- ආර්ථික ඒකාබද්ධවීම්වල විවිධ අවස්ථා නිදසුන් සහිත ව විස්තර කරයි.
- විවිධ ආර්ථික ඒකාබද්ධවීම්වල පවතින සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාව සම්බන්ධ ව ඇති වෙළෙඳ ගිවිසුම් නිදසුන් සහිත ව පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- එකම ජාතියක විවිධ වූ කණ්ඩායම් අතර හෝ ජාතික කණ්ඩායම් අතර තීරු බදු හා තීරු බදු නොවන සාධකවලින් තොර ව භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ආර්ථික ඒකාබද්ධවීම් වන බව.
- ආර්ථික ඒකාබද්ධවීම්වල අරමුණු පහත සඳහන් පරිදි දැක්විය හැකි බව.
  - රටවල් අතර මිල විශේෂිතාව ඉවත් කොට ඒකීය මිලක් ඇති කිරීම
  - තරගකාරීත්වය වැඩි කිරීම තුළින් පාරිභෝගිකයාට අඩු මිලට භාණ්ඩ ලබා දීම
  - ලෝක වෙළෙඳාම පුළුල් කිරීම තුළින් රටවල දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම
  - කාර්යක්ෂම නිෂ්පාදන ව්‍යුහයක් ඇති කර ගැනීම තුළින් ඉහළ ආර්ථික ප්‍රතිලාභ ඉපයීම
  - ලෝකයේ ජාතීන්ගේ සුභසාධනය ඉහළ නැංවීම
  - බහු පාර්ශවීය වෙළෙඳ හවුල්කරුවන් සමග කේවල් කිරීම
  - ගෝලීයකරණ ක්‍රියාවලියේ දී ජාත්‍යන්තර තරගකාරීත්වය රැක ගැනීම
  - ජාතීන් අතර දේශපාලන සම්බන්ධතා වර්ධනය කිරීම
- ආර්ථික ඒකාබද්ධවීම්වල විවිධ අදියර පහත පරිදි වර්ග කළ හැකි බව.
  - වරණාත්මක වෙළෙඳ ගිවිසුම් (Perferential Trade Agreements - PTA)
  - නිදහස් වෙළෙඳ කලාප (Free Trade Area - FTA)
  - තිරුබදු සංගම් (Custom Unions - CU)
  - පොදු වෙළෙඳපොළ (Common Markets - CM)
  - ආර්ථික සහ මූල්‍ය සංගම් (Econmic Unions and Montery Unions - EU & MU)
  - පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම් (Fully Economic Intergration - FI)
- සාමාජික නොවන ජාතීන් අතර වෙළෙඳාමේ දි භාවිත කරන වෙළෙඳ සංරෝධකවලට අඩු සංරෝධක යටතේ සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමට රටවල් එකතු වී ඇති කර ගන්නා සංවිධාන වරණීය වෙළෙඳ කලාප ලෙස හැඳින්වෙන බව.

- වරණීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් පහත දැක්වෙන බව.
    - යුරෝපා ආර්ථික කලාපීය ගිවිසුම (European Econmic Area Agreement - EEA)
    - ඉන්දු ඇෆ්ගනිස්ථාන් වරණීය වෙළෙඳ ගිවිසුම (Preferential Trade Agreement between The republic of India and the Transitional Islamic State of Afghanistan)
    - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (North American Free Trade Agreement - NAFTA )
- සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග වෙළෙඳාමේ යෙදෙනවිට ඒ ඒ රටේ අභිමතය පරිදි වෙළෙඳ සංරෝධක පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වාගෙන යාමටත් රටවල් කීපයක් එක් වී ඇති කර ගන්නා සංවිධාන නිදහස් වෙළෙඳ කලාප ලෙස හැඳින්වෙන බව.
- නිදහස් වෙළෙඳ කලාපවලට නිදසුන් පහත දැක්වෙන බව.
    - අප්‍රිකානු නිදහස් වෙළෙඳ කලාපය (African Free Trade Zone - AFTZ)
    - ආසියානු පැසිපික් නිදහස් වෙළෙඳ කලාපය (Asian Free Trade Area - AFTA)
    - මධ්‍යම යුරෝපා නිදහස් වෙළෙඳ කලාපය (Central European Free Trade Agreement -CEFTA)
    - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ කලාපය (North American Free Trade Agreement - NAFTA)
- සාමාජික රටවල් අතර වෙළෙඳාම වෙළෙඳ සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාම හා සාමාජික රටවල් සහ සාමාජික නොවන බාහිර රටවල් සමග වෙළෙඳාමේ දී එක සමාන වෙළෙඳ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම සඳහාත් රටවල් කිහිපයක් ඒකාබද්ධ වී කටයුතු කිරීම, තීරුබදු සංගමයක් ලෙස සැලකෙන බව.
- තීරුබදු සංගම්වලට නිදසුන් පහත දැක්වෙන බව.
    - මධ්‍යම ඇමරිකානු පොදු වෙළෙඳ පොළ (Central American Common Market - CACM)
    - කැරිබියන් කොමියුනිටි (Caribbean Community - CAN)
    - උතුරු ඇමරිකානු කොමියුනිටි (North American Community)
- සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වාගෙන යාමටත්, සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග වෙළෙඳාම් කිරීමේ දී පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් සාමාජික රටවල් අතර නිෂ්පාදන සාධක නිදහසේ සංචලනය කිරීමටත් රටවල් ඒකාබද්ධ වීම පොදු වෙළෙඳපොළ ලෙස සලකන බව.

- පොදු වෙළෙඳපොළ සඳහා පහත සඳහන් නිදසුන් සැපයිය හැකි බව.
    - කැරිබියන් කොමියුනිටි පොදු වෙළෙඳපොළ (The Caribbean Community and Common Market - CARICOM)
    - මධ්‍යම ඇමරිකානු පොදු වෙළෙඳපොළ (Central American Common Market - CACM)
    - මධ්‍යම අප්‍රිකානු ආර්ථික සහ මූල්‍ය කොමියුනිටි (Central African Economic and Monetary Community - CEMAC)
- සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාමටත්, සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග භාණ්ඩ හා සේවා වෙළෙඳාම පොදු ප්‍රතිපත්තියක් යටතේ පවත්වාගෙන යාමටත්, සාමාජික රටවල් අතර ශ්‍රමය හා ප්‍රාග්ධනය නිදහසේ සංචලනය කිරීමටත්, සාමාජික රටවල් අතර එක හා සමාන මූල්‍ය ප්‍රතිපත්තියක් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ද ක්‍රියාත්මක කිරීමට රටවල් කීපයක් ඒකාබද්ධ වීම ආර්ථික හා මූල්‍ය සංගමයක් ලෙස හඳුන්වන බව.
- ආර්ථික හා මූල්‍ය සංගම්වලට නිදසුන් පහත දැක්වෙන බව.
    - මධ්‍යම අප්‍රිකානු ආර්ථික සහ මූල්‍ය සංගමය (Central African Economic and Monetary Community - CEMAC)
    - බටහිර අප්‍රිකානු ආර්ථික සහ මූල්‍ය සංගමය (Economic Community West African Staters - ECOWAS)
    - යුරෝපා මූල්‍ය සහ ආර්ථික සංගමය (Europen Economic and Monetary Union - EMU)
- සාමාජික රටවල් අතර සහ සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී සංරෝධකවලින් තොර ව කටයුතු කිරීමට සහ නිෂ්පාදන සාධක හුවමාරු කිරීමේ දී සංරෝධකවලින් තොර ව කටයුතු කිරීමටත් සාමාජික රටවල් අතර ඒකීය මූල්‍ය ප්‍රතිපත්තියක්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ සහ දේශපාලන ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමටත් රටවල් ඒකාබද්ධ වීම පූර්ණ ඒකාබද්ධවීම ලෙස සලකන බව.
- ආර්ථික ඒකාබද්ධවීමේ එක්තරා අදියරයක් ලෙස රටවල් වෙළෙඳ ගිවිසුම්වලට ඇතුළත් වන බව.
- වෙළෙඳ ගිවිසුම් වර්ග දෙකකට බෙදිය හැකි බව.
    - ද්වි පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්
    - බහු පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්

- රටවල් දෙකක් විසින් වෙළෙඳාම හා මූල්‍ය කටයුතු පිළිබඳ ඇති කර ගන්නා එකඟතා ගිවිසුම ද්විපාර්ශවීය වෙළෙඳ ගිවිසුමක් බව.
- ශ්‍රී ලංකාව ඇතුළත් වී ඇති ද්විපාර්ශවීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් පහත සඳහන් වන බව.
  - ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
  - පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
- ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සම්බන්ධ වී 1998.12.28 දින ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කළ අතර එය 2000.03.31 දින සිට ක්‍රියාත්මක වන බව.
- ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ අරමුණු පහත දැක්වෙන බව.
  - සහජීවන ආර්ථික රටාවක් පවත්වාගෙන යමින් දෙරට අතර ආර්ථික සහයෝගීතාවය වර්ධනය කිරීම
  - දෙරට අතර වෙළෙඳ කටයුතු දියුණු කිරීම පිණිස තරගකාරිත්වය අර්ථවත් කිරීම සඳහා සාධාරණ කොන්දේසි පැනවීම
  - වෙළෙඳ කටයුතුවල දී අන්‍යෝන්‍ය වගකීම ආරක්ෂා කර ගැනීම
  - කලාපයේ වෙළෙඳ කටයුතු සඳහා ඇති බාධා ඉවත් කිරීම මගින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම
- ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාසිවලට නිදසුන් පහත සඳහන් වන බව.
  - විශාල වෙළෙඳපොළක් හිමිවීම
  - ප්‍රවාහන පිරිවැය අඩුවීම
  - දේශීය වෙළෙඳපොළේ පාරිභෝගික භාණ්ඩ මිල අඩුවීම
  - නිදහස් වෙළෙඳාමේ වාසි ලබා ගත හැකි වීම
  - විදේශ ආයෝජන විශාල වශයෙන් ශ්‍රී ලංකාවට ගලා ඒම
  - විදේශ අභියෝගවලට ශක්තිමත් ලෙස මුහුණදීමට හැකි වීම
  - ඉන්දියාවේ නිෂ්පාදනය කෙරෙන නව කාර්මික භාණ්ඩ අඩුමිලට ගත හැකි වීම
- පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම 2002.08.01 දින අත්සන් තැබූ අතර 2005 පෙබරවාරි 09 වන දිනෙන් පසු ක්‍රියාත්මකවූ බව.
- පකිස්තානු ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුමේ අරමුණු පහත දැක්වෙන බව.
  - භාණ්ඩ වෙළෙඳාම පුළුල් කිරීමෙන් පකිස්ථානයත් ශ්‍රී ලංකාවත් අතර ආර්ථික සම්බන්ධතා වර්ධනය කිරීම
  - දෙරටේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
  - ද්විපාර්ශවීය වෙළෙඳාමත් ලෝක වෙළෙඳාමත් වර්ධනය කිරීම හා පුළුල් කිරීම

- පාකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට සැලසෙන වාසි වලට නිදසුන් පහත සඳහන් බව.
    - පාකිස්තානයෙන් ශ්‍රී ලංකාවට තීරුබදුවලින් තොර ව භාණ්ඩ ආනයනය කළ හැකි බැවින් ශ්‍රී ලංකාව තුළ ආනයන භාණ්ඩවල මිල ගණන් පහත වැටීම
    - ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ සඳහා වෙළෙඳපොළ පුළුල් වීම
    - අපනයන විවිධාංගීකරණයට අවස්ථාව සැලසීම
    - අමු ද්‍රව්‍ය අඩු මිලට ලබා ගත හැකි වීම
    - දේශීය ළදරු කර්මාන්ත ඉක්මනින් පරිණතභාවයට පත්කර ගත හැකි වීම
    - ආයෝජන හා සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා පුළුල් වීම

    සැලකිය හැකි බව
- බහු පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් කීපයක් පහත සඳහන් බව.
    - පොදු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය උදෙසා බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC)
    - දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)
    - ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම (APTA)
    - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)
- බෙංගාල දේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්තය, නේපාලය සහ භූතානය යන රටවල් පොදු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය උදෙසා බෙංගාල බොක්කේ රටවල මූලිකත්වයෙහි(Bay of Bengal Initiative for Mulit Sectoral Technical and Economic Cooperation -BIMSTEC) සමාජික රටවල් බව
- පොදු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය උදෙසා බෙංගාල බොක්කේ රටවල මූලිකත්වයෙ(BIMSTEC) හි වැඩි වැදගත්කමක් දිය යුතු අංශ ගණනාවක් හඳුනාගෙන තිබූ අතර එම අංශ පහත දැක්වෙන බව.
    - වෙළෙඳාම ආයෝජනය
    - තාක්ෂණය
    - ප්‍රවාහනය හා සන්නිවේදනය
    - බලශක්තිය
    - සංචාරක කර්මාන්තය
    - ජලජ සම්පත්

- 1985 වර්ෂයේ දී බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්තානය සහ ශ්‍රී ලංකාව යන රටවල් එක් වී දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය හෙවත් සාර්ක් සංවිධානය පිහිට වූ බව.
- සාර්ක් සංවිධානයට සම්බන්ධ රටවල් විසින් දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම (South Asian Preferential Trade Agreement - SAPTA) 1995 වර්ෂයේ දී ඇති කර ගත් බව.
- සාර්ක් සංවිධානයට අයත් රටවල් අතර ආර්ථික සහයෝගීතාව ඇති කර ගැනීමටත් වෙළෙඳාම දියුණු කිරීමටත් 2001 වර්ෂයේ දී දකුණු ආසියානු නිදහස් වෙළෙඳ සංගමය (South Asian Free Trade Association - SAFTA) පිහිට වූ බව.
- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ සංගමයේ අරමුණු පහත සඳහන් පරිදි වන බව.
    - වෙළෙඳ බාධක ඉවත් කිරීම හා දේශ සීමාව හරහා කෙරෙන වෙළෙඳ ගණුදෙනු සඳහා පහසුකම් සැපයීම
    - සාමාජික රටවල ආර්ථික මට්ටම් හා ඒවායේ ආර්ථික සංවර්ධන රටා සැලකිල්ලට ගනිමින් නිදහස් සාධාරණ වෙළෙඳාමක් ඇති කිරීම සහ වෙළෙඳාමේ වාසි සමාන ලෙස ඒ රටවල් අතර බෙදී යාමට සැලැස්වීම
    - ගිවිසුම ක්‍රියාත්මක කිරීම එහි කටයුතු ඇගයීම සහ ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් ඇති කිරීම
    - ගිවිසුමේ ප්‍රතිලාභ අනාගතයේ දී ව්‍යාප්ත කිරීමටත් වැඩි කිරීමටත් අවශ්‍ය කලාපීය සහයෝගීතා වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම
- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ සංගමයෙ ගිවිසුම ක්‍රියාත්මක වන්නේ පහත දැක්වෙන උපකරණ හය මත බව.
    - වෙළෙඳාම නිදහස් කිරීමේ වැඩසටහන
    - ප්‍රභවස්ථාන නීති
    - ආයතනික වැඩපිළිවෙල
    - උපදේශනය සහ ආරවුල් සමනය කිරීමේ යාන්ත්‍රණය
    - ආරක්ෂණ ක්‍රියා පිළිවෙත්
    - ගිවිසි වෙනත් උපකරණ
- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ සංගමය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළුවලට නිදසුන් පහත සඳහන් බව.
    - කලාපය තුළ දේශපාලන එකඟතාවය අඩුවීම
    - සාමාජික රටවල් බොහොමයක් සමාන භාණ්ඩ නිපදවීම

- පරිපාලන සහ දේශපාලන සංරෝධක
- කලාපීය රටවල් අතර ඉහළ තීරුබදු අනුපාතික පැවතීම

- ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ මෙක්සිකෝව යන රටවල් එක් වී උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (North American Free Trade Agreement - NAFTA) 1993 වර්ෂයේ දී අත්සන් කළ අතර 1994.01.01 දින සිට එය ක්‍රියාත්මක වූ බව
- උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමේ අරමුණු පහත දැක්වෙන බව.
  - තීරු බදු හා තීරු බදු නොවන සංරෝධක ඉවත් කිරීම
  - ගිවිසුමට සම්බන්ධ රටවල් අතර ආයෝජන සංචලනයට ඇති බාධක ඉවත් කිරීම
  - කලාපය තුළ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම
  - ගිවිසුමට සම්බන්ධ රටවල් අතර ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීම
- මුළු උතුරු ඇමරිකාව තුළ භාණ්ඩ සහ සේවා වෙළෙඳාම සම්පූර්ණයෙන් නිදහස් වීමට මෙම ගිවිසුම හේතු වූ අතර ඒ නිසා භාණ්ඩ මිල අඩුවීම හා ගිවිසුමට ඇතුළත් රටවල වෙළෙඳාම දෙගුණ වූ බව.
- ආසියා පැසිපික් කලාපයට අයත් රටවල් 18 ක් එක් වී ආසියා පැසිපික් ආර්ථික සහයෝගීතාව (Asia Pacific Economic Cooperation - APEC) 1993 වර්ෂයේ පටන් ආරම්භ කළ බව.
- ජපානය, චීනය, දකුණු කොරියාව, තායිලන්තය, ඉන්දුනීසියාව, පිලිපීනය, බෲනායි, පැපුවා නිව්ගිනි, චිලී, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, මෙක්සිකෝව සහ නවසීලන්තය යනා දී රටවල් ආසියා පැසිපික් ආර්ථික සහයෝගීතාව සංවිධානයේ සාමාජිකත්වය දරන බව.
- ආසියා පැසිපික් ආර්ථික සහයෝගීතාවයේ දෙවන සම්මේලනයේ දී එකඟ වූ පරිදි එහි ක්‍රියාකාරී සැලසුමේ මූලික අරමුණු පහත පරිදි බව.
  - පූර්ණ නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීම
  - රේගු කටයුතු විධිමත් කිරීම හා ලිහිල් කිරීම
  - පරිගණක තාක්ෂණය භාවිත කරමින් වෙළෙඳාම නිදහස් කිරීම
  - දිළිඳු ජනතාවගේ සුභසාධන කටයුතු ඉහළ මට්ටමකට ගෙන ඒම

**නිපුණතා මට්ටම 10.10** : අන්තර්ජාතික මූල්‍ය ආයතනවල කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

**ඉගෙනුම් ඵල** :

- අන්තර්ජාතික මූල්‍ය ආයතන නම් කරයි.
- අන්තර්ජාතික මූල්‍ය ආයතනවල කාර්යයන් විස්තර කරයි.
- අන්තර්ජාතික මූල්‍ය ආයතනවලින් ශ්‍රී ලංකාවට ලැබෙන සේවා ලැයිස්තුගත කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සාමාජික රටවල මූල්‍ය හිඟය පියවීම සඳහා කෙටිකාලීන ණය සැපයීම මූලික අරමුණ කොටගෙන 1947 ජනවාරි මාසයේ දී අන්තර්ජාතික මූල්‍ය අරමුදල (International Monetary Fund-IMF) පිහිට වූ බව.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි ප්‍රධාන කාර්යාලය ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් නගරයේ පිහිටවා ඇති අතර අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි ආරම්භක සාමාජික රටවල් 28 ක් ද වූ නමුත් වර්තමානයේ දී රටවල් 184 ක් එහි සාමාජිකත්වය දරන බව.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල සඳහා ප්‍රාග්ධනය සපයාගෙන ඇත්තේ සාමාජික රටවල් වෙත අරමුදල් පංගු නිකුත් කිරීම මගින් වන අතර අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි සාමාජිකත්වය ලබා ගැනීමට අරමුදල් පංගුවක් හෝ කීපයක් අදාළ රට විසින් සැපයිය යුතු බව.
- අදාළ සාමාජික රටට ලැබෙන අරමුදල් පංගු ප්‍රමාණය තීරණය වන්නේ ඒ රටේ ආර්ථික වැදගත්කම හා අන්තර්ජාතික වෙළෙඳාමට ඒ රට දායකවන ප්‍රමාණය මත බව.
- ඒ ඒ රටට හිමිවන අරමුදල් පංගු ප්‍රමාණය මත ඒ ඒ රටට හිමිවන ඡන්ද බලයත් ඒ ඒ රටට ලබා ගත හැකි ණය ප්‍රමාණයත් තීරණය වන බව.
- 1947 වර්ෂය අවසාන වනවිට අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි ප්‍රාග්ධනය ඇමරිකා එක්සත් ජනපදය ඩොලර් බිලියන 8.8 ක් වූ අතර එයින් වැඩි ම අරමුදල් පංගු ප්‍රමාණයක් ඇමරිකා එක්සත් ජනපදය විසින් හිමිකරගෙන තිබූ බව.
- සාමාජික රටට හිමි අරමුදල් පංගුවෙන් 25% ක් රන්වලින් ද ශේෂය ඒ රටේ දේශීය මුදල්වලින් ද ගෙවිය යුතු බව.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල වෙතින් ණය ලබා ගන්නා විට එකී ණයට සමාන අගයක් ඇති දේශීය මුදල් ප්‍රමාණයක් අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ තැන්පත් කළ යුතු අතර අන්තර්ජාතික මූල්‍ය අරමුදල අනුමත කළ මුදල්වලින් අදාළ ණය මුදල සපයන බව.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල වෙතින් ලබා ගන්නා ණය වර්ෂ තුනත් පහත් අතර ගෙවිය යුතු අතර එම ණය ආපසු ගෙවිය යුත්තේ අනුමත කළ පරිවර්තීය මුදල මගින් බව.

- අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ අරමුණු පහත සඳහන් පරිදි බව.
    - අන්තර්ජාතික මූල්‍ය ගැටළුවල දී සහයෝගයෙන් කටයුතු කිරීම සහ උපදේශන සේවා සැපයීම සඳහා ස්ථිර ආයතනයක් තුළින් අන්තර්ජාතික මූල්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම
    - අන්තර්ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයටත් ව්‍යාප්තියටත් අවශ්‍ය සහාය ලබා දීම සහ ඉහළ සේවා නියුක්තියක් ද ඉහළ මූර්ත ආදායමක් ද පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකාර කිරීම
    - විනිමය අනුපාතිකවල ස්ථාවරභාවයක් ඇති කිරීම
    - වර්තන ගණුදෙනු සම්බන්ධයෙන් බහුපාර්ශවීය ගෙවීම් ක්‍රමයක් ඇති කිරීම සඳහා උපකාර කිරීම සහ විදේශ විනිමය සීමා මුලින් උපුටා දැමීම
    - සාමාජික රටවල විශ්වාසය තහවුරු කිරීම සඳහා අරමුදල් සැපයීම සහ ගෙවුම් ශේෂයේ අයහපත් ගැළපුම් නිවැරදි කර ගැනීම සඳහා අවස්ථාව ලබා දීම
    - සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතා අඩු කිරීම සහ ගෙවුම් ශේෂ අසමතුලිතතා පවතින කාලය කෙටි කිරීම
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල පහත සඳහන් ණය වර්ග සපයන බව.
    - දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම් (Extended Fund Facilities)
    - ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම් (Structural Adjustment Facilities)
    - පුළුල් කරන ලද ව්‍යුහාත්මක පහසුකම් (Extended Structural Adjustment Facilities)
    - වන්දි සහ ආපතික මූල්‍යකරණ පහසුකම් (Compensatory and Contengency Financial Facilities)
    - ස්මාරක්ෂක තොග මූල්‍යකරණ පහසුකම් (Buffer Stock Financing Facilities)
    - තෙල් ණය පහසුකම් (Oil Loan Facilities)
    - ක්‍රමවත් පරිවර්තන පහසුකම් (Systematic Transformation Facilities)
- ඇමරිකා එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය ඇතුළු තවත් රටවල් 42 ක සහභාගීත්වයෙන් ඇමරිකාවේ බ්‍රෙට්න්වුඩ්ස් නගරයේ දී 1944 ජූලි මාසයේ පැවති බ්‍රෙට්න්වුඩ්ස් සමුළුවේ ප්‍රතිඵලයක් ලෙස 1947.03.01 දින ලෝක බැංකුව (World Bank Group-WBG) පිහිට වූ බව.
- දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් රටවල් ප්‍රතිසංස්කරණයට හා එවැනි යුද්ධ නැවත ඇතිවීම වැළැක්වීම, ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට එක්සත් ජාතීන්ගේ මුදල් හා මූල්‍ය කටයුතු සමුළුව ගත් තීරණයක ප්‍රතිඵලයක් ලෙස ලෝක බැංකුව (WBG) පිහිට වූ බව.

- ලෝක බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ සාමාජික රටවල දිගුකාලීන සංවර්ධනය සඳහා ආධාර සැපයීම බව.
- ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (International Bank for Reconstruction and Development-IBRD) හෙවත් ලෝක බැංකුවේ (World Bank Group-WBG) ආරම්භක සාමාජික රටවල් 28 ක් වූ අතර 2004 වසර අවසානයේ දී එහි සාමාජික රටවල් 177 ක් වූ බව.
- ලෝක බැංකුව සඳහා අරමුදල් සපයා ඇත්තේ එහි සාමාජික රටවල් බව.
- අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව (International Finance Cooperation - IFC) සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය (International Development Association - IDA) ලෝක බැංකුවට අනුබද්ධිත ආයතන දෙක වන අතර ලෝක බැංකුව සහ මෙම ආයතන ලෝක බැංකුමුළුව (World Bank Group-WBG) ලෙස හඳුන්වන බව.
- ලෝක බැංකුවේ මූලික පරමාර්ථ පහත දැක්වෙන බව.
  - සාමාජික රටවල නිෂ්පාදන කටයුතු සඳහා ආයෝජන පහසුකම් සැපයීම මගින් ඒවායේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම
  - ලිහිල් කොන්දේසි යටතේ විදේශ ප්‍රාග්ධනය සාමාජික රටවලට නොලැබෙන විට විදේශ පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම සඳහා පහසුකම් හා අවස්ථා ඇති කිරීම
  - පෞද්ගලික ආයෝජනවලට අමතර ව බැංකුවේ අරමුදල් ද වෙනත් මාර්ගවලින් ලබා ගන්නා අරමුදල් ද භාවිත කරමින් සාමාජික රටවල ඵලදායී නිෂ්පාදන කටයුතු සඳහා දිගුකාලීන ණය සැපයීම
  - සාමාජික රටවලට කාර්මික සහ ශිල්පීය උපදෙස් සේවා ලබා දීම
  - සාමාජික රටවල නිෂ්පාදන සම්පත් වර්ධනය කර ගැනීම අන්තර්ජාතික ආයෝජන දිරිගැන්වීම තුළින් අන්තර්ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයක් ඇති කිරීම
- ශ්‍රී ලංකාවට ලෝක බැංකුවෙන් සැලසෙන සේවා වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - අවශ්‍ය විදේශ විනිමය, සහනදායී කොන්දේසි යටතේ ණය ලෙස සැපයීම
  - තාක්ෂණය, ශිල්පීය ක්‍රම සහ කාර්මික ඥානය යනාදිය දියුණු කර ගැනීම සඳහා අනුග්‍රහය ලබා දීම
  - විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
  - සංවර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීමටත් ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීමටත් ලෝක බැංකු විශේෂඥයන්ගේ සහයෝගය ලබා දීම
  - ගෝලීයකරණය ගමන් මගට පිවිසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
  - ලෝක වෙළෙඳපොළේ දී මුහුණපෑමට සිදුවන අවාසිදායක තත්ත්ව සමනය කර ගැනීම සඳහා අවශ්‍ය ආධාර සැපයීම

- ලෝක ප්‍රජාව සමග යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා සහයෝගය දැක්වීම
- ව්‍යුහාත්මක ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ලබා දීම
- නව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය දීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ලෝක බැංකු ප්‍රජාව විසින් දිගුකාලීන ණය සැපයූ ප්‍රධාන අංශ වලට නිදසුන් පහත දැක්වෙන බව.
    - කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති
    - බලශක්ති ව්‍යාපෘති
    - අධ්‍යාපනය
    - කර්මාන්ත අංශය
    - සෞඛ්‍ය හා පෝෂණය
    - ගමනාගමනය හා ප්‍රවාහනය
    - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
    - නාගරික සංවර්ධනය
    - ජල සැපයුම
    - උතුරු නැගෙනහිර අවතැන් වූවන් නැවත නගා සිටුවීම

**නිපුණතා මට්ටම 10.11** : සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණයෙන් ඇතිවන බලපෑම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ගෝලීයකරණය යන්න අර්ථකතනය කරයි.
- ගෝලීයකරණයේ ප්‍රධාන ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ගෝලීයකරණයේ ගාමක බලවේග විස්තර කරයි.
- ගෝලීයකරණයට පක්ෂ ව හා විපක්ෂ ව තර්ක ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විදේශ වෙළෙඳාම, විදේශ ආයෝජනය හා විදේශ තාක්ෂණය යනා දී කරුණු මගින් රටවල් ලෝක ආර්ථිකයට ඒකාබද්ධවීම සහ ආර්ථිකය යළිත් විවෘතවීම් ගෝලීයකරණය ලෙස හැඳින්විය හැකි බව.
- ගෝලීයකරණයේ මූලිකාංග පහත පරිදි දැක්විය හැකි බව.
  - නව වෙළෙඳපොළවල් බිහිවීම
  - නව උපකරණ ඇතිවීම
  - නව ලෝක ආයතන හා සංවිධාන ඇතිවීම
  - නව නීතිරීති බිහිවීම
- ගෝලීයකරණ තුළින් ලෝක ආර්ථිකයේ අන්‍යෝන්‍ය රැඳියාව තීව්‍ර වන බව.
- ගෝලීයකරණය මගින් වෙළෙඳ හා මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්ධනයක් සිදුවන බව.
- ගෝලීයකරණ මගින් නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය වන බව.
- ගෝලීයකරණය මගින් ශ්‍රමය ජාත්‍යන්තර සංචලනය වන බව.
- ඓතිහාසික ක්‍රියාවලියක් ලෙස ගෝලීයකරණයේ විවිධ සිද්ධාන්ත පහත දැක්වෙන බව.
  - 1870 ගණන්වල සිට 1920 ගණන් දක්වා ලෝක වෙළෙඳාමේ විශාල වර්ධනයක් හටගැනීම
  - දෙවන ලෝක යුද්ධය අවසන් වී 1945 න් පසුව ලෝක වෙළෙඳ ප්‍රවාහයන්ගේ විශාල වර්ධනයක් දක්නට ලැබීම
  - 1980 ගණන් අවසාන භාගයෙන් පසුව ගෝලීයකරණයේ තවත් රැල්ලක් වර්ධනය වීම
- ගෝලීයකරණයේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන බව.
  - දැඩි අන්තර් පරායත්තභාවය
  - වෙළෙඳ හා මූල්‍ය ප්‍රවාහයන්ගේ ශීඝ්‍ර වර්ධනය
  - නිෂ්පාදන ක්‍රියාවලි ජාත්‍යන්තරකරණය

- ශ්‍රමය ජාත්‍යන්තර වශයෙන් සංචලනය වීම
- රටවල් ආර්ථික වශයෙන් ඒකාබද්ධ වීම

- ගෝලීයකරණයේ ගාමක බලවේග පහත පරිදි බව.
  - ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය
  - තාක්ෂණයේ වර්ධනය
  - ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල නියාමනහරණය
  - රටවල් අතර සාපේක්ෂ වාසි වෙනස්වීම
  - බහු ජාතික සමාගම් නිෂ්පාදනයේ විවිධ ක්‍රියාවලීන් විවිධ රටවල ස්ථානගත කිරීම
  - ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ඉවත් කිරීම
  - පරිමාණානුකූල පිරිමැසුම්
  - ආර්ථික ඒකාබද්ධවීම්

- ගෝලීයකරණයේ වාසි සඳහා නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
  - ලෝකයේ වෙළෙඳ පරිමාව ඉහළ යාම
  - නිෂ්පාදනය හා ආදායම් ඉහළ යාම
  - රැකී රක්ෂා අවස්ථා වැඩිවීම
  - ඍජු විදේශ ආයෝජන වැඩිවීම
  - නව තාක්ෂණය උරුම වීම
  - විවිධ භාණ්ඩ පරිභෝජනය සඳහා අවස්ථාව සැලසීම
  - නිෂ්පාදනයේ තරගකාරීත්වය වැඩිවීම නිසා ගුණාත්මක නිෂ්පාදන බිහිවීම
  - තොරතුරු ගලා යාම කාර්යක්ෂම වීම

- ගෝලීයකරණයේ අවාසි සඳහා නිදසුන් පහත දැක්වෙන බව.
  - ජාත්‍යන්තර වශයෙන් ආදායම් විෂමතා පුළුල් වීම
  - පාරිසරික ගැටළු
  - දේශීය ආර්ථික ක්‍රමවල ස්වෛරීත්වයට තර්ජන පැන නැගීම
  - සංස්කෘතික විවිධත්වය වැනසී යාම
  - මූල්‍ය වෙළෙඳපොළ අස්ථායීතාවක් හට ගැනීම නිසා ආර්ථික අර්බුද හට ගැනීම
  - දේශීය නිෂ්පාදන ක්ෂේත්‍රවල පසුබෑම සහ රැකීරක්ෂා අවස්ථා අහිමිවීම
  - ජාත්‍යන්තර ත්‍රස්තවාදය/ සෞඛ්‍ය ගැටළු

- ගෝලීයකරණයේ වාසි සහ අවාසි අනුව ගෝලීයකරණයට පක්ෂ ව හා විපක්ෂ ව තර්ක ඉදිරිපත් වී ඇති බව.

**නිපුණතාව 11** : සංවර්ධනයේ විවිධත්වය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායකවීමෙ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 11.1** : ආර්ථික වර්ධනයේ වැදගත්කම අගයමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික වර්ධනය යන්න අර්ථකතනය කරයි.
- එය තීරණය කරන සාධක පෙන්වයි.
- ආර්ථික වර්ධනයේ වැදගත්කම අගයයි.
- ආර්ථික වර්ධනය මිනුම් කර ඉදිරිපත් කරයි.
- ආර්ථික වර්ධනයත් සමග ආර්ථික ව්‍යුහය වෙනස්වන ආකාරය පෙන්වා දෙයි.
- ආර්ථික වර්ධනයේ පිරිවැයක් ඇති බව නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික වෘද්ධිය යනු මූර්ත දළ ජාතික නිෂ්පාදනයෙහි අඛණ්ඩ වර්ධනයවීමක් වන අතර ආර්ථිකයේ නිෂ්පාදන විභවතාවයෙහි දිගු කාලීන ප්‍රසාරණයක් මෙයින් පිළිඹිබු කරන බව.
- මෙමගින් ආර්ථිකයෙහි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ ප්‍රමාණාත්මක වෙනස්වීමක් පිළිඹිබු කරන බව.
- ආර්ථික වෘද්ධිය හා ආර්ථික වර්ධන අනුපාතිකය අතර පැහැදිලි වෙනසක් දක්නට තිබෙන බව.
- ආදායම් විෂමතා, දරිද්‍රතාව සහ විරැකියාව යන ප්‍රශ්නයන් හි අඩුවැඩි මට්ටම තීරණය කිරීමෙහි ලා ආර්ථික වෘද්ධිය ද සැලකිය යුතු අයුරින් බලපෑම් කරන බව.
- ආර්ථික වෘද්ධියට හේතු පහත සඳහන් පරිදි දැක්විය හැකි බව.
    - සම්පත් සම්භාරය ඉහළ නැංවීම
        - භෞතික ප්‍රාග්ධනය
        - මානව ප්‍රාග්ධනය
        - ස්වභාවික ප්‍රාග්ධනය
        - සමාජ ප්‍රාග්ධනය
    - ඵලදායීතාවය ඉහළ නැංවීම
        - තාක්ෂණය
        - මානව ප්‍රාග්ධනය
    - ආර්ථික ස්ථායිතාව
    - දේශපාලන ස්ථාවරභාවය
    - යහපාලනය

- ආර්ථික වෘද්ධිය සම්බන්ධ විවිධ න්‍යාය පවතින බව.
- ආර්ථික වර්ධනය මැනිය හැකි බව
- ආර්ථික වර්ධනයක් සමග ආර්ථික ව්‍යුහය වෙනස්වන බව.

  නිදසුන් :-

  - කෘෂිකාර්මික අංශයට වඩා කාර්මික අංශය වැදගත් වන අතර වඩාත් ම වැදගත් අංශය බවට සේවා අංශය පත්වන බව
  - ආර්ථික වර්ධනයක් සිදුවන විට ආදායම් මට්ටම් වැඩිවීම තුළින්, ආදායම් ඉල්ලුම් නම්‍යතාවය මත නිෂ්පාදනයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවන බව
- ආර්ථික වෘද්ධියේ වාසි පහත පරිදි දැක්විය හැකි බව.
  - ඉහළ ජීවන තත්ත්වයක් ලබා ගත හැකිවිට දිළිඳුකම අඩු කිරීම
  - ආදායම ඉහළ යාම
  - ව්‍යාපාරවලට ඉහළ ලාභ අත්කර ගත හැකිවීම
  - සේවා නියුක්තිය ඉහළ යාම
  - ව්‍යාපාරික විශ්වසනීයත්වය ඉහළ යාම
  - අයවැය හිඟය අඩුවීම
- ආර්ථික වර්ධනයේ පිරිවැය පහත පරිදි දැක්විය හැකි බව.
  - උද්ධමනයක් ඇති වීමේ අවදානම
  - නිෂ්පාදනය හා පරිභෝජනය ඉහළ යාම තුළින් පරිසරයට අහිතකර ලෙස බලපෑම
  - ආදායම් හා ධන ව්‍යාප්ති විෂමතා
  - ප්‍රාදේශීය විෂමතා
  - තිරසාර සංවර්ධනයට හානිකර වීම
  - පරිසර හායනය
  - ඉහළ ආදායම් ලබන රටක් ලෙස වර්ගීකරණය වීම නිසා මානව සුභසාධනය නැංවීම උදෙසා ලැබෙන ජාත්‍යන්තර සහයෝගය අහිමිවීම.

**නිපුණතා මට්ටම 11.2** : ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක ගුණාංග හා එය මැනීම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික සංවර්ධනය යන්න අර්ථකතනය කරයි.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ තිබිය යුතු ගුණාංග නම් කරයි.
- සංවර්ධනය මැනීමේ දර්ශක නම් කරමින් පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික සංවර්ධනය යනු මිනිස් ජීවිතයේ ආර්ථික තත්ත්වය සහ ගුණාත්මක තත්ත්වය ඉහළ යාමක් වන අතර එය වෙනස්වීම් ක්‍රියාවලියක් බව.
- ආර්ථික සංවර්ධනයේදී ආර්ථික වෘද්ධියත් සමග සමාජීය, දේශපාලන, පාරසරික සහ සංස්කෘතික අංශවල දියුණුවක් ඇතිවන බව.
- මෙලෙස අංශ කිහිපයක වෙනස් වීමක් ඇතිවන නිසා ආර්ථික සංවර්ධනය බහුමාන (Multi dimensional) ක්‍රියාවලියක් බව.
- ආර්ථික වෘද්ධියෙන් පිළිඹිබු කරනුයේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමාණාත්මක පැතිකඩක් වන අතර ඊට අමතර ව ආර්ථික සංවර්ධනයේ ගුණාත්මක පැතිකඩක් ද දක්නට ලැබෙන බව.
- ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික වෘද්ධියත් සමග පහත සඳහන් කොන්දේසි ඉටුවිය යුතු බව.
  - ආර්ථිකයේ නිෂ්පාදන අංශයන් හි ව්‍යුහාත්මක වෙනස්කම් හටගැනීම
  - නිෂ්පාදන සම්පත්වල ඵලදායකත්වය ඉහළ යාම
  - නිෂ්පාදන ක්‍රම ශිල්ප හා තාක්ෂණය උසස් වීම
  - නවීකරණය වීම
  - ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ඉහළ සිට පහළට ගලා ගොස් රටෙහි පවතින දුගී බව අඩුවීම, විරැකියාව අඩුවීම හා ආදායම් විෂමතාව නැතිවීම
- ආර්ථිකයේ සංවර්ධනය මැනීමට සහ සංයුක්ත දර්ශක යොදාගන්නා බව.
- ආර්ථික සංවර්ධනයේ එක් එක් අංශ වල ප්‍රගතිය වෙන්වෙන් වශයෙන් මැනීමට තනි දර්ශක යොදාගන්නා බව.

  නිදසුන් :-

  - ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය
  - සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය
  - ආයු අපේක්ෂණය
  - සාක්ෂරතා අනුපාතය
  - ජිනි සංගුණකය
  - ශ්‍රම බලකා සහභාගීත්වය අනුපාතය

- ආර්ථික සංවර්ධනයේ සමස්ත ප්‍රගතිය මැනීමට  සංයුක්ත දර්ශක යොදාගන්නා අතර තනි දර්ශක කිහිපයක් යොදාගෙන සංයුක්ත දර්ශක සකස් කර ඇති බව.

  නිදසුන් :

  - භෞතික ජීවන තත්ත්ව දර්ශකය
  - මානව සංවර්ධන දර්ශකය
  - මානව දරිද්‍රතා දර්ශකය

- ඒක පුද්ගලයකුට රටේ නිමැවුමෙන්  හිමිවන ප්‍රමාණය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයෙන් මැනිය හැකි බව.
- ඒක පුද්ගල දළ දේශිය නිෂ්පාදනයෙන් සංවර්ධනයේ සෑම අංශයක්ම නියෝජනය නොවන නිසා ආර්ථික සංවර්ධනය  මැනීමට පරිපූර්ණ මිණුමක් නොවන බව.
- සංවර්ධනය මැනීමේ ලා ආර්ථිකමය දර්ශකයන්ට අතිරේක ව සමාජීය නිර්ණායකයන් ද ඒකාබද්ධ කොට වඩා පරිපූර්ණ සංවර්ධන දර්ශකයන් මෑත කාලයේදී හඳුන්වා දී ඇති බව.

.

- ආර්ථික සංවර්ධනය පිළිබඳ ව නව අර්ථකතනයකින්  භෞතික ජීවන තත්ත්ව දර්ශකය නිර්මාණය කරඇති බව.
- මෙම දර්ශකයට පහත සඳහන් නිර්ණායක ඇතුළත් වන බව.
  - වයස අවුරුදු එකේදී ආයු අපේක්ෂාව
  - ළදරු මරණ අනුපාතිකය
  - සාක්ෂරතාවය
- ඉහත නිර්ණායක අනුව දර්ශකයට ලැබෙන අගය 100ට ආසන්න රටේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමක පවතින අතර දර්ශකයට ලැබෙන අගය 0 ට ආසන්න රටේ ජීවන තත්ත්වය පහළ මට්ටමක පවතින බව.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල මගින් 1990 දී මානව සංවර්ධන දර්ශකය හඳුන්වා දුන් බව.
- මෙයට අදාළ දර්ශක තුනක් පවතින බව.
  - උපතේ දී ආයු අපේක්ෂණය
  - වැඩිහිටි සාක්ෂරතා අනුපාතය සහ පාසල්වලට ඇතුළත් වීමේ අනුපාතය
  - ඒක පුද්ගල ආදායම

- මානව සංවර්ධනය අනුව පහත පරිදි රටවල් බෙදා වෙන් කරන බව.
  - ඉතා ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් - 0.900 සහ ඊට වැඩි
  - ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් - 0.800 - 0.899
  - මධ්‍යම මානව සංවර්ධනය සහිත රටවල් - 0.500 - 0.799
  - පහළ මානව සංවර්ධනය සහිත රටවල් - 0.000 - 0.499
- 2009 වර්ෂයේ මානව සංවර්ධන වාර්තාවට අනුව ලෝකයේ ඉහළ මානව සංවර්ධනයක් පෙන්නුම් කළ රටවල් වූයේ නෝර්වේ, ඕස්ට්‍රේලියාව, අයිස්ලන්තය, කැනඩාව සහ අයර්ලන්තය බව.
- අඩුම මානව සංවර්ධනයක් පෙන්නුම් කළ රටවල් වූයේ මාලි, මධ්‍යම අප්‍රිකානු සමුහාණ්ඩුව, සියරාලියොන්, ඇෆ්ගනිස්ථානය හා නයිගර් බව.
- 2009 වර්ෂයේ මානව සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ අගය 0.759ක් බව.

(සංවර්ධනය මැනීමේ දර්ශකවලට අදාළ කාලීන තොරතුරු පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.)

**නිපුණතා මට්ටම 11.3** : සංවර්ධනයේ විවිධත්වය තුලනාත්මකව විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :

**ඉගෙනුම් ඵල** :

- ලෝක බැංකු වර්ගීකරණයන්ට අනුව ආර්ථික වර්ගකර ඇති ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- අනෙකුත් වර්ගීකරණයන්ට අනුව ආර්ථික වර්ගකර ඇති ආකාරයන්ට නිදසුන් ඉදිරිපත් කරයි.
- සංවර්ධනය පිළිබඳ ව ජාත්‍යන්තර විවිධත්වය පැහැදිලි කරමින් එයට හේතු ඉදිරිපත් කරයි.
- තිරසාර සංවර්ධන සංකල්පය අර්ථ දක්වමින් එහි වැදගත්කම අගය යි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික සංවර්ධනය ද, සමාජ සංවර්ධනය ද, පරිසර ආරක්ෂණය ද තුළින් අත්කර ගන්නා දියුණුව චිරස්ථායී සංවර්ධනය හෙවත් තිරසාර සංවර්ධනය බව.
- වර්තමානයේ තිරසාර සංවර්ධන ප්‍රවේශයට රටවල් අවතීර්ණ වීමට හේතු පහත දැක්වෙන බව.
  - පරිසර සුරක්ෂිතතාව ඇති කිරීම
  - ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම
- පාරිසරික සම්පත් භාවිතය හා ස්වාභාවික සිදුවන උපද්‍රවයන් ද තිරසාර සංවර්ධන ප්‍රවේශයට බලපෑම් එල්ල කරන අතර ඒවාට නිදසුන් පහත දැක්වෙන බව.
  - ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් ඉවක් බවක් නැතිව භාවිත කිරීම
  - වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ යාම
  - හිම කඳු දිය වීම
  - දේශගුණ විපර්යාස
  - ඕසෝන් ස්ථරය සිදුරු වීම
  - වනාන්තර කැපීම
  - ජලය දූෂණය වීම
- තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රාග්ධනය ස්වරූප පහත දැක්වෙන බව.
  - භෞතික ප්‍රාග්ධනය
  - මානව ප්‍රාග්ධනය
  - ස්වභාවික ප්‍රාග්ධනය
  - සමාජ ප්‍රාග්ධනය

- ස්වභාවික සම්පත් ක්ෂය වීම ද පරිසරයට හානි පැමිණීම ද අවම කිරීම සඳහා රටවල් අන්තර් ජාතික වශයෙන් ද දේශීය වශයෙන් ද විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර ඒවාට නිදසුන් පහත දැක්වෙන බව.
    - ඕසෝන් ස්ථරයට හානි ගෙන දෙන ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් වායු භාවිතය තහනම් කිරීම
    - පොලිතීන් භාවිතය සීමා කිරීම
    - කර්මාන්තශාලාවලින් සිදුවන පරිසර හානි වැළැක්වීම සඳහා නීති පැනවීම
    - මෝටර් රථවලින් පිටවන දුම් පාලනය කිරීම
- වර්තමාන පරපුර භුක්ති විඳින සම්පත් ඒ ආකාරයෙන්ම අනාගත පරපුරට භුක්ති විඳීමට ඇති අයිතිය අහිමි නොවන ලෙස, වර්තමාන පරපුරට ළඟාවිය හැකි ප්‍රශස්ත සංවර්ධන මට්ටම ධරණීය සංවර්ධනය හෙවත් තිරසාර සංවර්ධනය බව.
- රටක අනාගත දියුණුවත් මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක බවත් තීරණය වන්නේ පරිසරයේ ගුණාත්මකභාවය අනුව බව.
- තිරසාර සංවර්ධන සංකල්පය මගින් උත්සාහ දරන්නේ ආර්ථික වර්ධනය ද, ස්වභාවික සම්පත්වල වර්ධනය ද, පරිසරය ද යන ඒවායේ සමබරතාවයක් ඇති කිරීම බව.
- තිරසාර සංවර්ධන ප්‍රවේශයේ දී මානව සංවර්ධනයේ අවශ්‍යතාවය ද අවධාරණය කළ යුතු බව.
- තිරසාර සංවර්ධනයක් ඇති වීම සඳහා අංශ තුනක දියුණුවක් බලපාන නිසා ඒවා තිරසාර සංවර්ධනයේ කුලුණු ලෙස හඳුන්වන අතර ඒවා පහත දැක්වෙන බව.
    - ආර්ථික සංවර්ධනය
    - සමාජ සංවර්ධනය
    - පරිසර ආරක්ෂණය
- මෙම කුළුණු තුන අතර අන්තර් රැඳියාවක් මෙන් ම අන්තර් සම්බන්ධතාවක් ද පවතින බව.

**නිපුණතා මට්ටම 11.4** : ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා සම්මත ක්‍රම පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :

**ඉගෙනුම් ඵල** :

- ආදායම් ව්‍යාප්ති විෂමතාවය අර්ථ දක්වයි.
- ආදායම් ව්‍යාප්තියේ පවතින විවිධ ස්වරූප ඉදිරිපත් කරයි.
- ආදායම් ව්‍යාප්තිය මැනීම සඳහා යොදා ගන්නා මිනුම් රූප සටහන් ඇසුරින් පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වෙළෙඳපොළ ක්‍රමය පවතින ඕනෑ ම සමාජයක ආදායම් අඩු හා ආදායම් වැඩි ලෙස පන්ති භේදයක් පවතින බව.
- මෙය ආදායම් ව්‍යාප්ති විෂමතාවය ලෙස හඳුන්වන බව.
- ආදායම් ව්‍යාප්ති විෂමතාවය අවම කිරීම සාධාරණත්වය ලෙස සලකන බව.
- රටක සමස්ත නිෂ්පාදනය බෙදී යාම ආදායම් ව්‍යාප්ති විෂමතාවය මත සිදුවන බව.
- ආදායම් ව්‍යාප්ති විෂමතාවයේ ස්වරූප දෙකක් පවතින බව.
  - සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය
  - නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය
- සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය යනු මුළු ආදායම කුටුම්භ අතර බෙදී ගොස් ඇති ආකාරය දැක්වීම බව.
- මුළු කුටුම්භ සංඛ්‍යාවෙන් අඩුම ආදායම් ලබන ප්‍රතිශතයට හා ඉහළ ම ආදායම් ලබන ප්‍රතිශතයට අනුව ආදායම් ව්‍යාප්ති විෂමතාවය තීරණය කළ හැකි බව.
- සාපේක්ෂ ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය ලෝරන්ස් වක්‍රය මගින් දැක්විය හැකි බව.
- ලෝරන්ස් වක්‍රය පහත පරිදි දැක්විය හැකි බව




- ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යප්ති රේඛාවට ළංවන තරමට ආදායම් ව්‍යප්ති විෂමතාවය අඩුවන බව.

- ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යප්ති රේඛාවෙන් ඈත්වන විට ආදායම් ව්‍යප්ති විෂමතාවය වැඩිවන බව.
- ලෝරන්ස් වක්‍රයෙන් නිරූපණය වන ව්‍යාප්ති විෂමතාවයේ තරම ජිනි සංගුණකය මඟින් මැන දැක්විය හැකි බව.
- ජිනි සංගුණකය මනිනු ලබන්නේ $\frac{X}{X+Y}$ වලින් බව.
- ජිනි සංගුණකය 1ට ළංවනවිට ආදායම් ව්‍යාප්ති විෂමතාව වැඩිවන බව.
- ජිණි සංගුණකය 0ට ළංවනවිට ආදායම් ව්‍යාප්ති විෂමතාව අඩුවන බව.
- ජිණි සංගුණකය 0ට ළංවන්නේ ආදායම් ව්‍යප්ති විෂමතාවයක් නොමැතිවිට බව.
- රටක ආදායම් පරාසවලට වෙන්කර ඒ එක් එක් ආදායම් පරාසයන්ට ගැනෙන ජන සංඛ්‍යා ප්‍රතිශත වශයෙන් ප්‍රකාශ කිරීම නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය බව.
- දරිද්‍රතා ඉමට පහළින් සිටින ජනතාව නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය අනුව දුප්පතුන් බව.

**නිපුණතා මට්ටම 11.5** : දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.
**ඉගෙනුම් ඵල** :

- නිරපේක්ෂ හා සාපේක්ෂ දරිද්‍රතාවයේ වෙනස හඳුනාගනියි.
- දරිද්‍රතාවයේ පැතිකඩ දෙක ප්‍රකාශ කරයි.
- ජාතික දරිද්‍රතා ඉම හා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම විග්‍රහ කරයි.
- මානව දරිද්‍රතා දර්ශකය හඳුන්වයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- දරිද්‍රතාවය විවිධ සංකල්ප ඔස්සේ නිර්වචනය කෙරෙන බව.
- අවම කැලරි ප්‍රමාණය ලබා දෙන ආහාර ද්‍රව්‍ය ඇතුළු මූලික අවශ්‍යතා ලබා ගැනීමටවත් ප්‍රමාණවත් ආදායමක් නොලබන්නේ නම් එය නිරපේක්ෂ දරිද්‍රතාවය බව.
- ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය හේතුවෙන් ඇතිවන්නේ සාපේක්ෂ දරිද්‍රතාවය බව.
- දරිද්‍රතාවයේ පැතිකඩ දෙකක් පවතින බව.
  - ආදායම් දරිද්‍රතාවය
  - පරිභෝජන දරිද්‍රතාවය
- මූලික ජීවන අවශ්‍යතා ඇතුළත් අවම පරිභෝජන මට්ටමක් රඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් මට්ටමක ආදායමක් උපයා ගැනීමට හැකියාවක් නොමැතිකම මූලික දරිද්‍රතාවය බව.
- පුද්ගල ජීවිතයේ ගුණාත්මක තත්ත්වය හා ජීවන තත්ත්වය විදහා දක්වන වැඩිහිටි සාක්ෂරතාවය, ජීවන තත්ත්වය සහ පාසල් අධ්‍යාපනය ලැබූ වර්ෂ ගණන යන නිර්ණායක පදනම් ව දරිද්‍රතාවය සලකා බැලීම සිදුකරන බව.
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිර්වචනයට අනුව නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන් ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්න ව හා සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීමට සමත් මානව සංවර්ධනයක් සඳහා ඉඩ ප්‍රස්තා හා තේරීම් අහිමි වී ගිය තත්ත්වය මානව දරිද්‍රතාවය බව.
- පැවැත්මට හා යහපත් ක්‍රියාකාරීත්වයට අවශ්‍ය කරන ආහාර හා ආහාර නොවන අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දැරීමට සිදුවන අවම වියදම ජාතික දරිද්‍රතා ඉම බව. (කාලයට අනුව දරිද්‍රතා ඉම ලබා දිය හැකිය.)
- ඒ අනුව පුද්ගලයකුගේ දිනක ආදායම ඇමෙරිකානු ඩොලර් 1.08 පහළ දරිද්‍රතා රේඛාව ලෙසින් ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2.15 යන සමාජ ඉහළ දරිද්‍රතා ක්‍රම ලෙසත් අර්ථ දක්වන බව. (මෙම සීමාව කාලීනව වෙනස් වේ.)
- රටක ජනගහනයේ කොතරම් පිරිසක් දරිද්‍රතා ඉමට වඩා අඩු ආදායමක් උපයනවා ද යන්න දරිද්‍රතාවය පිළිබඳ ඉතා සරල මිනුම් දණ්ඩක් බව.

- මානව දරිද්‍රතා දර්ශකය (HPI) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් 1997 වර්ෂයේදී හඳුන්වා දෙන ලද්දක් බව.
- මානව දරිද්‍රතා දර්ශකය ස්වරූප දෙක පහත දැක්වෙන බව.
    - මානව දරිද්‍රතා දර්ශකය - 1 (HPI-1)
    - මානව දරිද්‍රතා දර්ශකය - 2 (HPI-2)
- මානව දරිද්‍රතා දර්ශකය 1 යොමු වී ඇත්තේ සංවර්ධනය වන රටවල දරිද්‍රතාව මැනීම සඳහා බව.
- මානව දරිද්‍රතා දර්ශක 2 යොමු වී ඇත්තේ සංවර්ධිත රටවල දරිද්‍රතාව මැනීම සඳහා බව.
- මානව දරිද්‍රතා දර්ශක දෙකෙහි නිර්ණායකයන් වෙනස් වන බව.
- මානව දරිද්‍රතා දර්ශකය අවධානය යොමු කරනුයේ නිරපේක්ෂ දරිද්‍රතාවයේ ප්‍රමාණය මැනීම බව.

(දරිද්‍රතාවය මැනීමේ දර්ශකවලට අදාළ කාලීන තොරතුරු පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.)

**නිපුණතා මට්ටම 11.6** : ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය හා එය අවම කිරීමට ගෙන ඇති ප්‍රයත්න අගය යි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් හඳුන්වයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය වෙනස්කම්වලට හේතු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයට හේතු වූ කරුණු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අවම කර ගැනීමට ක්‍රියා මාර්ග යෝජනා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ ආදායම්/ පරිභෝජන දරිද්‍රතාවය පහත පරිදි දැක්විය හැකි බව.
  - ඒක පුද්ගල දරිද්‍රතා කඩඉම ඇස්තමේන්තු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වැඩිහිටි සහ තරුණ (අඩු : 20-30) පුද්ගලයකු සඳහා දිනකට කැලරි 2030 ක් ලබා දෙන පෝෂ්‍යදායක ආහාරප්‍රමාණයක් පරිභෝජන කරන විට වැයවන මාසික වියදම පදනම් කර ගන්නා බව.
  - මීට අමතර ව ආහාර නොවන අත්‍යවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය සඳහා කරනු ලබන (අධ්‍යාපන, සෞඛ්‍ය සහ නිවාස) වියදම් ද පදනම වන බව.
- ඒ අනුව 2000/07 ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා රේඛාව මසකට රුපියල් 2233 ක් බව.
- 2010 ජනවාරි මාසයේ මසකට රුපියල් 3070 ක් වන බව.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය ක්‍රමයෙන් අඩුවන බව.
- නාගරික හා ග්‍රාමීය අංශයේ දරිද්‍රතාවය ද ක්‍රමයෙන් අඩුවන බව.
- නාගරික අංශයට සාපේක්ෂ ව ග්‍රාමීය හා වතු අංශය දරිද්‍රතාවය වැඩි බව.
- දරිද්‍රතාවයට හේතු පහත පරිදි ඉදිරිපත් කළ හැකි බව.
  - ප්‍රාදේශීය විෂමතා තුළ ග්‍රාමීය ප්‍රදේශ ආන්තිකරණය වීමට හේතු
  - භෞතික හා සමාජීය යටිතල පහසුකම්වල ඌන සංවර්ධනය
  - සම්පත් හා වෙළෙඳපොළ පහසුකම්වල ඌනතා
  - කෘෂිකර්මයට ඇති ඉඩ ප්‍රස්තා හීනවීම
  - ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ අඩු ආදායම් ලබන ග්‍රාමීය කොටස කරා ගලා නොයාම
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු කිරීමට පහත දැක්වෙන ක්‍රියාමාර්ග යෝජනා කළ හැකි බව.
  - දිළිඳු ජනතාවට හිතකර ආරක්ෂක වෘද්ධියක් මගින් ආර්ථික අවශ්‍යතා පුළුල් කිරීම
  - දිළිඳු ජනතාව සවිබලකරණයට පදනම ගතවීම
  - දිළිඳු ජනකොටස් සුරක්ෂිත කිරීම සඳහා ජාතික ක්‍රියාමාර්ග තහවුරු කිරීම

**නිපුණතා මට්ටම 11.7** : ආර්ථික වර්ධනය හා දරිද්‍රතාවය අතර සම්බන්ධතාව විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික වර්ධනය හා දරිද්‍රතාව අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.
- දිළිඳු ජනතාවට හිතකර ආර්ථික වෘද්ධි වැඩසටහන් නිදසුන් සහිත ව පෙන්වයි.
- දිළිඳු ජනතාවට හිතකර ආර්ථික ප්‍රතිපත්ති නිදසුන් සහිත ව පෙන්වයි.
- දිළිඳු ජනතාවට හිතකාමී වර්ධනයක් ළඟාකර ගැනීමට පියවරයන් යෝජනා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- දිළිඳු ජනතාවගේ ආදායම් ඉහළ නැංවීමෙහි ලා වඩාත් කාර්යක්ෂම අන්දමින් දායක වන සහ දුප්පතුන්ට හිතකර වන පරිදි ආදායම් බෙදී යාමේ වෙනසක් ඇති කරන වෘද්ධි ක්‍රියාවලිය දිළිඳු ජනතාවට හිතකර වෘද්ධිය ලෙස හැඳින්විය හැකි බව.
- දිළිඳු ජනතාවට හිතකර වෘද්ධි ආකාර දෙකකට මැනිය හැකි බව.
  - නිරපේක්ෂ ව
  - සාපේක්ෂ ව
- නිරපේක්ෂ ව මනින විට දුප්පත් අයගේ ආදායමේ නිරපේක්ෂ වැඩිවීමකට ඉවහල් වන වෘද්ධි ක්‍රියාවලියක් අපේක්ෂා කරන බව.
- සාපේක්ෂ ව මනින විට දුප්පත් නොවන අයගේ සාමාන්‍ය ආදායම වැඩිවන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් දුප්පත් අයගේ සාමාන්‍ය ආදායම ඉහළ යාමට තුඩු දෙන වෘද්ධි ක්‍රියාවලියක් අපේක්ෂා කරන බව.
- දිළිඳු ජනතාවට හිතකර වෘද්ධියක් ළඟාකර ගැනීම සඳහා රජය මෑතකාලීන ව ගෙන ඇති ක්‍රියාමාර්ගවලට නිදසුන් පහත දැක්වෙන බව.
  - ග්‍රාමීය දිළිඳුකමට පිළියම් ලෙස සමෘද්ධි දීමනා 50% කින් වැඩි කිරීම
  - ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා ඇති කිරීම සඳහා ජන පුබුදුව, ගැමිදිරිය සහ ඔසු ගම්මාන ක්‍රියාත්මක කිරීම
  - ග්‍රාමීය පොදු කාර්ය සංවර්ධනය ඇති කිරීම සඳහා මග නැගුම, ගම නැගුම, ගැමි පුබුදුව සහ ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
  - ප්‍රාදේශීය සංවර්ධන යෝජනා ක්‍රම ලෙස රජරට නවෝදය, පුබුදමු වෙල්ලස්ස, සෙන්කඩගල උදානය සහ උතුරු නැගෙනහිර සංවර්ධනය වැනි යෝජනා ක්‍රම
  - කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සඳහා පොහොර සහනාධාරය ලබා දීම, වී සඳහා සහතික මිල වැඩි කිරීම සහ කිරි ගම්මාන ඇති කිරීම

- සූක්ෂම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තය දියුණු කිරීම සඳහා රට පුරා කර්මාන්ත ශාලා 300 ක් ඉදි කිරීම, ලංකා පුත්‍ර වැඩසටහන, නැණසල වැඩසටහන, ජාතික ව්‍යවසායක බැංකුව සහ සුක්ෂම සේවා ක්‍රම ක්‍රියාත්මක කිරීම
- උසස් අධ්‍යාපන හා පහසුකම් පිළිබඳ විෂමතා අඩු කිරීම සඳහා ගමට තාක්ෂණය ගෙන යන විද්‍යා තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සහ සාගර විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම

- දිළිඳු ජනතාවට හිතකර වෘද්ධියක් ළඟා කර ගැනීමට අනුගමනය කළ හැකි ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පහත පරිදි හඳුනාගත හැකි බව.

| **ප්‍රතිපත්තිය** | **ක්‍රියාමාර්ගය** |
|---|---|
| 1. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | • උද්ධමනය පාලනය කිරීම<br>• තෝරා ගත් ක්ෂේත්‍ර පමණක් නිදහස් වෙළෙඳාමට විවෘත කිරීම |
| 2. ආංශික ප්‍රතිපත්ති | • කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ<br>• මානව ප්‍රාග්ධන සංවර්ධනය<br>• සෞඛ්‍ය පහසුකම් පුළුල් කිරීම<br>• කාන්තාවන් සවිබල ගැන්වීම |
| 3. ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්ති | • දුගී ජන කොටස් වැඩි වශයෙන් මධ්‍යගත වූ ප්‍රදේශවලට වෘද්ධි ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම |
| 4. පුනර් ව්‍යාප්ති ප්‍රතිපත්ති | • දුප්පත් ජනතාව ආදායම් ඉපැයීමට හැකි ව්‍යාපෘති ඇතිවන ආකාරයට සහ දුප්පත් ජනතාව සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා සඳහා ළංවීමට හැකිවන අයුරින් ප්‍රතිපත්ති සැකසීම |

(කාලීන වශයෙන් සිදු කරනු ලබන දිළිඳු ජනතාවට හිතකර ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.)

**නිපුණතා මට්ටම 11.8** : ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තිය හා එහි ප්‍රතිවිපාක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ජනගහනය යන සංකල්පය අර්ථ දක්වයි.
- ජනගහන වර්ධනය වේගය හා එහි තීරක හඳුන්වයි.
- ජනගහන ව්‍යාප්තිය වෙනස්වීම් හා එහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ස්වභාවික වර්ධනයත්, ශුද්ධ සංක්‍රමණයත් හේතුවෙන් ජනගහන වර්ධනය සිදුවන බව.
- ජනසංඛ්‍යා වර්ධන අනුපාතික යොදා ගෙන ජන සංඛ්‍යාව මනිනු ලබන බව.
- පෙර වර්ෂයට සාපේක්ෂ ව වර්තමාන වර්ෂයේ ජනගහනය වැඩි වී ඇති අන්දම ජන සංඛ්‍යා වර්ධන අනුපාතයෙන් මැන දැක්වෙන බව.
- ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය ක්‍රම දෙකකට ගණනය කළ හැකි බව.

$$\text{ජන සංඛ්‍යාවේ වර්ධන අනුපාතය} = \left(\text{ස්වභාවික වර්ධන අනුපාතය} + \text{ශුද්ධ සංක්‍රමණ අනුපාතය}\right) \times \frac{100}{1000}$$

$$\text{ජන සංඛ්‍යා වර්ධන අනුපාතය} = \frac{\text{දළ උපත්} - \text{දළ මරණ} + \text{ශුද්ධ සංක්‍රමණ}}{100}$$

- යම් වර්ෂයක් තුළ ඇතිවන උපත් ද, මරණ ද අතර වෙනස ස්වභාවික වර්ධන අනුපාතය ලෙස හඳුන්වන බව.

$$\text{ස්වභාවික වර්ධන අනුපාතය} = \text{උපත් සංඛ්‍යාව} - \text{මරණ සංඛ්‍යාව}$$

- ස්වභාවික වර්ධනයේ ශීඝ්‍රතාව මනිනු ලබන්නේ, ස්වභාවික වර්ධන අනුපාතය මගින් බව.
- ස්වභාවික වර්ධන අනුපාතය ගණනය කරනු ලබන්නේ යම් වර්ෂයක උපත් හා මරණ අතර වෙනස මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් බෙදීමෙන් බව.

$$\text{ස්වභාවික වර්ධන අනුපාතය} = \frac{\text{උපත් සංඛ්‍යාව} - \text{මරණ සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 100\%$$

$$\text{ස්වභාවික වර්ධන අනුපාතය} = \frac{\text{උපත් අනුපාත} - \text{මරණ අනුපාත}}{1000} \times 100\%$$

- ස්වභාවික වර්ධන අනුපාතය ධන අගයක් ගන්නාවිට ජනගහනය වැඩිවීමක් ද ස්වභාවික වර්ධන අනුපාතය ඍණ අගයක් ගන්නා විට ජනගහනය අඩුවීමක් ද සිදුවන බව.
- වර්ෂයක් තුළ රටක ඇතිවන උපත් සංඛ්‍යාව මැන දක්වන මිනුම දළ උපත් අනුපාතය බව.

$$\text{දළ උපත් අනුපාතය} = \frac{\text{සජීවී උපත් සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 1000$$

- නිශ්චිත වර්ෂයක මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් ඒ වර්ෂය තුළ දහසකට සිදුවන මරණ සංඛ්‍යාව බෙදීමෙන් දළ මරණ අනුපාතය ගණනය කළ හැකි බව.

$$\text{දළ මරණ අනුපාතය} = \frac{\text{වාර්ෂික මරණ සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 1000$$

- ළදරු මරණ අනුපාතය පහත පරිදි ගණනය කරන බව.

$$\text{ළදරු මරණ අනුපාතය} = \frac{\text{වර්ෂය තුළ වයස අවු. 1ට අඩුවෙන් මිය යන සංඛ්‍යාව}}{\text{සජීවී දරු උපත් සංඛ්‍යාව}} \times 1000$$

- රටක ජනගහනයේ සිටින ස්ත්‍රී සංඛ්‍යාවට අනුකූල ව සිටින පිරිමි සංඛ්‍යාව දැක්වෙන අනුපාතිකය එම ස්ත්‍රී සංඛ්‍යාවෙන් එක් දහසකට දක්වන ප්‍රමාණය පුම්තිරි අනුපාතය බව.

$$\text{පුම්තිරි අනුපාතය} = \frac{\text{රට තුළ සිටි පිරිමි සංඛ්‍යාව}}{\text{රට තුළ සිටින ගැහැණු සංඛ්‍යාව}} \times 1000$$

- පසුගිය වසර 25 කාලය තුළ ශ්‍රී ලංකාවේ ජනගහනයේ සිදු වී ඇති වෙනස්වීම් පහත පරිදි දැක්විය හැකි බව.
    - ජන සංඛ්‍යා වර්ධන වේගය සැලකිය යුතු ලෙස අඩුවීම
    - මෑත වර්ෂවල දී ශුද්ධ සංක්‍රමණ, ජනගහන වර්ධනය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වීම
    - ජන සංඛ්‍යාව 1981 ලක්ෂ 148 සිට 2007 ලක්ෂ 200 ක් දක්වා ලක්ෂ 52 කින් වැඩි වීම
    - වයස් ව්‍යුහයේ වෙනසක් දක්නට ලැබීම
    - ළමා ප්‍රතිශතය අඩුවීම
    - වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාව අඩුවීම
    - වයස්ගත ජනගහනය වැඩිවීම
    - ළදරු මරණ අනුපාතය අඩුවීම
    - ස්වභාවික වර්ධනය අඩුවීම


ජනගහනය
ජනගහනය වයස්ගත වීම
වැඩකළ හැකි වයසේ ජන සංඛ්‍යාව
• යැපුම් අනුපාත
• වයස්ගත යැපුම් අනුපාත
• ළමා යැපුම් අනුපාත
ජනගහන වර්ධනය
ජනගහන වර්ධන අනුපාතය
ජනගහන වර්ධනය 1000 ප්‍රතිශතයක් ලෙස පෙන්වීම
ස්වභාවික වර්ධනය
+
ශුද්ධ සංක්‍රමණ
ස්වභාවික වර්ධන අනුපාතය
ස්වභාවික වර්ධනය, මධ්‍ය වාර්ෂික ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස පෙන්වීම
ශුද්ධ සංක්‍රමණ අනුපාතය
ආගමන හා විගමන අතර වෙනස මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් 1000 කට කොපමණදැයි පෙන්වීම
ආගමන
විගමන
උපත් සංඛ්‍යාව
–
මරණ සංඛ්‍යාව මර්ත්‍යතාව
දළ උපත් අනුපාතය
දළ මරණ අනුපාතය
ළදරු මරණ අනුපාතය
මාතෘ මරණ අනුපාතය

**නිපුණතා මට්ටම 11.9** : ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය ගණනය කරන අයුරු දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රම බලකාය අර්ථ දක්වයි.
- සංඛ්‍යා දත්ත භාවිත කරමින් ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගීත්වය අනුපාතය ගණනය කරයි.
- ශ්‍රම බලකාය තීරණය කරන සාධක නම්කර පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- නිශ්චිත කාල සීමාවක් තුළ වැටුපක් හෝ ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ආර්ථිකමය වටිනාකමක් ඇති භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමය සැපයීමට අපේක්ෂා කරන අවම සහ උපරිම වයස් සීමාවක් තුළ සිටින සියලුම පුද්ගලයන්ගේ එකතුව ශ්‍රම බලකාය බව.
- ශ්‍රම බලකායට ඇතුළත් නොවන පුද්ගලයින් පහත පරිදි දැක්විය හැකි බව
  - ගෘහණියන්
  - පූර්ණ කාලීන සිසුන්
  - පූර්ණ ආබාධිතයන්
  - ස්ව කැමැත්තෙන් රැකියා නොකරන අය
- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය ගණනය කිරීමේ දී අවම වයස් සීමාව අවුරුදු 10 ක් ලෙස ගත්ත ද උපරිම වයස් සීමාව සැලකිල්ලට නොගන්නා බව.
- ඒ අනුව ශ්‍රම බලකායට ශ්‍රී ලංකාවේ ඇතුළත් කරනු ලබන්නේ ගණන් ගන්නා දිනට පෙර සතියක් තුළ වැටුපක් හෝ ආර්ථික ප්‍රතිලාභයක් හෝ අපේක්ෂාවෙන් සේවා නියුක්ත හා සේවා වියුක්ත සියලුම පුද්ගලයින් බව.

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රම බලකාය | = | සේවා නියුක්ත ජනගහනය | + | සේවා වියුක්ත ජනගහනය |

- ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් අවුරුදු 10 ට වැඩි පුද්ගලයන් වැඩකළ හැකි වයසේ ජන සංඛ්‍යාව ලෙස සලකන බව.
- ශ්‍රම බලකාය වැඩකළ හැකි වයසේ ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය බව.

$$\text{ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය} = \frac{\text{ශ්‍රම බලකාය}}{\text{වැඩ කළ හැකි ජනගහනය}} \times 100\%$$

- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු සපයන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව බව.
- ශ්‍රම බලකාය තීරණය කරන සාධක පහත පරිදි දැක්විය හැකි බව.
  - ජන සංඛ්‍යාවේ ප්‍රමාණය
  - අන්තර් ජාතික සංක්‍රමණ
  - වයස් සංයුතිය
  - ප්‍රමිතිරි සංයුතිය
  - විවාහක අවිවාහක බව
  - අධ්‍යාපන මට්ටම
  - සමාජ ආරක්ෂණ සේවා
  - නාගරීකරණය
  - සෞඛ්‍ය හා පෝෂණ මට්ටම
  - සමාජ සංස්කෘතික හා ආගමික සංකල්ප

**නිපුණතා මට්ටම 11.10** : ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ හා සේවා වියුක්තියේ ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක තත්ත්ව විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- සේවා නියුක්තිය යන්න අර්ථ දක්වමින් එහි ව්‍යුහය ඉදිරිපත් කරයි.
- පූර්ණ සේවා නියුක්තිය හා ඌන සේවා නියුක්තිය අතර වෙනස නිදසුන් සහිත ව පෙන්වා දෙයි.
- සේවා වියුක්තිය අර්ථ දක්වමින් එහි ව්‍යුහය ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට හේතු ඉදිරිපත් කරයි.
- සේවා වියුක්තියේ ප්‍රතිවිපාක නිදසුන් සහිත ව විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වැටුපක් හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක අපේක්ෂාවෙන් ඵලදායී ආර්ථික කටයුත්තක නිරතවීම සේවා නියුක්තිය බව.
- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිර්වචනයට අනුව ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය යනු ගණන් ගන්නා කාලය තුළ පැයක් හෝ එයට වැඩි කාලයක් වේතනයක්, ලාභයක් හෝ ගෙවීමක් අපේක්ෂාවෙන් හෝ පවුලේ ආදායම් ඉපයීමේ කටයුත්තක යෙදීම බව.
- සේවා නියුක්ති අනුපාතය සොයනු ලබන්නේ පහත පරිදි බව.

$$\text{සේවා නියුක්ති අනුපාතිකය} = \frac{\text{සේවා නියුක්තිය}}{\text{ශ්‍රම බලකාය}} \times 100\%$$

- රටක 97% ක් පමණ සේවා නියුක්තියක් පවතී නම් එය පූර්ණ සේවා නියුක්තිය බව.
- ආර්ථික වෘද්ධියක් පවතින විට පූර්ණ සේවා නියුක්තියක් ඇතිවන බව.
- පූර්ණ සේවා නියුක්තියක් පවතින විට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යන බව.
- පූර්ණ සේවා නියුක්තියක් පවතින විට සමාජ විරෝධී ක්‍රියා අඩුවන බව.
- ඌන සේවා නියුක්තිය ආකාර කිහිපයකට පැවතිය හැකි බව.
  - පූර්ණ කාලීන ව වැඩ කළ ද අඩු ආන්තික ඵලදාවක් ලැබීම
  - සුදුසුකම්වලට වඩා අඩු රැකියාවක නියුක්ත වීම
  - පූර්ණ කාලීන ව වැඩ නොමැති වීම
  - පූර්ණ කාලීන ව හෝ අර්ධකාලීනව සේවා නියුක්ත වුවද ශ්‍රමිකයන්ගේ ආන්තික ඵලදාව ශුන්‍ය වේ නම් එය සැඟවුණ සේවා වියුක්තිය ලෙස හඳුන්වන බව.

- ඌන සේවා නියුක්තියේ ආර්ථික ප්‍රතිවිපාක පහත පරිදි බව.
  - ආර්ථික නිෂ්පාදනය අඩුවීම
  - ශ්‍රමය අපතේ යාම
  - ආදායම් ව්‍යාප්ති විෂමතා ඇතිවීම
  - ශ්‍රමයේ ඵලදාව අඩුවීම
  - ශ්‍රමිකයන්ට ආදායම අඩුවීම නිසා දරිද්‍රතාව ඇතිවීම
  - සමාජ විරෝධී ක්‍රියා ඇතිවීම
- සේවා වියුක්තියේ ප්‍රභේද පවතින බව.
- සේවා වියුක්තිය පහත පරිදි ගණනය කළ හැකි බව.

$$\text{සේවා වියුක්ති අනුපාතිකය} = \frac{\text{සේවා වියුක්ති ජනගහනය}}{\text{ශ්‍රම බලකාය}} \times 100\%$$

- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ ස්වරූප වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - මෑත කාලීන ව සේවා වියුක්තිය පහළ වැටෙමින් පැවතීම
  - උගත් තරුණ කොටස අතර සේවා වියුක්ති අනුපාතය ඉහළ මට්ටමක පවතී.
  - ස්ත්‍රී සේවා වියුක්තිය සාපේක්ෂ වශයෙන් වැඩි බව.
  - ග්‍රාමීය අංශයේ සේවා වියුක්තිය සාපේක්ෂ ව වැඩි බව.
- සේවා වියුක්තියේ ප්‍රතිවිපාකවලට නිදසුන් පහත දැක්වෙන බව.
  - සමාජයට ලබා ගත හැකි උපරිම නිෂ්පාදන මට්ටම අහිමි වීම
  - රැකියා අහිමි වීම නිසා ආදායම අහිමිවීමෙන් දරිද්‍රතාවය ඉහළ යාම
  - බාහිර සංක්‍රමණ ඉහළ යාම
  - රජයේ ශුභසාධන වියදම ඉහළ යාම
  - දේශපාලන හා සමාජ නොසන්සුන්තා ඇතිවීම
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අඩු කිරීමට ගත හැකි ක්‍රියා මාර්ගවලට නිදසුන් පහත දැක්වෙන බව.
  - ඉහළ ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීම
  - යටිතල පහසුකම් වැඩි කිරීම
  - කාර්මික පදනම පුළුල් කිරීම
  - ග්‍රාමීය සුළු පරිමාණ කර්මාන්ත ඇති කිරීම
  - වෘත්තිය පුහුණුව ලබා දීම
  - විදේශ සේවා නියුක්තිය වැඩිකිරීම
  - ස්වයං රැකියා අවශ්‍යතා පුළුල් කිරීම

**නිපුණතා මට්ටම 11.11** : ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළ ආශ්‍රිත විවාදිත කරුණු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රමයේ බාහිර සංක්‍රමණ හඳුන්වමින් එයට හේතු නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- ශ්‍රමයේ බාහිර සංක්‍රමණ වල ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- ශ්‍රම වෙළෙඳපොළේ දෘඪ බව හඳුන්වමින් එයට හේතු නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- ශ්‍රම වෙළෙඳපොළේ දෘඪතාවයේ ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රමිකයන් එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට යාම ශ්‍රම සංක්‍රමණය බව.
- නිෂ්පාදන සාධකවල වෙනස්කම්, වැටුප් මට්ටම් සහ ශ්‍රම සැපයුමේ වෙනස්කම් මත ශ්‍රමය සංක්‍රමණය වන බව.
- රටකින් රටකට සිදුවන ශ්‍රම සංක්‍රමණය නිසා සේවා වියුක්තිය අඩුවන බව.
- උගත් බුද්ධිමය පිරිස රට හැර යාම බුද්ධි ගලනයක් ලෙස සලකන අතර එය ආර්ථිකයට ගැටළුවක් බව.
- මැද පෙරදිග රැකියා සඳහා බහුල වශයෙන් පුද්ගලයින් විදේශ ගත වන අතර ඒ තුළ කාන්තාවන් වැඩි බව.
- ශ්‍රමය පිටරටවලට ඇදීයාම නිසා විදේශ විනිමය, සංක්‍රාම ලෙස ශ්‍රී ලංකාවට ලැබෙන බව.
- දේශීය ශ්‍රම වෙළෙඳපොළේ දෘඪතාවයක් පවතින බව.
- එනම් ශ්‍රම ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් ඉක්මණින් වෙනස් නොවීම බව.
- ශ්‍රම වෙළෙඳපොළේ ශ්‍රම සැපයුම හා සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා අතර නොගැළපීමක් පවතින බව.
- ශ්‍රම වෙළෙඳපොළ පහත පරිදි ප්‍රස්තාර සටහනකින් දැක්විය හැකි බව.




- ඉහළ වැටුප් තලයෙන් ශ්‍රම ඉල්ලුමට වඩා සැපයුම පවතින බව.
- කාලයත් සමග ශ්‍රම වෙළෙඳපොළේ ඇතිවන ඉල්ලුම් සැපයුම් තත්ත්වයන් හා රජයේ මැදිහත්වීම අනුව ශ්‍රම වෙළෙඳපොළේ වෙනස්කම් ඇතිවන බව.
- ශ්‍රම ඉල්ලුමට සරිලන පරිදි ශ්‍රම සැපයුම නම්‍ය නොවීම ගැටළු සහගත බව.

**නිපුණතාව 12** : නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය තුලනාත්මක ව අගය යි.

**නිපුණතා මට්ටම 12.1** : ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය සංසන්දනය කරයි.
- ශ්‍රී ලංකා දළ දේශීය නිෂ්පාදිතයේ මෑතකාලීන වෙනස්කම් හා ඊට හේතු විමසයි.
- ශ්‍රී ලංකා සේවා නියුක්තියේ ආංශික සංයුතිය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය සන්සන්දනය කරයි.
- ශ්‍රී ලංකා සේවා නියුක්තියේ මෑතකාලීන වෙනස්කම් හා ඊට හේතු විමසයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අංශ 13 කට වර්ගකර ඇති බව.
- එම අංශයන් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ක්ෂේත්‍ර ඔස්සේ සකස්කර ඇති බව.
- දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ක්ෂේත්‍රවලින් සමන්විත වී ඇති බව.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ එක් එක් කාලවකවානු තුළ දී ආංශික දායකත්වය ක්‍රමයෙන් වෙනස් වී ඇති අතර මේ සඳහා නිදසුන් පහත දැක්වෙන බව.

| | **1950** | **1970** | **1980** | **2000** | **2009** |
|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික අංශය | 46.3% | 28.3% | 27.6% | 19.9% | 12.6% |
| කාර්මික අංශය | 16.9% | 23.8% | 29.6% | 27.3% | 29.7% |
| සේවා අංශය | 36.9% | 47.9% | 42.8% | 52.8% | 57.7% |

- රටක ශ්‍රම බලකායෙන් කොතරම් ප්‍රමාණයක් කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයේ නියැලෙනවා ද යන්න සේවා නියුක්ති ආංශික දායකත්වයෙන් දැක්වෙන බව.

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති ආංශික දායකත්වය සඳහා නිදසුන් පහත දැක්වෙන බව .

| | 1953 | 1977 | 1996 | 2008 |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික අංශය සේවා නියුක්තිය | 53% | 46% | 38% | 32.7% |
| කාර්මික අංශය සේවා නියුක්තිය | 13% | 14% | 22% | 26.3% |
| සේවා අංශය සේවා නියුක්තිය | 34% | 40% | 40% | 41% |

- කාර්මික හා සේවා අංශය ක්‍රමයෙන් ප්‍රසාරණය වනවිට ශ්‍රම බලකායෙන් ඒ සඳහා දරනු ලබන සහභාගීත්වය ද වෙනස්වන බව.
- රටක ආර්ථික වර්ධනය සමග එරට ජනතාවගේ ආදායම් තත්ත්වය ද ඉහළ ගොස් කෘෂිකාර්මික අංශයේ වැදගත්කම කාර්මික හා සේවා අංශයට නැඹුරු වී ඇති බව.
- රටක සංවර්ධනය වැඩිවන විට කෘෂිකාර්මික අංශයට වඩා කාර්මික හා සේවා අංශවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවන බව.
- මේ සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය ද දායකවන ආකාරය අනුව එහි සහභාගීත්වය තීරණය වී ඇති බව.

**නිපුණතා මට්ටම 12.2** : නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මුළු සම්පත් සහ එහි උපයෝජනය විමසමින් ආර්ථික වර්ධනයේ රටාව විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ මුළු සම්පත් සකස් වන අයුරු පැහැදිලි කරයි.
- සම්පත් උපයෝජනයේ අංශ පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉතුරුම් මූලාශ්‍ර විස්තර කරයි.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන රටාවේ සුවිශේෂී කාලවකවානු නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- ශ්‍රී ලංකාවේ මුළු සම්පත් සංයුතිය දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ හා සේවා ආනයනවලින් සමන්විත බව.
- නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය හා ආනයන ව්‍යුහයේ වෙනස්කම් තුළින් මුළු සම්පත් එක් එක් කාලවකවානු තුළ වෙනස් වූ අතර ඒ සඳහා නිදසුන් පහත දැක්වෙන බව.

| | **2005** | **2006** | **2009** |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 64.3% | 70.9% | 78.2% |
| භාණ්ඩ හා සේවා ආනයන | 35.7% | 29.1% | 21.8% |

- රටක මුළු සම්පත් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති හා නව උපාය මාර්ග භාවිත කර ඇති බව.
- ශ්‍රී ලංකාවේ මුළු සම්පත් උපයෝජනය පරිභෝජනය, ආයෝජනය සහ භාණ්ඩ හා සේවා අපනයන වලින් සමන්විත බව.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මුළු සම්පත් උපයෝජනය එක් එක් කාලවකවානු තුළ වෙනස් වූ ආකාරය පහත දැක්වෙන බව.

| | **2005** | **2006** | **2009** |
|---|---|---|---|
| පරිභෝජනය | 58% | 58.8% | 64.1 % |
| ආයෝජනය | 20% | 37.5% | 19.2% |
| භාණ්ඩ හා සේවා අපනයන | 22% | 21.3% | 16.7% |

- ශ්‍රී ලංකාවේ ජාතික ඉතිරි කිරීම්, දේශීය ඉතිරි කිරීම්වලින් සහ විදේශීය ඉතිරි කිරීම්වලින් සමන්විත බව.
- පෞද්ගලික හා රාජ්‍ය ඉතිරි කිරීම්වලින් දේශීය ඉතිරි කිරීම් සමන්විත බව.
- විදේශ ශුද්ධ සාධක ආදායම සහ විදේශ ශුද්ධ පෞද්ගලික සංක්‍රාමවලින් විදේශීය ඉතිරි කිරීම් සමන්විත බව.
- ශ්‍රී ලංකාවේ ඉතිරි කිරීම් පිළිබඳ තොරතුරු සඳහා නිදසුන් පහත දැක්වෙන බව.

| | **2001** | **2006** | **2009** |
|---|---|---|---|
| දේශීය ඉතිරි කිරීම් | 15.8% | 17.3% | 18 % |
| විදේශීය ඉතිරි කිරීම් | 4.5% | 6.1% | 5.9% |
| ජාතික ඉතිරි කිරීම් | 20.3% | 23.4% | 23.9% |

- රටක ජාතික ඉතුරුම් වර්ධනය කර ගැනීම සඳහා විදේශ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම වර්ධනය කර ගත යුතු බව.
- රටක දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම් වර්ධනය කර ගැනීමෙන් ආයෝජන තත්ත්වය ඉහළ යන බව හා ආර්ථික වර්ධනයට ඉන් සුවිශේෂී දායකත්වයක් ලබා දිය හැකි බව.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන රටාවේ සුවිශේෂී කාලවකවානු පහත දැක්වෙන පරිදි වකවානු දෙකක් යටතේ පෙන්වියහැකි බව.
  - වර්ෂ 1948 සිට 1977 දක්වා කාලවකවානුව
  - වර්ෂ 1977 න් පසු කාලවකවානුව
- වර්ෂ 1948 සිට 1977 දක්වා කාලවකවානුව තුළ ආර්ථික වර්ධනය සඳහා රජය වැඩි දායකත්වයක් ලබාදුන් අතර රාජ්‍ය කේන්ද්‍රීය ආර්ථිකයක් පැවති බව.
- වර්ෂ 1948 සිට 1977 දක්වා කාලවකවානුව තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති පහත දැක්වෙන ලෙස සාරාංශ කළ හැකි බව.
  - වර්ෂ 1948 සිට 1959 දක්වා - යටත් විජිත නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය
  - වර්ෂ 1960 සිට 1977 දක්වා- අභ්‍යන්තරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය (ආනයන ආදේශන හා සුභසාධන ආර්ථිකය)
- වර්ෂ 1977 දී ශ්‍රී ලංකාවේ එතෙක් පැවති අභ්‍යන්තරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට බාහිරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය හෙවත් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් බව.
- බාහිරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය යටතේ රජයේ කාර්‍යයභාරය සීමා වූ අතර විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ව පැවති සීමාවන ද ඉවත් කළ බව.

**නිපුණතා මට්ටම 12.3** : ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ විවාදිත කරුණු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට කෘෂිකාර්මික අංශයේ දායකත්වයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- දේශීය කෘෂි කර්මාන්තයේ හා වැවිලි කෘෂි කර්මාන්තයේ වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- කෘෂි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත ලැයිස්තුගත කරයි.
- කෘෂිකාර්මික අංශයේ සමස්ත කාර්ය සාධනය හා ප්‍රවණතා විස්තර කරයි.
- දේශීය හා වැවිලි කෘෂිකර්මාන්තයේ පවතින විෂමතාවයන් හා ගැටළු විස්තර කරයි.
- දේශීය හා වැවිලි කෘෂිකර්මාන්තයේ පවතින ගැටළුවලට විසඳුම් යෝජනා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- වර්ෂ 1977ට පෙර ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට ප්‍රබල ස්ථානයක් හිමි වූ බව.
- ජාතික නිෂ්පාදනයෙන් අඩකට පමණ දායකත්වය කෘෂිකාර්මාන්තයෙන් ලැබුණු බව.
- වර්ෂ 1977ට පෙර පැවති රාජ්‍ය කේන්ද්‍රීය ආර්ථික ප්‍රතිපත්තිය තුළ සාමාන්‍ය වශයෙන් ග්‍රාමීය අංශයේ ආහාර බෝග වගාවන්ට හා වී ගොවිතැන ආදීයට යොමු වූ බව.
- දළ දේශීය නිෂ්පාදනයට දේශීය කෘෂිකාර්මික අංශයේ දායකත්වය ක්‍රමයෙන් අඩු වූ බව.

  නිදසුන් :

  1950 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදනයට කෘෂි අංශයේ දායකත්වය 46.3%ක් පැවති අතර 2009 වර්ෂයේ දී එය 12.6%ක් දක්වා අඩු ව ඇත.
- වර්තමානයේ කෘෂි අංශයේ වැඩිම දායකත්වය එළවළු, පළතුරු ආදීයෙන් සැදුම් ලත් වෙනත් බෝගවලින් ලැබෙන බව.
- දෙවන හා තෙවන නැන හිමිවන්නේ පිළිවෙලින් වී හා වැවිලි බෝගවලට බව.
- දේශීය කෘෂිකර්මාන්තයේ පවතින ගැටළු වලට නිදසුන් පහත දැක්වෙන බව.
  - කෘෂිභෝග ආනයනය කිරීම නිසා දේශීය කෘෂිකර්මාන්තයට ගැටළු ඇතිවීම
  - කෘෂි යෙදවුම්වල මිල ඉහළ යාම
  - දුර්වල ජලකළමණාකරණය, උසස් වර්ගයේ බීජ නො ලැබීම සහ කෘෂි උවදුරු ආදි ගැටළු
  - ඉඩම් කැබලි වීම සහ අද ගොවි අයිතියේ ගැටළු
  - අලෙවිය පිළිබඳ ගැටළු, පෙර අස්වනු හා පසු අස්වනු හානි ආදීය
  - වැවිලි බෝග සඳහා ඉඩම් බහුල වශයෙන් යොදාගැනීම

- දේශීය කෘෂි අංශය නැංවීමට මෑත දී ගෙන ඇති ප්‍රතිපත්තිමය උපාය මාර්ගවලට නිදසුන් පහත දැක්වෙන බව.
    - කෘෂිකර්මාන්තයට යොදා ගන්නා ශිල්පඥානය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම
    - ව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීම
    - පෞද්ගලික ව්‍යවසායන් ශක්තිමත් කිරීම
    - ආහාර සැකසීම් තාක්ෂණය දියුණු කිරීම
    - පළතුරු හා මල් වගාව දියුණු කිරීම
    - දේශීය කිරි නිෂ්පාදනය නගා සිටුවීම
    - කෘෂිකර්මයට අදාළ තොරතුරු තාක්ෂණය ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ත කරවීම
    - සම්පත් සුරැකීම
- වැවිලි භෝග අංශය නැංවීමට මෑත දී ගෙන ඇති පියවරවලට නිදසුන් පහත දැක්වෙන බව.
    - වැවිලි කර්මාන්තයේ සංවර්ධනයට ජාතික සැලැස්මක් පිළියෙළ කිරීම
    - තේ, පොල්, රබර් වැවිලි බෝග සංවර්ධනයට සක්‍රීය අරමුදලක් ස්ථාපනය කිරීම
    - පොහොර සහනාධාරය ලබාදීම
- කෘෂිකර්මාන්තය ආශ්‍රිත කාර්මාන්තවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
    - පොල් ආශ්‍රිත කර්මාන්ත
        - පොල් තෙල් නිෂ්පාදනය
        - කොප්පරා නිෂ්පාදනය
        - කොහු ආශ්‍රිත නිපැයුම්
    - කිරි ආශ්‍රිත කර්මාන්ත
        - යෝගට් නිෂ්පාදනය
        - අයිස්ක්‍රීම් නිෂ්පාදනය
        - මුදවපු කිරි නිෂ්පාදනය
    - රබර් ආශ්‍රීත කර්මාන්ත
        - ටයර් නිෂ්පාදනය
        - මෙට්ට නිෂ්පාදනය
        - ෂීට් රබර් නිෂ්පාදනය

**නිපුණතා මට්ටම 12.4** : ශ්‍රී ලංකාවේ කාර්මික අංශය හා සම්බන්ධිත විවාදිත කරුණු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08 යි.

**ඉගෙනුම් ඵල** :

- කාර්මික අංශයේ සමස්ත කාර්ය සාධනය සහ ප්‍රවණතා විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ දියුණුවට සුළු හා ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ගේ කාර්ය භාරය වැදගත් වන ආකාරය නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයේ ආංශික දායකත්වය අනුව කාර්මික අංශයේ නිෂ්පාදනයෙන් වෙනස් වී ඇති ආකාරය වකවානු තුනක් ආශ්‍රයෙන් පහත පරිදි බව.

**දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය අනුව**

| වකවානු | කාර්මික අංශය |
|---|---|
| 1. 1950-1970 | 20%-24% |
| 2. 1980-2000 | 30%-27% |
| 3. 2000-2008 | 30%-29% |

- මේ අනුව දළ වශයෙන් 30% ප්‍රමාණයක් කාර්මික අංශයේ දායකත්වයක් පවතින බව.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතියට අනුව කාර්මික අංශය උප අංශ හතරකට බෙදා ඇති බව.
  - පතල් හා කැණීම්
  - නිෂ්පාදන කාර්මාන්ත
  - විදුලි බලය, ගෑස්, ජලය
  - ඉදි කිරීම් අංශය
- ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ 50% වැඩි ප්‍රතිශතයක් නිෂ්පාදන කර්මාන්ත සඳහා අයත් වන අතර නිෂ්පාදන කර්මාන්ත වර්ග කරන ජාත්‍යන්තර ප්‍රමිතයට අනුව ඉදිරියෙන් සිටින නිෂ්පාදන කර්මාන්ත මෙසේ පෙළ ගැස්විය හැකි බව.
  - රෙදිපිළි ඇඟළුම් හා සම් නිෂ්පාදන
  - ආහාර පාන වර්ග නිෂ්පාදනය
  - ප්ලාස්ටික් රසායනික ද්‍රව්‍ය ඛනිජ තෙල් හා රබර් නිෂ්පාදන
  - ලෝහ නොවන හා සකස් කළ ලෝහ නිෂ්පාදන

- ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ සමස්ත කාර්ය සාධනය තුළ වරින් වර කාර්මික සංවර්ධනය සඳහා කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ බව හා ක්‍රියාත්මක වන බව.
  නිදසුන් :
  - ආනයන ආදේශන කර්මාන්ත දිරි ගැන්වීම
  - අපනයන අභිමුඛ කර්මාන්ත (විදේශ වෙළෙඳපාළ ඉලක්ක ගත අපනයන)
  - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම
- කාර්මික අංශයේ වර්ධනය සඳහා රජය මගින් සිදුකොට ඇති ක්‍රියාමාර්ගවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
  - ගෝලීය වෙළෙඳපොළට ප්‍රවේශ වීමේ මාර්ග පුළුල් කිරීම
  - රජය විසින් පෞද්ගලික අංශය වෙත උසස් තාක්ෂණය භාවිතය සඳහා රාජ්‍ය මූල්‍ය දිරි ගැන්වීම් ලබා දීම
  - පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ඉලක්ක ගත දිරිගැන්වීම් තුළින් ආරම්භ කොට ඇති ප්‍රාදේශිය කාර්මීකරණ වැඩ සටහන් ඇතිකිරීම
- 2006-2016 ශ්‍රී ලංකාවේ දස අවුරුදු කාර්මික සංවර්ධන සැලසුමේ අරමුණු පහත දැක්වෙන බව.
  - ශ්‍රී ලංකාවේ වැඩි ඵලදායීතාවයක් සඳහා තරගකාරී කර්මාන්ත ඇති කිරීම
  - ජාතික නව සොයා ගැනීම් තුළින් ප්‍රාදේශීය ව කර්මාන්ත ඇති කිරීම
  - ඉතාමත් සුළුවෙන් අරඹා ඇති ක්ෂුද්‍ර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම
  - ආයතනවල තරගකාරීත්වය දියුණු කිරීම සඳහා රජය මගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
  - භූගෝලීය පදනම් මත කාර්මික පර්ෂද (Clusters) හා කාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම
  - විදේශ ප්‍රතිපත්තිය තුළ සෑම රටක් සමග සබඳතාවයෙන් සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම
- ක්ෂුද්‍ර ව්‍යවසායකයන් යනු කුඩා ප්‍රාග්ධනයක් යොදවා පවුලේ ශ්‍රමයම උපයෝගී කර ගනිමින් පවත්වා ගෙන යන ඉතාම සුළු ව්‍යාපාරයන් බව.
- ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ වර්ධනයට ක්ෂුද්‍ර ව්‍යවසායකයන් ගේ දායකත්වයට වැදගත් වන බව.
- ප්‍රාදේශීය පවතින ක්ෂුද්‍ර ව්‍යවසායකයක් දැනුවත් කරමින් ඔවුන්ට අවශ්‍යය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා බැංකු ණය ලබා දීමට පියවර ගෙන ඇති බව.

**නිපුණතා මට්ටම 12.5** : ශ්‍රී ලංකාවේ සේවා අංශය හා සම්බන්ධ විවාදිත කරුණු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08 යි.

**ඉගෙනුම් ඵල** :

- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සේවා අංශයේ දායකත්වය වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- සේවා අංශයේ ව්‍යුහය හා ප්‍රමාණ ප්‍රවණතා විස්තර කරයි.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සේවා අංශයේ වර්ධනය හා ව්‍යුහමය වෙනස්වීම් සිදුවීමට බලපාන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහි ලා පෞද්ගලික අංශයේ දායකත්වය වැදගත්වන ආකාරය පෙන්වා දෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට අනෙකුත් අංශවලට සාපේක්ෂ ව සේවා අංශයේ දායකත්වය වැඩි වී ඇති බව.
- 1950 වර්ෂයේදී 34% කට දායක වූ සේවා අංශය 1977 වර්ෂයේදි 46% දක්වා වර්ධනය වී 1991 - 2000 දශකයේ 50% දක්වාත් 2009 වන විට 57.7% දක්වාත් වර්ධනය වී ඇති බව.
- සේවා අංශය ආර්ථිකය තුළ ප්‍රසාරණය වෙමින් පවතින බව.
- සේවා අංශය ප්‍රසාරණය වීමේ වැදගත්කම් පහත පරිදි දැක්විය හැකි බව.
  - රටක් ආර්ථික වශයෙන් වේගවත් වර්ධනයකට යනවිට සේවා සඳහා ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි අගයක් ගන්නා නිසා සේවා අංශයේ දියුණුව ඇතිවීම
  - සේවා සඳහා අවශ්‍ය කරන ස්වභාවික සම්පත් ප්‍රමාණය අනෙක් අංශවලට සාපේක්ෂ ව ඉතාම අඩු නිසා ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට සේවා අංශයේ ප්‍රසාරණය වැදගත් වීම
  - තිරසාර සංවර්ධන සංකල්පයට අදාළ වූ ස්වභාවික ප්‍රාග්ධනය රැක ගැනීම නිසා ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ සේවා අංශය ප්‍රසාරණය වීමට ඉවහල් වීම ඉන් ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම
  - කෘෂි හා කාර්මික අංශවලට සාපේක්ෂ ව සේවා අංශය ඉහළ ඵලදායීතාවක් වාර්තා කිරීම
  - වැඩිවෙමින් පවත්නා ජනගහනයට අවශ්‍ය ආදායම් ඉපයීමේ අවස්ථා ජනනය කිරීමට වැදගත් වීම
  - කෘෂි හා කාර්මික අංශය මත වත්කම් ජනනය කිරීමට කාර්යක්ෂම අංශය ලෙස සේවා අංශයෙන් වැදගත් දායකත්වයක් ලැබීම
  - නිෂ්පාදනය බෙදා හැරීම හා පරිභෝජනය යන අංශ සම්බන්ධීකරණය කරමින් ජනතාවගේ තේරීම් සැසි පුළුල් කිරීමට ඉවහල් වීම

- ගණුදෙනු පිරිවැය අඩු කිරීමට සේවා අංශය දායකත්වය සැපයීම
- ඉහළ ආර්ථික වර්ධනයක් හා ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා කාර්යක්ෂම ආර්ථික යටිතල පහසුකම් පද්ධතියක් හා ශක්තිමත් නියාමන රාමුවක් පැවතීම පූර්ව අවශ්‍යතාවයක් බව.
- යටිතල පහසුකම් ඉලක්ක කරගත් සේවාවන් ලෙස ප්‍රවාහන සේවා, විදුලි සංදේශ සේවා, ජල සම්පාදනය සහ බල ශක්තිය වැනි සේවා දැක්විය හැකි බව.
- මෙම සේවා දියුණු කිරීම සඳහා විදේශීය ආධාර හා ආයෝජන ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති බව.
- යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේ ම ආයෝජන ඉහළ දැමීමට රජය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.
- කොළඹ - මාතර අධිවේගී ගමන් මාර්ගය නිදසුන් ලෙස දැක්විය හැකි බව.
- රජයේ දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (2006-2016) ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා යටිතල පහසුකම්වල වැදගත්කම තදින් ම අවධාරණය කර ඇති බව.
- යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති රාශියක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර නිදසුන් ලෙස රන්දොර ජාතික යටිතල පහසුකම් සංකල්පය දැක්විය හැකි බව.
- රන්දොර ජාතික යටිතල පහසුකම් සංවර්ධන ප්‍රවේශය යටතේ ලැබෙන පහසුකම්වලට නිදසුන් පහත සඳහන් වන බව.
  - වීරවිල ගුවන් තොටුපොළ
  - හම්බන්තොට වරාය සංකීර්ණය
  - හම්බන්තොට පරිපාලන සංකීර්ණය
  - දකුණු ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
  - නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය
  - ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය
  - කෙරවලපිටිය ගල් අඟුරු බලාගාරය
  - මහ දඹුල්ල සංවර්ධනය
  - උතුරු මහා මාර්ගය
  - යාපනය ජල සම්පාදන යෝජනා ක්‍රමය
  - මහ කොළඹ ජලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය
- යටිතල පහසුකම් සැපයීම සඳහා රජය පෞද්ගලික අංශය විවිධ ක්‍රම යටතේ සම්බන්ධ කර ගන්නා අතර ඒවා සඳහා නිදසුන් පහත දැක්වෙන බව
  - ඉදිකිරීම මෙහෙයවීම සහ පැවරීම (BOT ක්‍රමය)
  - ඉදි කිරීම, හිමිකර ගැනීම සහ මෙහෙයවීම (BOO ක්‍රමය)
  - ඉදි කිරීම, හිමිකර ගැනීම, මෙහෙයවීම සහ පැවරීම (BOOT ක්‍රමය)

**නිපුණතා මට්ටම 12.6** : සමකාලීන ආර්ථික සිදුවීම් විමර්ශනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 යි.

**ඉගෙනුම් ඵල** :

- සමකාලිනව සිදු වී ඇති දේශීය ආර්ථික සිදුවීම්වල ආර්ථික ප්‍රතිවිපාක නිදසුන් සහිතව විග්‍රහ කරයි.
- සමකාලිනව සිදු වී ඇති ගෝලීය ආර්ථික සිදුවීම්වල ආර්ථික ප්‍රතිවිපාක නිදසුන් සහිතව විග්‍රහ කරයි

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

- සමකාලීනව දේශීය හා විදේශීයව සිදුවන සමාජ, දේශපාල ආර්ථික හා සංස්කෘතික වෙනස් වීම මෙරට ආර්ථිකයට බලපාන බව.
- මෙම සමකාලීන ආර්ථික සිදුවීම් ප්‍රධාන වශයෙන් දේශීය හා ගෝලීය ලෙස වර්ග කළ හැකි බව.
- දේශීය සමකාලීන ආර්ථික සිදුවීම්වලට නිදසුනක් ලෙස සුනාමි ව්‍යවසනය දැක්විය හැකි බව.
- ගෝලීය සමකාලීන ආර්ථික සිදුවීම්වලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි බව.
  - ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය
  - සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ලොවට හඳුන්වා දීම
- දේශීය සමකාලීන ආර්ථික සිදුවීම් ශ්‍රී ලංකා ආර්ථිකයට හිතකර හා අහිතකර ආකාරයට බලපාන අතර එය පහත පරිදි නිදසුන් ඇසුරෙන් පැහැදිලි කර හැකි බව.
  - සුනාමි ව්‍යසනය නිසා වෙරළ ආසන්න ප්‍රදේශවල යටිතල පහසුකම්, කාර්මාන්ත, මිනිස් ජීවිත හා දේපල විනාශ වීම ශ්‍රී ලංකා ආර්ථිකයේ සංවර්ධනයට අහිතකර ලෙස බලපෑම
- ගෝලීය සමකාලීන ආර්ථික සිදුවීම් ආර්ථිකයට හිතකර සහ අහිතකර ලෙස බලපෑම් කිරීමට හැකි බව එය පහත පරිදි නිදසුන් ඇසුරෙන් පෙන්විය හැකි බව.
  - විදේශීය වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළ යාම මෙරට ඛනිජ තෙල් මිල ඉහළ යාමට බලපෑ අතර එය ශ්‍රී ලංකා ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ලදී. (කාලීන වශයෙන් සිදු වී ඇති ආර්ථික සිදුවීම් නිදසුන් ලෙස ගෙන ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය සිසුන්ට සමග සාකච්ඡා කරන්න.)

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතුවෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරගනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රති පෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණ සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය :

01. පැවරුම්
02. ව්‍යාපෘති
03. සමීක්ෂණ
04. ගවේෂණ
05. නිරීක්ෂණ
06. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
07. ක්ෂේත්‍ර චාරිකා
08. කෙටි ලිඛිත පරීක්ෂණ
09. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ජා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සැම එකක්ම සැම විෂයයක් සම්බන්ධයෙන් සැම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතුය; වග බලා ගත යුතුය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන්ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

# ප්‍රබෝධාත්මක ඉගෙනුම්ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1)ඇගයීම් අවස්ථාව** : වාරය 1 - සැලසුම් 1

**(2)ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 7.1, 7.2, 7.3 සහ 7.4

**(3)සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- සාමාන්‍ය මිල මට්ටම
- මිල දර්ශක
- උද්ධමනය
- නිරුද්ධමනය
- අවධමනය
- උද්ධමනයට හේතු
- උද්ධමනයේ ප්‍රතිවිපාක

**(4)සැලසුමේ ස්වභාවය:** කණ්ඩායම් පැවරුම්

**(5)සැලසුමේ අරමුණු** :
- ගවේෂණය තුළින් තොරතුරු රැස් කරයි.
- රැස් කරන ලද තොරතුරු වගු සහ ප්‍රස්තාර සටහන් ඇසුරෙන් ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම මනින මිල දර්ශක වල උපනති විමසයි.
- උද්ධමනය, නිරුද්ධමනය සහ අවධමනය යන සංකල්ප වල වෙනස ඉදිරිපත් කරයි.
- උද්ධමනයට හේතු විමසයි.
- ශ්‍රී ලංකාවේ පවතින උද්ධමනයේ ස්වභාවය පරීක්ෂා කරයි.
- උද්ධමනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක විමසයි.

**(6)සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්:**

**ගුරු උපදෙස්** :
- නිපුණතා මට්ටම 7.4 අවසානයේ දී කණ්ඩායම් පැවරුමක් සකස් කර ඉදිරිපත් කළ යුතු බව නිපුණතා මට්ටම 7.1 ආරම්භයේ දීම සිසුන්ට දන්වන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- විෂය සන්ධාරය අනුව මාතෘකා සකස් කරන්න.

නිදසුන් :

- වසර කිහිපයක ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමෙහි හැසිරීම
- උද්ධමනයට හේතු සහ ප්‍රතිවිපාක

- නිපුණතා මට්ටම 7.4 අවසානයේ දී අවශ්‍ය පරිදි සිසුන් කණ්ඩායම් වලට වෙන් කරන්න.
- මාතෘකා කණ්ඩායම් වලට පවරා පැවරුම සකස් කිරීමට උපදෙස් ලබාදෙන්න.
- පැවරුම සකස් කර ඉදිරිපත් කළ යුතු දිනය ආරම්භයේ දීම සිසුන්ට දන්වන්න.
- තොරතුරු වගු සහ ප්‍රස්තාර සටහන් ඇසුරෙන් නිර්මාණශීලීව ඉදිරිපත් කළයුතු බව සිසුන්ට දන්වන්න.

**සිසු උපදෙස්** :

- ගුරුවරයාගේ උපදෙස් හා මග පෙන්වීම අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- කණ්ඩායමේ සියලු සමාජිකයින්ගේ දායකත්වය ලබා ගන්න
- අවශ්‍ය සියලුම තොරතුරු ඇතුලත් කිරීමට උනන්දු වන්න.
- තොරතුරු වගු සහ ප්‍රස්තාර සටහන් ඇසුරෙන් නිර්මාණශීලීව ඉදිරිපත් කරන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ සැලකිලිමත් වන්න.
- ගුරුවරයා නියම කරන ලද කාලය තුළ පැවරුම සකස් කර ඉදිරිපත් කරන්න.

**(7)ඇගයීම් නිර්ණායක** :

- මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම.
- තොරතුරු වගු සහ ප්‍රස්තාර සටහන් ඇසුරෙන් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම.
- විෂය කරුණු වල ප්‍රමාණාත්මක බව හා නිවැරදි බව.
- නියම කරන ලද කාලය තුළ පැවරුම සකස් කර ඉදිරිපත් කිරීම.
- කණ්ඩායමේ සියලු සමාජිකයින්ගේ දායකත්වයලබා ගැනීම සහ සාමූහික ව කටයුතු කිරීම.

**(8) ලකුණු පරාසය** :

- ඉතා හොඳයි. 04
- හොඳයි. 03
- මධ්‍යස්ථයි. 02
- සංවර්ධනය විය යුතුයි. 01

# ප්‍රබෝධාත්මක ඉගෙනුම්ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1)ඇගයීම් අවස්ථාව** : වාරය 1 - සැලසුම් 2

**(2)ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 9.1, 9.2, 9.3, 9.4 සහ 9.5

**(3)සැලසුමට අදාළ විෂය සන්ධාරය** :

- වෙළෙඳපොළ ක්‍රමයක අසමත් වීම සහ එයට හේතු
- බාහිරතා
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

**(4)සැලසුමේ ස්වභාවය:** ක්ෂේත්‍ර චාරිකා

**(5) සැලසුමේ අරමුණ** :

- නිර්මාණශීලී ව හා තර්කානුකූල ව නිරීක්ෂණ ක්‍රියාවලියේ යෙදෙයි.
- සාමූහික ව කටයුතු කරයි.
- වෙළෙඳපොළ ක්‍රමය අසමත්වීමට හේතු තර්කානුකූල ව ඉදිරිපත් කරයි.
- ප්‍රායෝගික ව බාහිරතා අධ්‍යයනය කොට වෙළෙඳපොළ ක්‍රමය අසාර්ථකවීම කෙරෙහි එහි බලපෑම පරීක්ෂා කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය විය යුත්තේ කුමක් ද යන්න විමසයි.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගත හැකි ආකාර විමර්ශනය කරයි.

**(6)සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්:**

**ගුරු උපදෙස්** :

- නිපුණතා මට්ටම 9.5 අවසානයේ දී ක්ෂේත්‍ර චාරිකාවකට සහභාගී වී නිරීක්ෂණ වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු බව නිපුණතා මට්ටම 9.1 ආරම්භයේ දීම සිසුන්ට දන්වන්න.
- පන්තියේ සිසුන් සමග පාසලට ආසන්නයේ පිහිටි බාහිරතා ඇති කරන ස්ථාන නැරඹීම සඳහා අවස්ථාව උදාකර ගන්න.

  නිදසුන් :

  ගල්මෝලක්, සත්ව ගොවිපලක්

- ඒ තුළින් සිසුන්ට ධන බාහිරතා සහ ඍණ බාහිරතා පිළිබඳ අවබෝධය ලබා ගැනීමට ඉඩ සලස්වන්න.

- මේ සඳහා රජය මැදිහත් වීම සිදුවන අයුරු අවබෝධ කර ගැනීමට ඉඩ සලස්වන්න.
- ඒ තුළින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක වැදගත්කම ප්‍රායෝගික ව සිසුන්ට අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර ඔවුන්ට නිරීක්ෂණ වාර්තාවක් පිළියෙල කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- නිරීක්ෂණ ක්‍රියා තුළින් තම කණ්ඩායමට අදාළ ව තොරතුරු සාකච්ඡා කරමින් එක් රැස් කර නිරීක්ෂණ වාර්තාවක් පිළියෙල කරන්න.
- කණ්ඩායම් නායකයාගේ මඟ පෙන්වීම අනුව සාකච්ඡා කර ගනිමින් ක්‍රමානුකූල ව කරුණු පෙළ ගස්වන්න.
- සාමූහික ව කටයුතු කරන්න.
- ලකුණු පිරිනමන ආකාරය පිළිබඳ සැලකිලිමත් වන්න.

**(7)ඇගයීම් නිර්ණායක** :
- මාතෘකාවට අදාළ ව නිරීක්ෂණය කිරීම හා සංවිධානාත්මක ව කරුණු එක් රැස්කිරීම.
- එම කරුණු නිර්මාණශීලීව හා තර්කානුකූල ව ඉදිරිපත් කර තිබීම
- උචිත ආකාරයට කරුණු ගොනු කිරීම.
- කාලය කළමනාකරණය කිරීම.
- කණ්ඩායම් තුළ සාමූහික ව හා උද්යෝගීමත් ව කටයුතු කිරීම.

**(8) ලකුණු පරාසය** :
- ඉතා හොඳයි. 04
- හොඳයි. 03
- මධ්‍යස්ථයි. 02
- සංවර්ධනය විය යුතුයි. 01

# ප්‍රබෝධාත්මක ඉගෙනුම්ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1)ඇගයීම් අවස්ථාව** : වාරය 2 - සැලසුම් 3

**(2)ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 10.1, 10.2, 10.3, 10.4, 10.5 සහ 10.6

**(3)සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- අන්තර් ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක
- අන්තර් ජාතික වෙළෙඳමේ වාසි සහ අවාසි
- ගෙවුම් ශේෂයට වන බලපෑම

**(4)සැලසුමේ ස්වභාවය:** විවාදය

**(5)සැලසුමේ අරමුණ** :
- නිර්මාණශීලී ව හා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.
- කථන හැකියාව වර්ධනය කර ගනියි.
- අන්තර් ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක ඉදිරිපත් කරයි.
- අන්තර් ජාතික වෙළෙඳාමේ වාසි සහ අවාසි ඉදිරිපත් කරයි.
- ආර්ථිකයට ගෙවුම් ශේෂයෙහි බලපෑම විග්‍රහ කරයි.

**(6)සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්:**

**ගුරු උපදෙස්** :
- නිපුණතා මට්ටම 10.6 අවසානයේ දී විවාදයකට සහභාගී විය යුතු බව නිපුණතා මට්ටම 10.1 ආරම්භයේ දීම සිසුන්ට දන්වන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- නිපුණතා මට්ටම 10.1 ආරම්භයේ දී පහත සඳහන් මාතෘකා දෙක අහඹු ලෙස කණ්ඩායම් දෙකට ලබා දී විවාදයක් සඳහා සූදානම් වන ලෙස දන්වන්න.
  - ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධවීමෙන් ආර්ථිකය යහපත් වේ.
  - ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධනොවීමෙන් ආර්ථිකය යහපත් වේ.
- එක් එක් නිපුණතා මට්ටම අවසානයේ දී ඊට අදාළ විෂය කරුණු විවාදය සඳහා අදාළ කරගත යුතු බවට සිසුන්ට උපදෙස් දෙන්න.
- නියම කරන ලද කාලච්ඡේද දෙකක දී විවාදය පැවැත්විය යුතු බවත්, ඇගයීම් නිර්ණායක පිළිබඳවත් සිසුන් දැනුවත් කරන්න.
- විවාදය අතරතුර දී අදාළ නිර්ණායක පදනම් කර ගෙන සිසුන්ට ලකුණු පවරන්න.

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව විවාදයෙහි යෙදෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළ ව තොරතුරු රැස් කර ගන්න. (මහ බැංකු වාර්තාව ඇතුළු පොත්පත් පරිශීලනය කරන්න.)
- කණ්ඩායම් නායකයා පත් කර ගැනීම, එක් එක් සාමාජිකයාට ලැබෙන කාලය, අවස්ථා ගණන ආදිය පිළිබඳ ව ගුරුවරයා සමග සාකච්ඡා කර තීරණය කර ගන්න.

**(7)ඇගයීම් නිර්ණායක** :
- මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම
- අදහස් නිර්මාණශීලී ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීම
- උචිත ලෙස අංග චලනය හා කාලය කළමනාකරණය කිරීම
- ප්‍රතිවිරුද්ධ පිළේ තර්ක බිඳීම
- කණ්ඩායම් තුළ සාමූහික ව කටයුතු කිරීම හා උද්යෝගීමත්ව කටයුතු කිරීම

**(8)ලකුණු පරාසය** :
- ඉතා හොඳයි. 04
- හොඳයි. 03
- මධ්‍යස්ථයි. 02
- සංවර්ධනය විය යුතුයි. 01

# ප්‍රබෝධාත්මක ඉගෙනුම්ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1)ඇගයීම් අවස්ථාව** : වාරය 2 - සැලසුම් 4

**(2)ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 10.7, 10.8, 10.9, 10.10, 10.11 සහ 11.1

**(3)සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- විදේශ විනිමය වෙළෙඳපොළ
- විදේශ විනිමය අනුපාතිකය
- මුදල් අවප්‍රමාණය වීම හා ප්‍රතිප්‍රමාණය
- විනිමය අනුපාතිකය ක්ෂයවීම හා වර්ධනය
- විදේශ ආයෝජනය
- විදේශ වත්කම්
- ආර්ථික ඒකාබද්ධවීම්
- වෙළෙඳ ගිවිසුම්
- අන්තර් ජාතික මූල්‍ය ආයතන
- ගෝලීයකරණය
- ආර්ථික වර්ධනය

**(4)සැලසුමේ ස්වභාවය:** ප්‍රහේලිකා නිර්මාණය (නිර්මාණාත්මක ක්‍රියාකාරකම)

**(5)සැලසුමේ අරමුණ** :
- නිශ්චිත පිළිතුරු ලබා ගත හැකි ප්‍රශ්න ගොඩ නගයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.
- විවිධ විනිමය අනුපාත ක්‍රම විස්තර කරයි.
- මුදල් අවප්‍රමාණ, ප්‍රතිප්‍රමාණ සහ ක්ෂයවීම් විස්තර කරයි.
- විදේශ ආයෝජනවල ආකාර පැහැදිලි කරයි.
- ආර්ථික ඒකාබද්ධවීම් සිදු ව ඇති ආකාර හා වෙළෙඳ ගිවිසුම් පිළිබඳව දැනුවත් වෙයි.
- අන්තර් ජාතික මූල්‍ය ආයතන ඉදිරිපත් කරයි.
- ගෝලීයකරණයේ ආකාර දක්වයි.
- ආර්ථික වර්ධනය යන්න පැහැදිලි කරයි.

**(6)සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්:**

**ගුරු උපදෙස්** :
- නිපුණතා මට්ටම 11.1 අවසානයේදී ප්‍රහේලිකාවක් නිර්මාණය කළ යුතු බව, නිපුණතා මට්ටම 10.6 ආරම්භයේ දී ම සිසුන්ට දන්වන්න.

- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- නිපුණතා මට්ටම් 10.6 සිට 11.1 දක්වා අදාළ වන විෂය කරුණු පදනම් කරගෙන ප්‍රහේලිකා නිර්මාණය කළ යුතු බව දන්වන්න.
- ප්‍රහේලිකාව ඉදිරිපත් කළ යුතු දිනට සතියකට පෙර සෑම කණ්ඩායමකම ප්‍රහේලිකා පද හා ප්‍රහේලිකාව පරීක්ෂා කර බලා සංශෝධනය සඳහා උපදෙස් ලබා දෙන්න.
- කලින් නියම කරගත් දිනයක දී (කාලච්ඡේද දෙකක දී) ප්‍රහේලිකාව සකස් කළ එක් එක් කණ්ඩායම ලවා එය ඉදිරිපත් කරවන්න.
- තරගයක් ආකාරයට අනෙක් කණ්ඩායම් ලවා ප්‍රහේලිකාව සම්පූර්ණ කරවන්න.
- ඇගයීම් නිර්ණායක මත ප්‍රහේලිකාව ඉදිරිපත් කරන එක් එක් කණ්ඩායමට ලකුණු පවරන්න.

**සිසු උපදෙස්** :

- ගුරුවරයාගේ උපදෙස් හා මග පෙන්වීම අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- කණ්ඩායමේ සෑම සාමාජිකයෙක් ම ප්‍රහේලිකා පද නිර්මාණය කිරීමට දායක කර ගන්න.
- ගුරුතුමා දන්වන දිනයක දී ඒවා ගුරුතුමාට පෙන්වා අවශ්‍ය වෙනස්කම් සිදු කරන්න.
- නිර්මාණාත්මක ව ප්‍රහේලිකාව නිර්මාණය කරන්න.

**(7)ඇගයීම් නිර්ණායක** :

- ප්‍රහේලිකාවේ පිළිතුරු පද මාතෘකාවට අදාළ වීම.
- අරමුණු ඉටුවන ආකාරයට ප්‍රහේලිකාව නිර්මාණය කර තිබීම.
- ගුරු උපදෙස් පිළිපැදීම හා නියමිත කාලය තුළ කාර්යය ඉටු කිරීම.
- නියමිත පද සංඛ්‍යාව ඇතුළත් වීම
- නිර්මාණශීලී බව.

**(8)ලකුණු පරාසය** :

- ඉතා හොඳයි. 04
- හොඳයි. 03
- මධ්‍යස්ථයි. 02
- සංවර්ධනය විය යුතුයි. 01

**මූලාශ්‍ර :**


(1) අතපත්තු, ඩැනී, ආර්ථික විද්‍යා ප්‍රවේශය 1, 2009

(2) දයාරත්න, ඊ., අන්තර්ජාතික වෙළෙඳාම, 2006

(3) දයාරත්න, ඊ., ආර්ථික වර්ධනය සංවර්ධනය හා ආර්ථික ප්‍රතිපත්ති, 2009

(4) Central Bank of Sri Lanka, Economic Progress of Independent Sri Lanka, 1998

(6) ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2006

(7) ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2007

(8) ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2008

(9) ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2009

(10) සටහන - ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා මාසිකය - ශ්‍රී ලංකා මහ බැංකුව